# විභාෂා

2014 අප්‍රේල්-මැයි කලාපය | විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයකි | දෙවන වෙළුම | 14 වැනි කලාපය



## මායිම් නොහඳුනන
## නයනහාරීගේ තෙවැනි ඇස

- 29 පිටුව







භාෂාව සහ සංහිඳියාව - 36 පිටුව

භාෂා අයිතීන් දැනුවත් නොවී දිනන්න බෑ - 33 පිටුව

ඕස්ට්‍රේලියාවේ ඇබොරිජින් ජනතාවගේ භාෂාව සහ සිංහල භාෂාව - 30 පිටුව

# පටුන





තම අභිමත බසින් පොදු සේවාවන්
ලබාගැනීමට ඇති හැකියාව පුරවැසියාගේ අයිතියකි 5

මව් භාෂා දිනය : උපත හා පසුබිම 6

මගේ අරමුණ සිංහල පාඨකයාට දෙමළ සමාජය හඳුන්වා දීමයි 7

අන්තර් සංස්කෘතික අධ්‍යයනයෙහි සහ පෝෂණයෙහි වැදගත්කම 9

භාෂා අයිතිය ගමින් ගමට 10

දෙමළ භාෂා ගුරු අත්පොත 12

ධම්මපදය දෙමළ බසින් 14

අසල්වැසියාගේ කවි 15

ඉංග්‍රීසියෙහි වටිනාකම ද උකහාගත යුතුය 16

ත්‍රෛභාෂික වැඩපිළිවෙළේ සැඟවුණු අපේක්ෂා 18

පුරවැසි අතිරේකය 21

භාෂා පිළිවෙත මාධ්‍ය ඇසින් 26

තම භාෂාව අමතක කළ
මියන්මාරයේ දෙමළ ජනතාව 30

මායිම් නොහඳුනන නයනහාරිගේ තෙවැනි ඇස 31

ඕස්ට්‍රේලියාවේ ඇබෝර්ජින් ජනතාවගේ භාෂාව සහ සිංහල භාෂාව 32

පැරණි සිංහල සාහිත්‍යයට ආලෝකයක් වූ තිරුක්කුරල් 34

භාෂා අයිතිය ගමින් ගමට 36

භාෂාව හා සංහිඳියාව 38








# විභාෂා

ISSN 955-0000-0000

14 වැනි කලාපය 2014 අප්‍රේල් - මැයි

දුරකථනය 94-1-2370801/4 ෆැක්ස් 94-1-2370802 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

## විභාෂා ඉදිරියට.... !

මෙම කලාපය නිකුත් වීමත් සමග විභාෂා නව අදියරකට පා තබයි. ප්‍රථම විභාෂා පුවත් හසුන නිකුත් වී මේ වන විට තෙවසරකට ආසන්න ය. මංගල කලාපය නිකුත් වූයේ 2011 ඔක්තෝබරයේ දී ය. එදා මෙදා තුර සමාජයෙහි සිදු වී ඇති පරිවර්තනයන් පිළිබඳ විමසා බැලීමට මෙය සුදුසු මොහොතකි. සමාජයීය හා දේශපාලනික පරිසරය වඩා සංකීර්ණත්වයට පත්ව තිබීම මේ යුගයෙහි විශේෂත්වය යැයි කෙටියෙක් කිව හැකි ය.

බිහිසුණු යුද්ධයක් අවසානයේ ලාංකික සමාජය අපේක්‍ෂා කළේ සාමයෙන් හා සංහිඳියාවෙන් පිරි සමාජයකි. එහෙත් යුද්ධය අවසන් වුව ද සංහිඳියාවක් ඇති වූ බවක් පෙනෙන්නට නැත. යුද්ධයට මුල් වූ හේතු ද එලෙසම පවතින්නේ යැයි කිව හැකි ය. ඒ හැරුණු විට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් මෙතෙක් ලංකාව මුහුණ නොදුන් පරිමාණයේ ගැටලු ගණනාවක් ද මතු වී ඇත.

එබැවින් විභාෂා ඉදිරියෙහි ඇති කාර්යභාරය ද හුදු භාෂා අයිතිය පිළිබඳ සීමාවන්ට ලඝු කළ නොහැකි තත්ත්වයක් මේ වන විට උද්ගතව තිබේ. විශේෂයෙන් භාෂා අයිතිය හා බැඳුණු විෂය ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ අවධානය යොමු කිරීමට මෙතැන් සිට විභාෂාවට සිදු වේ. එහි දී සංස්කෘතික විවිධත්වය, අධ්‍යාපනය, සාහිත්‍ය හා කලාව ඇතුළු විෂය ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවනු ඇත.

ඒ හැරුණු විට අවධානය යොමු කිරීමට සිදුවන ප්‍රධාන ගැටලුවක් වන්නේ සමාජ සංහිඳියාව ගොඩනැගීමට එරෙහිව මතුවෙමින් පවතින බලවේගයන් ය. සංහිඳියාව සහ සංහිඳියාව සඳහා කැප වූ සමාජ සංවිධාන වැඩි වැඩියෙන් අවශ්‍යව තිබෙන මොහොතක මතුවෙමින් තිබෙන්නේ තිබෙන සංහිඳියාවත් විනාශ කිරීමට කැස කවන කුමන්ත්‍රණකාරී බලවේගයන් ය. මෙම බලවේගවල අවශ්‍යතාවය වී තිබෙන්නේ සියලු වාර්ගික හා සංස්කෘතික අනන්‍යතාවයන් සුණු විසුණු කොට එක් අධිපතිවාදී අනන්‍යතාවක් ස්ථාපිත කිරීම ය. සමහර විට මෙය බෞද්ධ මුහුණුවරින් ක්‍රියාත්මක වුව ද, බෞද්ධ සංස්කෘතියෙහි විවිධත්වයට ද ඔවුන්ගෙන් ඉඩක් නොලැබෙන බව මොවුන්ගේ දිගුකාලීන හැසිරීම අධ්‍යයනය කිරීමෙන් වටහාගත හැකි ය. එබැවින් මෙය අද ආගමික සීමාවෙන් ඔබ්බට ගිය දේශපාලන ගැටලුවක් බවට පත් වී ඇත.

ඒ තුළ සියලු භාෂාවන් කතා කරන විවිධ ආගම් විවිධාකාරයෙන් අදහන, විවිධ සංස්කෘතීන්ට අයත්, සියලු ආකාරයේ මිනිසුන්ගේ නිදහස් පැවැත්ම බරපතල අභියෝගයන්ට මුහුණ දී තිබේ.

එබැවින් අද මේ මූලික ප්‍රශ්නය පිළිබඳ සමාජය අවදි කිරීම ජනමාධ්‍ය සතු වගකීමක් බවට පත්ව ඇතත් ඒ වගකීම ජනමාධ්‍යයෙන් නිසි ලෙස ඉටු වන බවක් ද පෙනෙන්නට නැත. ඒ වෙනුවට බොහෝ ජනමාධ්‍ය ක්‍රියාකරමින් සිටින්නේ මෙම අර්බුදකාරී තත්ත්වය තවදුරටත් උග්‍ර කිරීමට බව ද පෙනෙන්නට තිබේ. එවැනි තත්ත්වයක් යටතේ විභාෂා වැනි ප්‍රකාශයකට ඒ වගකීම ද හැකි පමණින් හෝ ඉටු කිරීමට සිදු වේ. 'හැකි පමණින්' යන යෙදුම මෙහි දී භාවිතා කිරීමට සිදු වන්නේ විභාෂා යනු අද ලාංකික සමාජයෙහි ක්‍රියාත්මකව තිබෙන දැවැන්ත මාධ්‍ය ප්‍රවාහය කෙරෙහි තීරණාත්මක බලපෑමක් කළ නොහැකි මූල ධාරාවේ ප්‍රකාශයක් බැවිනි.

එහෙත් මේ බලපෑම දැනෙන සුළු තලයකට ඔසවා තැබීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයක් තිබේ.

පළමුව, විභාෂා මගින් ගොඩනැගීමට අපේක්‍ෂා කරන කතිකාව වඩා පුළුල් සහ ගැඹුරු කතිකාවක් බවට පත් කිරීම සඳහා මේ පිළිබඳ උනන්දුමත් සමාජ ක්‍රියාකාරිකයන්ගෙන් හා විද්වතුන්ගෙන් ලැබෙන දායකත්වයයි.

දෙවන ක්‍රියාමාර්ගය වන්නේ මෙම කතිකාව මත පදනම්ව ගොඩනැගිය හැකි පුළුල් පුරවැසි ක්‍රියාකාරිත්වයකි.

දැනටමත් මේ පිළිබඳව කිසියම් කතිකාවක් ද, ඒ ආශ්‍රිත විවිධ පුරවැසි ක්‍රියාකාරකම් ද රටේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වීම මෙහිලා බලාපොරොත්තු දනවන්නකි. එම සමාජ ක්‍රියාකාරිත්වය ඉදිරියට ගෙනයාම සඳහා දායකත්වය සැපයීම අප හමුවේ මෙතැන් සිට ඇති අභියෝගයයි.



**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**
24/2, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ 07, ශ්‍රී ලංකාව.
දුරකථනය 94-11-2565304/06 ෆැක්ස් 94-11-4714460 ඊ-මේල් cpa@cpalanka.org වෙබ් www.cpalanka.org

# දෙහිවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි රාජ්‍ය සහ පොදු ස්ථාන විගණනයකට ලක් කෙරේ.

දෙහිවල ප්‍රාදේශීය බල ප්‍රදේශය තුළ ඇති රාජ්‍ය සහ පොදු ස්ථානයන්හි ද්වි භාෂා භාවිතය පිළිබඳ විඝණනයක් සිදු කිරීම පසු ගිය දා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගීත්ව අංශය මගින් සිදු විය.

එහි දී දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සතුන් පිළිබඳ විස්තර දැක්වෙන නාම පුවරුවලින් දෙමළ බස ගිලිහී යාම සහ දෙමළ බස වැරදි ලෙස භාවිතා කිරීමේ නාම පුවරු කිහිපයක් විගණන කණ්ඩායමට නිරීක්ෂණය කර ගත හැකි විය.

පහත දැක්වෙන්නේ වැරදි ලෙස දෙමළ භාෂාව සටහන් වී ඇති ඡායාරූප සහ දෙමළ බසින් සඳහන් නොවූ නාම පුවරු වල ඡායාරූප කීපයකි.

මේ අතර දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ පිළිගැනීමේ නිලධාරී දැක්වෙන නාම පුවරුව, සභාපති, ලේකම් ඇතුළු කිසිදු නිල නාම පුවරුවක් දෙමළ භාෂාවෙන් සඳහන් නොවීම ද මෙහි දී දැක ගත හැකි විය. ආයතනය තුළ ඇති සියලු නිල නාම පුවරු ඉංග්‍රීසි සහ සිංහල භාෂාවෙන් පමණක් සඳහන් වී තිබීම දෙමළ ජනතාව දැඩි අපහසුතාවයකට පත් වන අයුරු ද මෙහි දී නිරීක්ෂණය වී තිබිණි.

සටහන
**සඳමාලි සෙනෙවිරත්න**
















ආචාර්ය ගෝපකුමාර් තම්බි

# තම අභිමත බසින් පොදු සේවාවන් ලබාගැනීමට ඇති හැකියාව පුරවැසියාගේ අයිතියකි

**භාෂා අයිතිවාසිකම් හා භාෂාමය වවිධත්වය කෙරෙහි පැවතිය යුතු සැලකිල්ල වඩාත් තීව්‍ර කිරීම හා සමාජ සංහිඳියාව වඩාත් තහවුරු කිරීම හරහා සිංහල හා දෙමළ භාෂිත පුරවැසියන්ගේ සබඳතා වඩාත් ශක්තිමත් කිරීම කෙරෙහි "ජාතික භාෂා ව්‍යාපෘතිය" තම සැලකිල්ල යොමුකර ඇත. ආචාර්ය ගෝපකුමාර් තම්බි මහතා, ආසියානු පදනමේ ආර්ථික පාලනය (Economic Governance - EG) ව්‍යාපෘතියේ අධ්‍යක්ෂවරයා වන අතර මේ වන විට දෙවසරක කාලයක් තිස්සේ තෝරාගත් රජයේ ආයතනයන්හි ද්විභාෂාමය සේවාව ප්‍රවර්ධනය යන තේමාව යටතේ භාෂාමය සමානත්වය හා සබැඳි ක්‍රියාකාරකම් රාශියක නියැලී සිටී. විභාෂා සඟරාව මෑතක දී ඔහු හා සම්මුඛ සාකච්ඡාවක් පවත්වන ලද අතර එහිලා මූලික අවධානය යොමු කරන ලද්දේ සමාජ ඒකාබද්ධතා හා ජාතික භාෂා අමාත්‍යාංශයේ "ජාතික භාෂා ව්‍යාපෘතිය" තුළ විද්‍යමාන වූ සුවිශේෂතා කිහිපයක් පිළිබඳව විමසීමටයි. එහිලා ආසියානු පදනම නියෝජනය කරමින් එකී ව්‍යාපෘතියෙහි වැඩසටහන් නිලධාරී අනුක් ඩි සොයිසා මහතා ද තම අත්දැකීම් හෙළිකිරීම සඳහා එක් විය.**

මේ වනවිට වසර ගණනාවක කාලයක් පුරා ආචාර්ය ගෝපකුමාර් මහතා ශ්‍රී ලංකාවේ සිට තම කටයුතු වල නිරත වන බැවින් අපගේ මුල්ම අවධානය යොමු වූයේ ඔහු සම්බන්ධව සිටින ජාතික භාෂා ව්‍යාපෘතිය සඳහා ඔහු එක් වූ පසුබිම අනාවරණය කර ගැනීමටයි.

**ආචාර්ය ගෝපකුමාර් මහතා -** ආසියානු පදනමේ ආර්ථික පාලනය (Economic Governance /EG) ව්‍යාපෘතියේ නිලයක් දරන අතර ''ජාතික භාෂා ව්‍යාපෘතිය" එහි එක් අංගයකි. කැනේඩියන් සීඩා හා ඇග්‍රි ටීම් යන ආයතන දෙකේ සහයෙන් ක්‍රියාත්මක වේ. අභිමත භාෂාවට අනුකූලව සේවා සම්පාදනය ප්‍රවර්ධනය සඳහා වූ ව්‍යාපෘතියක් ලෙස එය හැඳින්විය හැකි ය. මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ ද්විභාෂා **දිස්ත්‍රික්ක 12 ක් තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන, රෝහල්, පොලිස් ස්ථාන** ආදී තෝරාගත් රජයේ ආයතන 14 ක පමණ මේ වන විට අත්හදා බලා ඇත. එහිලා තවත් විශේෂත්වයක් වන්නේ ත්‍රිකුණාමලය වැනි භාෂාමය විවිධත්වයක් ඇති දිස්ත්‍රික්ක කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමුකර තිබීමයි. තම ව්‍යාපෘතිය පිළිබඳව ඔහු වැඩිදුරටත් මෙසේ පැවසීය. "මා මූලිකත්වය දරන ආර්ථික පාලනය නම් වූ වැඩසටහනේ එක් මූලික අභිමතාර්ථයක් වන්නේ පොදු සේවාවන් සඳහා වූ ප්‍රවේශය පිළිබඳව කටයුතු කිරීමයි. සේවාවන් වෙත ප්‍රවිශ්ට වීම සඳහා වූ භෞතික ප්‍රවේශයන් මෙහි එක් වැදගත් සාධකයක්. ඒ අතර තුර සේවා සම්පාදකයා හා සුදුසු ලෙස සන්නිවේදනය සිදු කළ හැකි පරිදි භාෂාමය පහසුකම් සඳහා ප්‍රවේශ වීමේ හැකියාව ද එක හා සමානවම වැදගත් සාධකයක්. ඒ අනුව ඉහත වැඩසටහන් දෙක අතර එක්තරා සමාන කමක් තිබෙනවා.ඒ අතරම ඇග්‍රි ටීම් ආයතනය අපට අවශ්‍ය සහය ලබා දුන්නා.එය මෙම ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යන්න ශක්තියක් වුණා.මෙහි දී ඇග්‍රී ටීම් ලෙස හදුන්වන්නේ මීට පෙර CIDA ලෙස හැඳින් වූ දැනට කැනේඩියානු මහකොමසාරිස් කාර්යාලයේ දේශීය නියෝජිත ආයතනයයි. අපි දැනට අදාළ අමාත්‍යාංශය හරහා මෙම නියාමක ව්‍යාපෘතිය තව දුරටත් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරන අතර ඒ අතර නව ද්වි භාෂා ප්‍රදේශ 25 පමණ අලුතෙන් එක් කර ගැනීමයි අපේක්ෂාව. මෙතෙක් අදාළ ආයතන කුමන ඒවාද යන්න තෝරාගෙන නැහැ.නමුත් නියමිත සැලසුම් සකස් වෙනවා."

**ඔබගේ අත්දැකීම් අනුව බහුවිධ භාෂා හා ජනවාර්ගික කොටස්වලින් සමන්විත වෙනත් රටවල් හා ශ්‍රී ලංකාව සංසන්දනය කරන්නේ කෙසේද?**

**අනුක් ද සොයිසා:** එසේ සංසන්දනය කිරීම තරමක් අපහසුයි. නමුත් මම හිතනේනේ ශ්‍රී ලංකාව යම් අඩු මට්ටමේ අභියෝග ප්‍රමාණයකටයි මුහුණ දී සිටින්නේ. සංසන්දනාත්මකව සලකා බැලීම දුෂ්කර කාර්යයක් වුවත්, මම හිතන්නෙ ශ්‍රී ලංකාව භාෂා අයිතීන් අධ්‍යයනය හා ඒවා භාවිතයට ගැනීම සම්බන්ධයෙන් දිගු ගමනක් පැමිණ සිටිනවා. ඊට අදාළව රජයේ ආයතන අදාළ අමාත්‍යංශය ,මෙකී මුලපිරීම් වඩාත් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා හොඳ අරඹුමක් ලබාගෙන තිබෙනවා. ඊට අමතරව ඉතා විශාල කාර්යභාරයක් සිදු කර තිබෙනවා වගේම තවත් එවන් වැඩ කොටසක් ඉදිරියට සිදුකළ යුතුව තිබෙනවා.

**ආචාර්ය ගෝපකුමාර්:** ඉන්දියාවේ මෑතදී සිදුවූ ආණ්ඩු වෙනසත් සමග භාෂා ගැටලුව සම්බන්ධයෙන් එහි යම් සංවාදයක් අලුතෙන් ඇරඹී තිබෙනවා. මීට අදාළ අභියෝග පිළිබඳව සලකා බැලීමේදී මාගේ විශ්වාසය නම් නම් සැබෑ අභියෝගය වන්නේ රාජ්‍ය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී භාෂාව සතු කාර්යභාරය වටහා ගැනීමයි. යම් සුවිශේෂී භාෂාවක් හෝ භාෂා කිහිපයක් සතුව පැවතිය යුත්තේ කවර ආකාරයක කාර්යභාරයක්ද? යන්න මෙහිදී වැදගත්. ඒ නිසා තමයි මෙහිලා අවධාරණය කරනු ලබන ත්‍රෛභාෂා හා ද්විභාෂා ආදර්ශ වඩාත් වැදගත් වී තිබෙන්නේ.

එහිලා ඔබ x හෝ y යන භාෂාවක් වෙතට අනුගතවූවෙක් බවට පත්වීම සඳහා යම් බලකිරීමක් සිදුවන්නේ නැහැ. නමුත් ඔබ තහවුරු කරගත යුතුයි, යම් අවස්ථාවකදී ඔබ ත්‍රිකුණාමලය මහ රෝහල වෙත යන්නේ නම් ඔබ කැමති භාෂා මාධ්‍යයෙන් අදාළ සේවාව ලබා

**18 වැනි පිටුවට**

සංවාද සටහන
**චන්ද්‍රිකා ගාඩියවසම්**




# මව් භාෂා දිනය : උපත හා පසුබිම

**බංග්ලාදේශ රජයේ උත්සාහය සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය මත යුනෙස්කෝව 1999-02-21 දින පැවැති මහා සම්මේලනයේ දී ජාත්‍යන්තර මව් භාෂා දිනය ලෙස මෙම දිනය නම් කරන ලදී.**

පරිවර්තනය
**සුරේෂ් කුමාර්**

යුනෙස්කෝ සංවිධානය 1999 වසරේ පෙබරවාරි 21 දින ජාත්‍යන්තර මව් භාෂා දිනය ලෙස නම් කළේ ය. මව් භාෂාවෙහි වැදගත් බව පෙන්වා දීම හා බහුවිධ භාෂා හැකියාවන් වර්ධනය කිරීම මෙවැනි දිනයක් නම් කිරීමට බලපෑ හේතුවිය. අපේ හැඟුම් හා අදහස් පැහැදිලිව, වෙනත් කෙනෙකුට සන්නිවේදනය කිරීම සඳහා ඇති ප්‍රබලම මාධ්‍ය භාෂාව වේ. මව් භාෂා දිනයේ විශේෂත්වය වන්නේ භාෂාව වර්ධනය කිරීම පමණක් නොවේ. මව් භාෂාවට ගෞරව දැක්වීම සඳහා ද මෙම දිනය යොදා ගැනේ. එපමණක් නොව ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බහු භාෂා අධ්‍යාපනය ලබාදීම ද විවිධ භාෂාවන් පිළිබඳ අවබෝධය ලබාදීමක් ද මෙම දිනයෙන් අරමුණු කෙරේ. සංස්කෘතික වෙනස්කම් ඉවසීමද මීට අදාළ වේ. මෙම සියලු කරුණු කාරණා මත පදනම් වූ සමාජ සංවාදයක් ගොඩනැගීමට ද මෙමගින් බලාපොරොත්තු වේ.

1992 වසරේ මෙවන් දිනයක නැගෙනහිර පකිස්ථානයේ අග නගරය වන ඩකාවල දී බෙංගාලි භාෂාව රාජ්‍ය භාෂාව කරනු ලෙස ඉල්ලා ගෙන ගිය අරගලයේ දී, ශිෂ්‍යයන් සිව් දෙනකු ජීවිතක්ෂයට පත්විය. එම සිදුවීම ලොව පුරා මිනිසුන්ගේ භාෂාව පිළිබඳව සිහිකරන දිනයක් බවට පත් විය.

බංග්ලාදේශ රජයේ උත්සාහය සහ ජාත්‍යන්තර සංවිධානවල සහාය මත යුනෙස්කෝව 1999-02-21 දින පැවැති මහා සම්මේලනයේ දී ජාත්‍යන්තර මව් භාෂා දිනය ලෙස මෙම දිනය නම් කරන ලදී. බහුවිධ ජාතීන්ගේ භාෂා සාහිත්‍යය අනන්‍යතාවයන් ආරක්ෂා කිරීමත්, එමගින් සාමූහිකත්වය ඇති කිරීමත් අරමුණු කරගනිමින් යුනෙස්කෝ සංවිධානය මෙම දිනය නම් කර ඇත. 2000 වසරේ සිට මුලු ලෝකයම භාෂා දින සැමරීම ඇරඹුවේ ය.

'බහු භාෂා හැකියාව සමාජ අතර පවතින බැඳීම්, වර්ධනය කිරීමටත් ජාතීන් අතර සංස්කෘතික අවබෝධය පුළුල් කිරීම හා අදහස් හුවමාරු කිරීම වඩා පහසු කරලීමේ මාවතක් වේ. යුනෙස්කෝ අධ්‍යක්ෂිකා අයිරිනා බොන්කෝවා කියා සිටියා ය.


මව් භාෂා ලේඛනවල විශේෂත්වය පිළිබඳ දැනුවත් කිරීම ද මෙම දිනයේ දී සිදුවේ. ජාතික අධ්‍යාපන ආයතන, පාසල්, විශ්ව විද්‍යාල, සංස්කෘතික මධ්‍යස්ථාන හා මාධ්‍යයන් හරහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මව් භාෂාවේ වැදගත්කම පිළිබඳ ළමුන් දැනුවත් කිරීම මුළුමණින්ම ආරම්භ කරනු ලබන්නේ නිවස හා පෙර පාසල තුළිනි. මෙමගින් මව් භාෂාව පිළිබඳ ශක්තිමත් මනා අඩිතාලමක්, දූ දරුවන් තුළ නිර්මාණය කළ හැකි ය. භාෂා දෙකක් හෝ ඊට වැඩි භාෂා ප්‍රමාණයක් දැන සිටීම. කෙනෙකුට සමාජයීය වශයෙන් බැඳීම් ගොඩ නගා ගැනීමේ දී වරප්‍රසාදයක් වේ. ප්‍රථමයෙන්ම මව් භාෂාව ජාතික හෝ ප්‍රාන්ත භාෂාවන්, ඉන් අනතුරුව ජාත්‍යන්තර භාෂාව ඇතුලු බහුවිධ භාෂාවන්හි වැදගත්කම පිළිබඳවත් සෑම මිනිසකු තුළම අවබෝධයක් තිබීම අතිශය වැදගත් ය.


***ජාත්‍යන්තර භාෂා දිනය නිමිත්තෙන් පසුගිය පෙබරවාරි 21 වනදා වීරකේසරි පුවත්පතෙහි පළ වී තිබූ ලිපියක් ඇසුරෙන් මෙම ලිපිය සැකසිණි.***

# මගේ අරමුණ සිංහල පාඨකයාට දෙමළ සමාජය හඳුන්වා දීමයි

## - උපාලි ලීලාරත්න

**උපාලි ලීලාරත්න මහතා මෙරට සිංහල, දෙමළ, සාහිත්‍යය පරිවර්තන ක්ෂේත්‍රයේ අත්දැකීම් රැසක් ඇති ප්‍රවීණ පරිවර්තකයෙකි. පිනිවන්තලාව, පවලායි, වැලිකතරේ සිංහයා, පොඩි සල්ලි, කාන්තාරයේ සිංහයා, ජීවන පියසටහන්, පුවක් අත්ත වැනි සාහිත්‍ය කෘති ගණනාවක් ඔහුගේ පරිවර්තන කෘති අතර වෙයි. සිංහල දෙමළ පරිවර්තන සාහිත්‍ය පිළිබඳ නව උනන්දුවක් ඇති වී තිබෙන මෙම යුගයේ තම පරිවර්තන කටයුතු පිළිබඳ උපාලි ලීලාරත්න මහතා සමග අපි සංවාදයක නිරත වූවෙමු.**





**මේ දිනවල මෙරට සිංහල, දෙමළ පරිවර්තන සාහිත්‍ය පිළිබඳ ඇති වී තිබෙන නව උනන්දුව පිළිබඳ ඔබේ අදහස කුමක් ද?**

පරිවර්තන සාහිත්‍ය පිළිබඳ උනන්දුවක් යම් පමණකින් ඇති වී තිබෙනවා. යුද්ධයෙන් පසු කාලයේ ලැබී තිබෙන නිදහසත් සමග ලේඛකයන් වැඩි වශයෙන් පරිවර්තන සහ ස්වතන්ත්‍ර නිර්මාණයටත්, පාඨකයන් ඒවා රසවිඳීමටත් දායක වෙලා ඉන්නවා.

එහෙත් මෙහිදී, අප රටෙහි ජනතාවට දෙමළ සාහිත්‍ය පිළිබඳ නම් ප්‍රමාණවත් ඇල්මක් ඇති බව පෙනෙන්නට නෑ. පරිවර්තකයන් බොහෝ වෙහෙස මහන්සි වී කරන සිංහල, දෙමළ පරිවර්තන කෘති පාඨකයන් අතරට යාම ඉතා දුර්වල බව අපට පෙනෙනවා. ජනමාධ්‍ය මගින් පවා ඒ පිළිබඳ ප්‍රමාණවත් හඳුන්වාදීමක් කෙරෙන්නේ නැහැ. එය ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්.


**පරිවර්තකයකු වශයෙන් ඔබ ශ්‍රී ලංකාවේ දෙමළ සාහිත්‍ය දකින්නේ කෙසේද?**

මේ රටේ දෙමළ සාහිත්‍ය නිර්මාණ මගින් බොහෝ විට ඉස්මතු කරන්නේ මෙරට වතුකරයේ ජනයාගේ ජීවිතයයි. එවැනි කෘති අතරින් තෝරාගත් කෘති කීපයක් පසුගිය කාලයේ මමත් පරිවර්තනය කළා. තව තවත් දෙමළ කෘති පරිවර්තනය කිරීමේ ආශාවක් මා තුළ තිබෙනවා. නමුත් ඒවා අලෙවිකර ගැනීමේ ගැටලුත් පොත් ප්‍රකාශන ආයතන ඒවා ප්‍රතික්ෂේප කිරීමත් වැනි කරුණු නිසා ඒ පිළිබඳ තියන උනන්දුව නැති වෙලා තියනවා.

2009 වසරේ සිංහල නවකතා 160ක් එළි දැක්වුණා. ඉංග්‍රීසි නව කතා 15ක් එළි දැක්වුණා. එහෙත් දෙමළ නවකතා බිහි වූයේ හයක් පමණයි. දෙමළ සාහිත්‍ය පිළිබඳ සතුටු විය හැකි තත්ත්වයක් තවමත් අප රටෙහි නෑ.

**දෙමළ සාහිත්‍යයේ කවිය හා කෙටි කතාව පිළිබඳ ඔබේ අදහස කුමක් ද?**

දෙමළ කෙටි කතාවේ යම් වර්ධනය වීමක් තිබෙන බව කිව හැකියි. එහෙත් සෑම දමිළ කෙටි කතාවක් ම පාහේ මුලින්ම පළවෙන්නේ පුවත්පතක හෝ සඟරාවකයි. දෙමළ කෙටිකතා පොත් ලෙස පළවෙන්නේ එසේ පුවත්පත්වල පළ කෙරෙන කෙටි කතා සංග්‍රහයන්. පසුගිය වසර තුළ එවැනි දෙමළ කෙටිකතා පොත් 17ක් එළි දැක්වුනා. ඒ සියල්ල පුවත්පත්වල පල වූ කෙටි කතායි. සිංහල කෙටි කතා එසේ නොවේ. එහි වර්ධනය වීමක් පැහැදිලිවම තියනවා. දෙමළ කෙටි කතාවට වඩා සිංහල කෙටි කතාව ප්‍රබලයි. ඊට හේතුව සිංහල කෙටිකතාකරුවා විදේශීය සාහිත්‍ය හැදෑරීමයි. ඒවායින් ලබාගන්නා දැනුම් සහ අත්දැකීම් ද පදනම් කරගනිමින් බිහිවෙන කෙටිකතාවෙහි සාර්ථකත්වයක් දකින්නට පුළුවන්. දෙමළ කෙටි කතා කරුවන්ගේ එබඳු වර්ධනයක් දකින්නට නැහැ.




**"තව තවත් දෙමළ කෘති පරිවර්තනය කිරීමේ ආශාවක් මා තුළ තිබෙනවා. නමුත් ඒවා අලෙවිකර ගැනීමේ ගැටලුත් පොත් ප්‍රකාශන ආයතන ඒවා ප්‍රතික්ෂේප කිරීමත් වැනි කරුණු නිසා ඒ පිළිබඳ තියන උනන්දුව නැති වෙලා තියනවා."**

සංවාද සටහන
**සඳමාලි සෙනෙවිරත්න**

**මෙම ක්ෂේත්‍රයේ විවිධ ගැටලුත් නැතුවාම නොවෙයි. ඒ බොහෝ ගැටලුවලට බලපාන ප්‍රධාන හේතුව වෙන්නෙ සිංහල දෙමළ පරිවර්තන කෘති සඳහා තිබෙන අලෙවි ජාලය ශක්තිමත් නොවීමයි.**

**මේ දිනවල ඔබ නිතරව සිටින සාහිත්‍ය කටයුතු මොනවාද?**

"කාන්තාරයේ රෝස මල" යන තමිල්නාඩු කෘතිය සිංහලට පරිවර්තනය කරගෙන යනවා. ඊට අමතරව 1996 රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේ දී සම්මාන හිමි වූ තෙන්නියාන්ගේ 'මර කොක්කු' කෘතිය සිංහලයට පරිවර්තනය කරගෙන යනවා. මේ අතර අධ්‍යාපනය ලබන සිසු පරපුර වෙනුවෙන් සිංහල අයට දෙමළ බස ඉගෙනුමට 'දෙමළ බස ඉගෙනුමට අත්වැලක්' නමින් එන කෘතියෙහි අවසාන භාගය මේ දිනවල සිදු කරමින් ඉන්නවා.

**සමාජ ඒකාබද්ධතා සතිය නිමිත්තෙන් සිංහල දෙමළ කෙටිකතා කෘති දෙකක් පරිවර්තනය කිරීමට සැලසුම් කර තිබෙනවා. එවැනි වැඩසටහන් පිළිබඳ ඔබේ තක්සේරුව කුමක් ද?**

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ සිදු කරන වැඩසටහන අගය කළ යුතුයි. මේ හරහා සමාජ ඒකාබද්ධතාව ගොඩනැංවෙනවා. සිංහල දෙමළ ලේඛක එකමුතුවේ අපි සියලු දෙනා මේ සඳහා දායකත්වය ලබා දෙනවා. මා විසින් පරිවර්තනය කෙරෙන කෘති දෙකකුත් මේ සඳහා එකතු වෙනවා.

**මේ වන විට ශ්‍රී ලංකාවේ සිංහල දෙමළ පරිවර්තන කටයුතුවල දක්නට ලැබෙන්නේ වර්ධනයක් ද? පසුබෑමක්ද? ඒ පිළිබඳ ඔබේ විග්‍රහය කුමක් ද?**

සුළු වර්ධනයක් දැකිය හැකියි. දැනට සිංහල, දෙමළ පරිවර්තන කටයුතුවල නිරත වෙලා ඉන්න පරිවර්තකයන්ට අමතරව අලුතෙන් පරිවර්තකයන් කීපදෙනෙක් එකතු වී ඉන්නවා ඒ අතර මෙම ක්ෂේත්‍රයේ විවිධ ගැටලුත් නැතුවාම නොවෙයි. ඒ බොහෝ ගැටලුවලට බලපාන ප්‍රධාන හේතුව වෙන්නෙ සිංහල දෙමළ පරිවර්තන කෘති සඳහා තිබෙන අලෙවි ජාලය ශක්තිමත් නොවීමයි. පොත් ප්‍රකාශන ආයතන කැමති නැහැ මෙබඳු පරිවර්තන කෘති අලෙවිය සඳහා ලබා ගන්න. ඊට හේතුව මේ සඳහා ප්‍රමාණවත් අලෙවියක් නැති කමයි. එබැවින් වගකිව යුතු ආයතන මෙම කෘති සමාජගත කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කරන්නේ නම් ඉතා ප්‍රයෝජනවත්.

**ඔබ වැඩි කැමැත්තක් දක්වන්නේ සිංහලෙන් දෙමළට පරිවර්තනය කිරීමටද, දෙමළෙන් සිංහලට පරිවර්තනය කිරීමටද?**

දෙමළ කෘති සිංහලට පරිවර්තනය කිරීමට තමයි වැඩි කැමැත්ත තියෙන්නෙ. මම කුඩා කල සිට ජීවත් වුණේ දෙමළ ජනතාව සමගයි. ඒ නිසා ඔවුන්ගේ පොත්පත් පරිශීලනය කරන්න වැඩි අවස්ථාවක් ලැබුණා. වතුකරයේ ජනයාගේ ජීවිත ගැන ලියවුන දෙමළ කෘති කියවීමට ඇල්මක් මා තුළ ඇති නිසා ඒවා සිංහලයට පරිවර්තනය කර සිංහල පාඨකයාටත් අත්දැකීමට සැලැස්වීමට කැමැත්තක් ඇති වුනා. ඒ මගින් සිංහල පාඨකයාට දෙමළ සමාජය හඳුනා ගැනීමේ අවස්ථාවක් ලැබෙනවා. මගේ අරමුණ එයයි.

News

## 1956 පැය 24 ම වැඩට සැරසෙයි

ද්විභාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් පවතින ගැටලු පිළිබඳ පැමිණිලි කිරීම හා මාධ්‍ය ගැටලු විසඳා ගැනීම සඳහා ක්‍රියාත්මක වන 1956 ක්ෂණික දුරකථන ඇමතුම් සේවාව ඉදිරි කාලයේ දී පැය 24 පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. පසුගිය දා ඇරඹි මෙම ක්ෂණික දුරකතන සේවාව මෙතෙක් ක්‍රියාත්මක වූයේ රාජකාරි වෙලාවන්හිදී පමණක් වුවද එය මෙරට පුරවැසියන් අතර බෙහෙවින් ජනප්‍රියව තිබිණි.

මේ වනවිටත් දිනකට පැමිණිලි 100කට ආසන්න සංඛ්‍යාවක් මෙම දුරකථන අංකය වෙත ලැබෙන අතර පැය 24 පුරා මෙම සේවාව විවෘතව තැබීම මගින් මෙයින් ලැබෙන සේවය තවදුරටත් පුළුල් වනු ඇතැයි ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශය අපේක්ෂා කරයි.

# අන්තර් සංස්කෘතික අධ්‍යයනයෙහි සහ පෝෂණයෙහි වැදගත්කම

**ශ්‍රී ලංකාවේ අන්තර් සංස්කෘතික අධ්‍යයනය සම්බන්ධයෙන් ඇති අඟනා නියැදියක් වන්නේ පානම ප්‍රදේශයයි. නැගෙනහිර පළාතේ ජීවත්වන සිංහල දෙමළ හා මුස්ලිම් ජනතාවගේ සුහද ජනජීවිතය පිළිබිඹු වන භූමි කලාපය ද පානමයි. ජනවාර්ගික විවිධත්වය තුළ නැගෙනහිර පළාතේ යුද්ධයෙන් අවම වශයෙන් හානි සිදු වූ ප්‍රදේශයක් හැටියට ද මෙම කලාපය හඳුනාගත හැකි ය. දෙමළ භාෂාවෙන් පෝෂණය වූ ජනවහර පිළිබඳ අත්දැකීම් කිහිපයක් පානම ප්‍රදේශයෙන් නිදර්ශන කොට ගෙන මෙම ලිපිය සම්පාදනය කරන්නේ මෙරට ප්‍රකට ජනශ්‍රැති පර්යේෂකයකු වන ගුණසේකර ගුණසෝම ය.**

අන්තර් සංස්කෘතික අධ්‍යයනය ඕනෑම සමාජයක සංහිඳියාව තහවුරු කිරීමේ ක්‍රියාවලිය සඳහා වැදගත් වේ. එමෙන්ම යහපත් පුරවැසි සමාජයක් ගොඩනැගීම සඳහා ද එම අධ්‍යයනය උපකාරී වනු ඇත.

"මුඩුක්කුවේ කඩයකට කඩයප්පන් ගේන්න ගියා. හට්ටියක කඩල සොච්චමක් තිබුණා. පිඟානක මුරුක්කු තිබුණා."

මෙය නිවැරදි, පැහැදිලි සිංහල භාෂාව ලෙස සිංහල ජාතිකයකුට දැනේ. නමුත් මෙහි ඇති වචන 14න් 7ක් ම දෙමළ වචන වේ.



ජනශ්‍රැති පර්යේෂක
**ගුණසේකර ගුණසෝම**





මේ අන්දමට දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවට එක් වූ වචන සංඛ්‍යාව 900ක් පමණ වේ.

භාෂාව විෂයයෙහි මෙන්ම සිරිත් විරිත් අතින්ද සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට පොදු වූ ලක්ෂණ නැගෙනහිර පළාතෙන් හඳුනා ගත හැකි ය.

මෙම සිරිත් විරිත්, දරු උපත, මල්වරවීම, විවාහවීම සහ අවමංගල්‍ය උත්සව ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකි ය.

දරු උපතේ දී රන්කිරි කටගෑම යනුවෙන් සිරිතක් සිංහල සමාජයෙහි පවතී. මවගෙන් දොවාගත් කිරි තේ හැන්දක් රන් කැබැල්ලක උරච්චි කර දරුවාට පෙවීම මෙහිදී සිදුවෙයි. මීට සමාන වූ සිරිතක් නැගෙනහිර දෙමළ හා මුස්ලිම් සමාජයෙහි ද හඳුනාගත හැකි ය. සිංහල මහා සමාජයෙහි දරුවන්ට රන්කිරි කට ගාන විට පානම සිංහල සමාජය දරුවන්ට මී පැණි හා 'ගෙල කැට' කවයි.

පානම සිංහල සමාජයෙහි 'ගෙල කැට' නම් වූ කැවිලි වර්ගයක් ඇත. මෙය දෙමළ බසින් කොලුක්කට්ටෙයි වේ. හාල්පිටිවලින් හැදූ මිශ්‍රණයට පැණිපොල් මැදි කර සාදාගන්නා ගුලිය තෙලෙහි බැදීමෙන් මෙම ආහාරය සකස් කෙරේ. දත් එන දරුවා වට්ටියක තබා ගෙලකැට ස්වල්පයක් කන්නට දීම මේ සිරිතයි. නැගෙනහිර දෙමළ පවුල්වල දරුවන්ට 'ගෙලකැට' කන්නට දෙන්නේ දරුවා කුල්ලක තැබීමෙනි.

මුස්ලිම් කතක් ගැබ්බර වීමෙන් පසුව දරුගැබට මාස 4ක් පමණ පිරෙන විට දරුවකු පිළිසිඳ ගැනීමේ පුවත පිය පාර්ශ්වයේ ඥාතීන් හට දැනුම් දෙන්නේ ගෙලකැට බෙදා දෙන අතරතුර ය. (නැගෙනහිර ප්‍රදේශයෙහි ප්‍රචලිත ව ඇත්තේ බින්න කසාදයයි)

සිංහල මහා සමාජයෙහි රන්කිරි කට ගෑමට සමානව දෙමළ සමාජයෙහි පවතින්නේ මී පැණි කටගෑම ය.

මුස්ලිම් සමාජයෙහි මී පැණි කට ගෑමට අමතරව මක්කම වන්දනාවට ගොස් එද්දී රැගෙන එන ශුද්ධ වූ දියර කට ගෑම ද සිදු වේ.

දරුවකු ඉපදීමේ දී නැගෙනහිර ජන සමාජයෙහි පවතින චාරිත්‍රවල ද විශේෂයක් පවතී.

උපන්නේ පිරිමි දරුවකු නම් අසල්වැසියනට හා ඥාතීන්ට සුකිරි කැටද දැරියක නම් සක්කර ද බෙදා දීම සිදු කෙරේ. මෙය ද නැගෙනහිරට ආවේණික වූ සිරිතකි. දැරියකට වඩා දරුවකු උසස් කොට සැලකීමේ සම්ප්‍රදායක් ද එහි ඇත.

**විවාහ සිරිත්**

නැගෙනහිර ප්‍රදේශයේ විවාහ මංගල්‍ය උත්සව පැවැත්වෙන්නේ රාත්‍රී කාලයෙහි ය. බින්න බැසීමේ විවාහ ක්‍රමයද, මඟුල් පෙරහැර පැවැත් වීම ද විශේෂ ලක්ෂණයකි. මනාලයා කැඳවාගෙන යනු ලබන්නේ පාවාඩ, උඩු වියන් අතරිනි.

මනාලියගේ නිවස ඉදිරිපිට කඩුල්ල අසල දී කුඩ හුවමාරුව සිදු කෙරේ. විවාහ වීමෙන් පසුව නව දෙපළට නිවසක් සැපයීම මනාලියගේ පාර්ශ්වයේ වගකීම ය.

එසේ නොහැකි වූ අවස්ථාවල නව යුවලට නිවස භාර දී වැඩිහිටියන් වෙනත් නිවසකට යෑමද සිදුවිය හැකි ය. නොඑසේ නම් නව යුවල මහ ගෙදරම නවාතැන් ගනී.

**අවමඟුල් සිරිත**

මළ මිනිය නිවසෙහි තිබිය දී ලිප ගිනි දැල්වීමක් සිදු නොකෙරේ. එමෙන්ම අවසන් කටයුතු සිදුකරන තුරු ආහාර ගැනීමෙන්ද වැළකෙති. මළ සිරුරු සුසාන භූමිය කරා ගෙන යනු ලබන්නේ ගේට්ටුවෙන් නොව වැට බිඳීමෙනි.

# භාෂා අයිතිය ගමින් ගමට මහනුවර

භාෂා අයිතිය පිළිබඳ අදහස ගමින් ගමට, ආයතනයෙන් ආයතනයට ක්‍රමානුකූලව ගලායමින් තිබේ.ඒ සඳහා විවිධ වැඩසටහන් මේ වන විට රටේ විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් ඇත.

ඒ සඳහා ඇරඹුනු සුළුතර ජාතිකත්ව ප්‍රජාවන්හි භාෂා අයිතීන් පිළිබඳ වැඩසටහන මේ වන විට සිව්වන අදියරටත් පා තබා ඇත. රාජ්‍ය නිලධාරීන් හා පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන්වල සිට වගකිවයුතු රාජ්‍ය ආයතන වෙත බලපෑම් කිරීමේ ක්‍රියාවලින් දක්වා එම වැඩසටහන් පැතිර තිබේ.

මෙහි දැක්වෙන්නේ පසුගිය දින කිහිපය තුළ රටේ විවිධ ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වූ එබඳු වැඩසටහන් මාලාවක අවස්ථා කිහිපයකි.



අඹගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන




මහනුවර දිස්ත්‍රික්කයේ භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනේ අවස්ථාවක්



අඹගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන




මහනුවර දිස්ත්‍රික්කයේ භාෂා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනේ අවස්ථාවක්



මාතලේ රාජ්‍ය නිලධාරීන් සහ භාෂා සංගම් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන



මහනුවර දිස්ත්‍රික්කයේ පැවති රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩමුළුව

# භාෂා අයිතිය

## ගමින් ගමට **මොනරාගල**













මොණරාගල දිස්ත්‍රික්කයේ පැවති රාජ්‍ය නිලධාරීන් සහ භාෂා සංගම් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනෙහි අවස්ථා කිහිපයක්



# දෙවන බසක් ලෙස දෙමළ බස ඉගෙනුමට නව මාවතක්;

# දෙමළ භාෂා ගුරු අත්පොත



**සිංහල භාෂාවේ අක්ෂර, සමග සම්බන්ධ වන දෙමළ භාෂාවේ අක්ෂර පැහැදිලි සුසංයෝගයක් මගින් වඩාත් හොඳින්, මතක තබාගැනීමට හා ඉගෙනීමට පහසු විධික්‍රම අනුගමනය කිරීමට ලේඛකයා මෙම කෘතියේ දී උත්සුක වී ඇත.**

**සුදර්ශනී කුමාරි දමුණුපොල**

ශ්‍රී ලංකාවේ දීර්ඝකාලීනව පැවති වාර්ගික අර්බුදයට බලපෑ ප්‍රධාන සාධකය වූයේ භාෂා අනන්‍යතාව හා සම්බන්ධ ගැටලු බවත් එම ගැටලු විසඳා ගැනීම සඳහා ද්විභාෂා අධ්‍යාපන කටයුතු පුළුල් විය යුතු බවත්, ප්‍රභාත් විජේසිංහ මහතාගේ අදහස ය. ඔහු මේ අදහස් පළ කළේ පසුගියදා ඔහුගේ කර්තෘත්වයෙන් ප්‍රකාශයට පත් වූ දෙමළ භාෂා ගුරු අත්පොත පිළිබඳ විභාෂා සඟරාව සමග තම අත්දැකීම් හුවමාරු කරගත් අවස්ථාවේ දී ය. දීර්ඝකාලීන අත්දැකීම් මත තමන් මෙම කෘතිය පළ කිරීම සඳහා යොමු වූ ආකාරය ඔහු මෙහිදී පැහැදිලි කළේ ය. 1960 දශකයේ දෙමළ භාෂා පණ්ඩිත විභාගය සමත් වන ප්‍රභාත් විජේසිංහ මහතාට 1975 ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙමළ භාෂා කථිකාචාර්යවරයෙක් ලෙස කටයුතු කිරීමට ඇරයුමක් ලැබිණ. එම ආරාධනය පිළිගෙන 1975 සිට වසර කිහිපයක් මෙම කාර්යයෙහි නියැලී සිටින ඔහුට තිස්ස කාරියවසම් මහතාගේ ආරාධනයෙන් 1987 රූපවාහිනිය වෙතින් සිංහල ජනතාවට දෙමළ භාෂා ඉගැන්වීමේ පාඨමාලාවක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබිණි. ඒ අතර දෙමළ හා මුස්ලිම් ජනතාවගේ ඉල්ලීම් මත සිංහල භාෂාව ඉගැන්වීමේ පාඨමාලාවක් රූපවාහිනිය මගින් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ද ඔහුට හිමිවිය. 1994 වන විට චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනියගේ දෙමළ භාෂා උපදේශක වශයෙන් තෝරාගැනෙන අතර 1999 වන තෙක් ඔහු එම වගකීමෙහි නිරතව සිටියේ ය. ඒ අතර එම යුගයේ විදේශ අමාත්‍ය ධූරය දැරූ ලක්ෂ්මන් කදිරගාමර් මහතා විසින් ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාවගේ සිතුම් පැතුම් වටහාගත් සිංහල සහෝදරයෙකු ලෙස මොහු හඳුනා ගනිමින් මොහුට විශේෂ වගකීමක් පැවරුවේ ය. එනම් ස්විට්සර්ලන්තයේ ජීවත්වන දෙමළ ජනතාව හා සිංහල ජනතාව අතර අන්‍යෝන්‍ය සබඳතාවයේ සක්‍රීය පුරුකක් ලෙස කටයුතු කිරීමේ වගකීම ය. භාෂා භාවිතය සම්බන්ධ වැඩිපුර අවබෝධය ලබාගැනීම සඳහා ඔහුට එම අවස්ථාව මනා පිටුවහලක් විය. එහිදී මොහුට වඩාත් හොඳින් පැහැදිලි වූයේ බහුවිධ සමාජයක පැවැත්ම ප්‍රකාශනයේ මාධ්‍යයක් ලෙස භාෂාවෙහි ඇති වැදගත් කම ය. විශේෂයෙන් ම බහුවිධ සමාජය අසීමිත අවශ්‍යතාවන් ඉටුකිරීමේ මාධ්‍යයක් ලෙස මෙරට රාජ්‍ය භාෂාවන් වන සිංහල හා දෙමළ භාෂාවන් සඳහා නෛතික පිළිගැනීම බණ්ඩාරනායක සමයේදීම ලැබිය යුතුව තිබූ බව ප්‍රභාත් විජේසිංහ මහතාගේ අදහස ය. මේ වන විට සිංහල ජනතාවගේ දුරස්තව තියෙන දෙමළ භාෂාව බහුතර සිංහල ජනතාවට වඩා සමීප කිරීමේ පුළුල් අරමුණ පෙරදැරිව දෙමළ භාෂා ගුරු අත්පොත ප්‍රකාශයට පත් කිරීමට තමන් කටයුතු කළ බව ප්‍රභාත් විජේසිංහ මහතා පවසයි. විශේෂයෙන් ම සිංහල ජනතාව ස්වභාවයෙන් ම දෙමළ භාෂාව ඉගෙන ගැනීම සම්බන්ධ මැලිකමක් දැක්වීම, දැනට දීර්ඝකාලීන අත්දැකීමක් වූ බව මොහුගේ අදහස විය. එහිදී මොහු සැමවිටම උත්සාහ ගනු ලැබුවේ එම මානසික තත්ත්වයෙන් බහුතර සිංහල ජනතාව බැහැර කොට දෙමළ බස හැදෑරීම මිහිරි අත්දැකීමක් බවට පත් කිරීමට ය. ඒ සඳහා ඔහු ක්‍රම උපායන් සිහිපයක්ම තම කෘතිය තුළින් ප්‍රකාශයට පත්කොට ඇත. සිංහල භාෂාවේ අක්ෂර, සමග සම්බන්ධ වන දෙමළ භාෂාවේ අක්ෂර පැහැදිලි සුසංයෝගයක් මගින් වඩාත් හොඳින්, මතක තබාගැනීමට හා ඉගෙනීමට පහසු විධික්‍රම අනුගමනය කිරීමට ලේඛකයා මෙම කෘතියේ දී උත්සුක වී ඇත. එමගින් දෙමළ භාෂා ප්‍රගුණය, සිංහල ජනතාවට ජනප්‍රිය, සිත් කාවදින ආකාරයට ඉදිරිපත් කර ඇත. සිංහල ජනතාවට දෙමළ භාෂාව වඩාත් සමීප කිරීම සඳහා සංවේදී උපක්‍රම යොදා ගනිමින් මෙම දෙමළ භාෂා ගුරු අත්පොත නිර්මාණය කිරීමට තමන් උපරිම උත්සාහ ගත් බව ප්‍රභාත් විජයසිංහ මහතා පවසයි.

මෙම කෘතිය කාණ්ඩ තුනකින් සමන්විත වන අතර එහි පළමු කාණ්ඩය පිටු 1024 කින් යුතුව පසුගිය දා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ දී උත්සවාකාරයෙන් ප්‍රකාශයට පත්විය.

News

# රාජ්‍ය නිලධාරීන් 500 දෙනෙකු ද්විභාෂා ප්‍රතිපත්තිය පිළිබඳ දැනුවත් කෙරේ





රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පසුගිය ජනවාරි, පෙබරවාරි, මාර්තු, අප්‍රේල් යන මාස කිහිපය තුළ දිස්ත්‍රික්ක පහක පැවැත් විය. මහනුවර, නුවරඑළිය, බදුල්ල, මාතලේ, මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලදී මෙම රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව පැවැත්විණ.

ද්විභාෂාව සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ මෙම වැඩසටහන් මාලාව සංවිධානය කරන ලද්දේ ඌව ශක්ති පදනම, කදුරට ක්‍රියාකාරී පදනම, ප්‍රජා සම්පත් සුරැකීමේ මධ්‍යස්ථානය, සාමධාන සංවිධානය, මධ්‍යම පළාත් පරිසර පදනම යන සංවිධාන පහ මගිනි.

පසුගිය මාස හතර තුළ සිදු කළ මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රාජ්‍ය නිලධාරීන් 500 දෙනෙක් සහභාගී වූහ.

මේ සඳහා සම්පත් දායකයන් ලෙස නීතීඥ එස් .ජී.පුංචිහේවා මහතා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ ජ්‍යේෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා, ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදී තිඹිරියාගම බණ්ඩාර මහතා ඇතුළු පිරිස සහභාගී වූහ.

පස්සර, ලුණුගල, බුත්තල, මොණරාගල, අඹගමුව, ගම්පොළ උඩ පළාත, රත්තොට, අඹන්ගඟ කෝරළේ යන ප්‍රාදේශීය ලේකම් කෝට්ඨාශ වලදී නිලධාරීන් දැන්වත් කිරීමේ වැඩසටහන් පැවැත්විණ.

විවිධ වූ ක්ෂේත්‍රයන් හි වෘත්තීයේ නියැළෙන රාජ්‍ය නිලධාරීන් මේ සඳහා සහභාගී වූ අතර පොලීසිය, සමෘද්ධි, ග්‍රාම සේවක, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී, ආර්ථික සංවර්ධන නිලධාරීන්, (දිවි නැගුම), ගොවිජන උපදේශක සහ ගොවිජන නිලධාරීන්, ප්‍රාදේශීය සභා නිලධාරීන් සහ මහජනයාට දෛනිකව සේවා  සපයන සියලුම රාජ්‍ය නිලධාරීන්, ප්‍රධානකොටගෙන මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණ.

මෙම වැඩසටහන් මාලාව හරහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය සේවයේ දී මහජනයා දෛනිකව මුහුණ දෙන ද්විභාෂාමය ගැටළු සහ නීතිමය කරුණු ප්‍රායෝගිකව සාකච්ඡා කිරීම විශේෂත්වයක් විය.

සටහන
සදමාලි සෙනෙවිරත්න

# පීටර් කෙනමන් භාෂා සංගමයෙන් දෙමළ භාෂා පාඨමාලාවක්

පීටර් කෙනමන් භාෂා සංගමය මගින් පසුගිය මාර්තු මස ආරම්භ කළ දෙමළ භාෂා පංති මාලාව මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් තිබේ. සිංහල, දෙමළ, මුස්ලිම් යන ජන කොට්ඨාසවල විවිධ වයස් සීමාවලට අයත් පුද්ගලයන් මේ සඳහා සහභාගී වේ.

මෙම දෙමළ භාෂා පාඨමාලාවට 26 දෙනෙකු සහභාගී වන අතර ඉන් වැඩි පිරිසක් සිංහල ජාතිකයන් වන බව පීටර් කෙනමන් භාෂා සංගමයේ සභාපති ජී.ආර්.පී.අයි. පුෂ්පලතා මහත්මිය විභාෂා කළ විමසුමකදී සඳහන් කළා ය.


සතියේ සෑම ඉරිදා දිනකම පස්වරු 2.00 සිට පස්වරු 4.00 වන තෙක් මාලිගාවත්ත ශ්‍රී සුධර්මාරාම විහාරස්ථානයේ දී පැවැත්වෙන මෙම දෙමළ භාෂා පංතිමාලාව පැවැත් වෙන අතර ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ අධීක්ෂණය ද මේ සඳහා ලබා දේ.


# ධම්මපදය දෙමළ බසින්.....





නවාලියුර්
එස්. නඩරාජන්




ගෞතම බුදුන්ගේ ඉතා සුවිශේෂ වැදගත්කමකින් යුක්ත විශාලතම සූත්‍ර එකතුව ධම්මපදය වෙයි. ධම්මපදය සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ පසළොසින් එකකි. මෙය බෞද්ධයන්ගේ අත්පොතක් ලෙස ද සැලකේ. මෙහි පරිච්ඡේද 26කි; සූත්‍ර 423කි.

හින්දූන්ට භගවත් ගීතාව, ක්‍රිස්තියානි බැතිමතුන්ට බයිබලය, සහ ඉස්ලාම් භක්තිකයින්ට කුරාණය මෙන්ම බෞද්ධයින්ගේ අත් පොතක් ලෙස ද ධම්මපදය සැලකේ.

ධම්මපදය ලතින්, ඉංග්‍රීසි, ජර්මන්, ප්‍රංශ, ඉතාලි, රුසියානු, චීන, තිබෙත්, බෙංගාලි, හින්දි, කර්ණාටක ඇතුළු වෙනත් භාෂා ගණනාවකට පරිවර්තනය වී ඇත.

දෙමළ බසින් ප්‍රථම වරට ධම්මපදය 1982 දී ශ්‍රී ලංකා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිටපත් 2000ක් ප්‍රකාශයට පත් කරන ලදී.

පාලි මුල් කෘතියෙන් මෙය දෙමළ බසට පරිවර්තනය කරන ලද්දේ එවකට රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තන අධිකාරිවරයෙකු වශයෙන් සේවය කළ නැසීගිය නවාලියුර් එස්. නඩරාජන් (1910-1988) විද්වතා විසිනි. මොහු යාපනයේ නවාලියුර් ගමේ විසූ සෝමසුන්දරම් (තංගත් තාත්තා) කවිවරයාගේ දෙවැනි පුත්‍රයායි. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙකු වන නවාලියුර් එස්. නඩරාජන් මහතා දෙමළ, සිංහල, සංස්කෘත, පාලි සහ ඉංග්‍රීසි භාෂාවන් පිළිබඳ ප්‍රවීණයෙකි. 'සැළලිහිණි සංදේශය' වල්පොළ රාහුල හිමිගේ 'බුදුන් වදාළ ධර්මය' (what The Buddha Taught) වැනි ග්‍රන්ථ ද දෙමළ බසට මොහු පරිවර්තනය කළේ ය. නවාලියුර් එස්. නඩරාජන්ගේ ධම්ම පදය දෙමළ පරිවර්තනය වර්ෂ 2008 දී කුමරන් පොත් මැදුර විසින් නැවත මුද්‍රණය කරන ලදී.

චෙන්නායි මහබෝධි සංගමය විසින් වර්ෂ 1996 දී ධම්මපදය දෙමළ මුද්‍රණය ප්‍රකාශයට පත් කරන ලදි. අපවත් වී වදාළ පූජ්‍ය නිල්වාක්කේ සෝමානන්ද නාහිමි විසින් පාලි මුල් කෘතියෙන් දෙමළ බසට පරිවර්තනය කරන ලද මෙම දෙමළ ධම්මපදය පිටපත් දසදහසක් මුද්‍රණය කර නොමිලයේ බෙදා හරින ලදී.

බෞද්ධ පොත් පත් කීපයක් දෙමළ බසින් සම්පාදනය කළ ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ පී. රාමස්වාමි මහතා ධම්මපදය දෙමළ බසින් පරිවර්තනය කර චෙන්නායි සාමි බුක්ස් (Samy Books) ප්‍රකාශකයින් විසින් වර්ෂ 2007 දී මුද්‍රණය කර ප්‍රසිද්ධ කර ඇත.

භගවාන් රජ්නිස් (ඕෂෝ) විසින් ඉංග්‍රීසියෙන් සම්පාදනය කරන ලද Dhammapada විවරණය වෙළුම් හයක් ලෙස දෙමළ බසින් තමිල්නාඩු ප්‍රාන්තයේ මහාචාර්ය එන්. රමණී විසින් පරිවර්තනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

ඒ මෙසේ ය.

ධම්මපදය දෙමළ 1 වැනි කොටස පිටු 472
ධම්මපදය දෙමළ 2 වැනි කොටස පිටු 456
ධම්මපදය දෙමළ 3 වැනි කොටස පිටු 476
ධම්මපදය දෙමළ 4 වැනි කොටස පිටු 590
ධම්මපදය දෙමළ 5 වැනි කොටස පිටු 552
ධම්මපදය දෙමළ 6 වැනි කොටස පිටු 553

"භගවත් ගීතාව" "තිරුක්කුරල්" වැනි ශ්‍රේෂ්ඨ ග්‍රන්ථ කියවීමෙන් ලැබෙන පෝෂණය, විනය, දැනුම, ඥානය සහ මගපෙන්වීම ධම්මපදය දෙමළ බසින් කියවන පාඨකයින්ට අත්පත් කරගත හැකි බව සක්සුදක් සේ පැහැදිලි ය. දෙමළ බසට නැගී ඇති විවිධ පරිවර්තන දෙමළ සාහිත්‍යය පෝෂණය කරයි. ක්‍රමානුකූල යුක්තිගරුක සමාජයක් ගොඩනැගීමේ දී මෙම කෘති ඉමහත් සේවයක් ඉටු කරයි.

සටහන
**සභාපති ශිවගුරුනාදන්**



# අසල්වැසියාගේ කවි

සිංහල හා දෙමළ හදවත් අතර සංවාදයක් ගොඩනැගීමෙහිලා සාහිත්‍යයට කළ හැකි මෙහෙය අපමණ ය. එයිනුදු කවිය විශේෂිත වේ. ගුණදාස අමරසේකර ඇසුරෙන් කියන්නේ නම් කවිය මිනිසාගේ හද බස වන බැවිනි.

එබැවින් සිංහල දෙමළ පරිවර්තන සාහිත්‍ය තුළ කවියට ප්‍රමුඛත්වයක් ලැබීම බෙහෙවින් අර්ථවත් ය. එහෙත් මෙරට පරිවර්තන සාහිත්‍ය තුළ කවියට 'හිමි තැන' තැබී ඇති බවක් පෙනෙන්නට නැත. ප්‍රමාණවත් උද්‍යෝගයකින් තොරව සිදු කෙරෙන සිංහල දෙමළ පරිවර්තන කාර්ය තුළ කවියට හිමිව ඇත්තේ අවම සැලකිල්ලකි. එහෙත් ඔවුනොවුන්ගේ හදවත් තේරුම් ගැනීමෙහිලා වැඩිම අවකාශය පවතින්නේ කවියෙහි යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එම අවකාශය පුළුල් කිරීම ජනමාධ්‍යයෙහි වගකීමකි. විභාෂා මගින් ඒ සඳහා දරන උත්සාහය මේ පිටුවෙන් ප්‍රකාශ වේ.

ආරම්භක පියවර වශයෙන් මෙවර පළ කෙරෙන්නේ දෙමළ සාහිත්‍ය පෝෂණය තුළ ප්‍රකට මුස්ලිම් කවියකු වන මහාචාර්ය එම්.ඒ. නුස්මාන්ගේ නිර්මාණ කිහිපයකි. කවියකු මෙන්ම කෙටිකතා කරුවකු හා විචාරකයකු ද වන ඔහු විද්වතකු වශයෙන් අන්තර් ජාතික කීර්තියට පත් ශ්‍රී ලාංකිකයෙකි.

මෙම නිර්මාණ කිහිපය සිංහලට පරිවර්තනය කර ඇත්තේ මෙරට දෙමළ සාහිත්‍ය සිංහල පාඨකයාට හඳුන්වාදීම සඳහා විශාල මෙහෙවරක් ඉටුකර ඇති නිලාර් එන්. කාසිම් ය. ඔහු පරිවර්තනය කළ මෙබඳු කාව්‍ය කාර්මාණ රැ සක එකතුවක් 'සහෝදර පියාපත්' නමින් ගොඩගේ ප්‍රකාශනයක් ලෙස 2006 වසරේදී ප්‍රකාශයට පත්විය. එම කෘතියෙහි පෙරවදනට පෙරවදනක් ලියන රෝහිත භාෂණ අබේවර්ධන දෙමළ කවියේ සුවිශේෂත්වය පිළිබඳව මෙසේ කියයි.

"එය නිරන්තර ව්‍යසනයේත්, අපේක්ෂා භංගත්වයේත්, ගැඹුරු පුද්ගල හුදකලාවේත්, මිනිස් වීරත්වයේත්, සාමූහික පරිත්‍යාගයේත් ඒකාබද්ධ රූපයක් ප්‍රකාශයට පත් කරන්නට අවශ්‍ය ආකෘතික ලක්ෂණ සහිතව වැඩිණි. යථාර්ථයන් දේශපාලනික වීමට අනුරූපීව දෙමළ කවිය සාරාත්මීය වශයෙන් දේශපාලනික විය. එය සංගතව හා ආටෝප රහිත ගැඹුරු මිනිස් කල්පනාවන් ප්‍රකාශනයට සමත්ව ඇත්තේ එබැවිනි.

**සුදු පරෙවියා එනතුරු බලා සිටි විටෙක**

සුදු පරෙවියාගේ ආගමනය
අපේක්ෂාවෙන් සිටි විටෙක
මගේ මිදුලෙහි.....
පළමුවෙන් පැමිණියේ
උකුස්සෙකි
මගේ කුකුළු පැටවුන්
ඩැහැගෙන ගියා ඌ
සැණෙකින්
අනතුරුව
රාජාලියෙක් ඇවිත්
ලැග්ගේය
මගේ මිදුලෙහි
පොල් ගසක් මත
මල පහ කළේ ඌ ෂෙල්
වෙඩිය
මගේ ගේ දොර
බිඳී විසිරී විනාශ වීය
ජීවිතය පවා මට අහිමි විය
සරණාගතයෙක් වීමි
යළිදු මම

**මිනිසා**


දෙවියන් වහන්සේ
ප්‍රාදුර්භූත වූ සේක
සිහිනයෙක,
ස්වර්ගයේ ද්වාරය
නිරයේද ද්වාරය
විවර කරගෙන
උන් වහන්සේ
ප්‍රශ්න පත්‍රයකි මා ඉදිරිපිට
'කවුද නුඹ'
මං මිනිහෙක්'
'නම'
'මිනිසා'
'නුඹේ ජාතිය'
'මිනිස් ජාතිය'
'නුඹේ ආගම'
'මිනිස් ආගම'
අන්තිමේදී
මන්දහාසයෙන් උන්
වහන්සේ වදාරති
'හොඳයි, නිසැකව නුඹට
හිමි වේවි ස්වර්ගයම!'
අහෝ!
සිහිනයෙන් මිදුණු විට
මා උන්නේ
නිරයකය

**ගිනි අවියට දැනුමක් නැත**

ගිනි අවියට දැනුමක් නැහැ
ළතෙත් හිතක් - ඔළුවක්
නැහැ
දැබරැඟිල්ල දැවටෙන විට
කොකා අතර
එය පිපිරෙයි
පණ නල ඩැහැගෙන
ඉගිළෙයි
ගැබ තුළ ඇති දරුවාටත්
වෙනසක් නැහැ
ඥානවන්ත
අණක් ගුණක් යමක් දන්න
එම්බා මගෙ දබරැඟිල්ල
තවත් වරක්
නිවැරදිදැයි ඔය එල්ලය
යළි හිතපත්!
තවත් සියවසක් ගෙවුණත්
එදාට වුව
ඔය එල්ලය නිවැරදි බව
හැමෝම කිව යුතුයි නේද?
ඒ වග සිහි තබා ගෙනම
කොකා ගස්සපන් හරියට!
එහෙම නොවුනොතින්
ඇත්තයි
තව ජන ඝාතකයෙකු බව
ඉතිහාසය
මා නළලත කොටා තබනවා
සැක නැත



පරිවර්තක
**නිලාර් එන්. කාසිම්**



# ඉංග්‍රීසියෙහි වටිනාකම ද උකහාගත යුතුය



ආචාර්ය
දේවනේසන් නේසයියා

**ආචාර්ය දේවනේසන් නේසයියා මහතා යාපනය, මන්නාරම හා මඩකලපුව දිස්ත්‍රික්කයෙහි දිසාපතිවරයෙකු ලෙස සේවය කොට අත්දැකීම් රැසක් ලබා ඇති ලංකා පරිපාලන සේවයේ හිටපු කීර්තිමත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකි.**

**80 දශකය මුල් භාගයේ යාපනය දිසාපතිවරයා ලෙස කටයුතු කළ හෙතෙම පසුව පාරිසරික අමාත්‍යංශයේ ස්ථිර ලේකම්වරයා ලෙස කටයුතු කොට විශ්‍රාම ලැබුවේ ය. මේ වන විට ප්‍රකට විද්වතකු ලෙසද සිවිල් සමාජ නිලධාරියකු ලෙස ද සමාජ මෙහෙවරක නිරතව සිටී.**

**මෙම ලිපි පෙළ මගින් ඔහු දෙමළ භාෂා අයිතිය තහවුරු කරන කෙටි කාලීන හා දිගු කාලීන පියවර කිහිපයක් කෙරෙහි අවධානය යොමු කරයි.**

**මෙවර පළ වන්නේ එම ලිපි පෙළෙහි නමවැනි කොටසයි.**

ශ්‍රී ලංකාවෙහි ඉගෙනීමේ මාධ්‍යය ලෙස හා විශේෂිත ප්‍රදේශවල පරිපාලන හා වාර්තා තබා ගැනීමේ මාධ්‍යය ලෙස නිසි නම්‍යතාවයකින් යුතුව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාවිතා කිරීමේ ත්‍රි භාෂා ප්‍රතිපත්තිය යෝග්‍ය වනු ඇත. ද්විතීයික පාසල්/උසස් පාසල්/තෘතීයික අධ්‍යාපනය යන ඒවායේ ඉගෙනීමේ මාධ්‍යය ලෙස වෙනත් භාෂාවකට (ඉංග්‍රීසි වඩා හොඳය) මාරුවීමේ විකල්පය ඇති ප්‍රාථමික පාසලෙහි ඉගෙනීමේ මාධ්‍යය ලෙස මව් භාෂාව (දේශීය භාෂාව) භාවිතා කිරීමට හොඳ අධ්‍යාපනික හේතු තිබේ.

විද්‍යාව පදනම් කර ගත් ධාරාවන්හි හා වෙනත් සමහර ක්ෂේත්‍රවල ද්විතීයික පාසල්/උසස් පාසල්වලදී හැකි තාක් ඉක්මණින් ඉංග්‍රීසියට මාරුවීමේ ද එලෙසම තෘතීයික අධ්‍යාපනය ඉංග්‍රීසියෙන් විය හැකි බව සහතික කිරීමේ ද විශේෂ වාසි තිබේ. මෙය විශේෂයෙන් මෙසේ වනු ඇත්තේ ඇතැම් අධ්‍යයන ක්ෂේත්‍රයන් හි භාවිතා කරන බොහෝ පාරිභාෂික වචන ද නව දැනුමෙන් වැඩි හරියක් ද ගලා යන්නේ ඉංග්‍රීසියෙන් වන නිසා ය. පාඨ ග්‍රන්ථවල යෝග්‍ය පරිවර්තනවල අඩුව සිංහලෙන් හෝ දෙමළෙන් තෘතීයික අධ්‍යාපනය කර ගෙන යන අයට බාධකයක් විය හැකි ය. තව ද ඉංග්‍රීසිය භාෂාවෙහි මනා දැනුම ක්ෂේත්‍ර ගණනාවක වැඩෙන අවශ්‍යතාවක් වන විදෙස් බුද්ධිමතුන් සමග අන්තර් ක්‍රියාකාරිත්වය පහසු කරනු ඇත.

පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යය ඵලදායී ලෙස භාවිතා කිරීමෙහිලා ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමෙහි සමත් ගුරුවරුන්ගේ හිඟය යි. කෙටි කාල සීමාවන් සඳහා සමහර ඉංග්‍රීසි මාධ්‍ය හා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් විදේශවලින් ගෙන්වා ගැනීම අවශ්‍ය විය හැකි ය. පිරිවැය සාධකය ඇතුළුව හේතු ගණනාවක් නිසා අපට එවැනි ගුරුවරුන්ගෙන් වැඩි දෙනෙක්ම ඉන්දියාවෙන් බඳවා ගැනීමට සිදු විය හැකි ය. එසේ ම එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය හා කැනඩාව වැනි ඉංග්‍රීසි කතා කරන රටවලින් එවැනි ගුරුවරුන් සුළු සංඛ්‍යාවක් බඳවා ගත හැකි ය. එසේ ම විදේශගත ශ්‍රී ලාංකීය ප්‍රජාවගෙන් ද අපට යම් ප්‍රමාණයක් බඳවා ගන්නට පුළුවන. අපේ ජන වාර්ගික ගැටුම විසඳීමෙහිලා ප්‍රගතියක් සිදුවන්නේ නම් මෙය වඩා පහසු හා වඩා හොඳින් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත.

සහශ්‍ර දෙකකට අධික ඉතිහාසයකට දිවෙන පොහොසත් ශාස්ත්‍රීය උරුමයක් සහිත බෙහෙවින් උගත් දශ ලක්ෂ ගණනක ජනතාවන් විසින් කතා කරනු ලබන සිංහල හා දෙමළ යන භාෂා දෙකම මනාව සංවර්ධිත භාෂා දෙකකි. තව ද සිංහල භාෂාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන රාජ්‍ය හා ජාතික භාෂාව ලෙස ද දෙමළ භාෂාව ද නිල හා ජාතික භාෂාවක් ලෙස ද ව්‍යවස්ථාපිතව සුරක්ෂිත කරනු ලැබ තිබේ. එසේම දෙමළ භාෂාව ඉන්දියාවේ ජාතික හා රාජ්‍ය භාෂාවක් ද සිංගප්පූරුවේ රාජ්‍ය භාෂාවක් ද වන අතර මැලේසියාවේ හා වෙනත් බොහෝ රටවල දශ ලක්ෂ ගණන් ජනයා පුළුල් ලෙස භාවිතා කරන භාෂාවක් වේ. පවත්නා තත්ත්වයන් තුළ මේ භාෂා දෙකේම අනාගතය සහතික වී ඇත. ඉංග්‍රීසිය ද දිවයින පුරා ව්‍යාප්ත වෙමින් පවතින අතර සම්බන්ධීකරණ භාෂාවක් ලෙස දැන් ව්‍යවස්ථානුකූලව පිළි ගනු ලැබ ඇත. අප කළ යුතුව තිබෙන දෙය වන්නේ ශ්‍රී ලංකාවෙහි මෙම භාෂා තුනෙහි භාවිතය හා

සංවර්ධනය පහසුකරණය කිරීම හා ඒවායේ අන්තර් ක්‍රියාකාරිත්වයෙන් උපරිම සමාජ හා සංස්කෘතික ප්‍රතිලාභය උකහා ගැනීම ය. වසර දෙදහසකට අධික කාලයක් පුරා භාවිතයේ පැවති ජාතික භාෂා දෙකෙහි පොහොසත් උරුමය ද ඉංග්‍රීසියෙහි සුවිශිෂ්ට වටිනාකම ද මෙම රටේ සමස්ත ජනතාවගේ යහපත සඳහා උකහා ගත යුතු ය.

ඉංග්‍රීසි භාෂා “ටියුටරි“ ද පැහැදිලිවම ඉගෙනීමේ මාධ්‍යයක් ලෙස ඉංග්‍රීසිය තෝරා ගැනීම පහසුකරණය සඳහා වැඩි වශයෙන් පිහිටුවන ලද “ජාත්‍යන්තර පාසල්” ද බහුල වීම මගින් පෙන්නුම්කර ඇති පරිදි ඉංග්‍රීසි භාවිතයට තිබූ ප්‍රතිරෝධය විශාල වශයෙන් අඩුවී ගොස් තිබේ. දෙමළ භාෂාවේ භාවිතයට අදාළ ඇතැම් ප්‍රශ්න හා සිංහල හා දෙමළ භාෂාවන් භාවිතය හා අදාළ ඇතැම් යෝජනා II පරිච්ඡේදයේ සංක්ෂිප්තව දක්වා තිබේ. නිර්දේශිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය ය. විසඳිය යුතුව තිබෙන අනෙකුත් හදිසි ප්‍රශ්න හා අවශ්‍ය කරන වැඩිමනක් ප්‍රතිසංස්කරණ මොනවා ද?

සම්ප්‍රදායික වශයෙන් ගත් කල ජනවාර්ගික වශයෙන් මිශ්‍ර ප්‍රදේශවල පාසල් විවිධ ජන වර්ගයන්ට අයත් තරුණ ජනයා එකට මුසුවන හා කල් පවත්නා සම්බන්ධතා ගොඩ නගා ගන්නා ආයතන බවට පත්ව තිබේ. මෙය පහසුකරණය කරනු ලැබුවේ එම ප්‍රදේශවල බොහෝ පාසල් ජන වාර්ගික වශයෙන් සම්මිශ්‍රිතව තිබීම මගිනි. 1956 දී එකම රාජ්‍ය භාෂාව බවට සිංහල භාෂාව පත් වීමේ ද විශේෂයෙන් සිංහල හා දෙමළ භාෂාවන් මගින් ඉංග්‍රීසිය පාසල්වල ඉගෙනීමේ මාධ්‍යය ලෙස විතැන් කිරීමේ සිට හා අනතුරුව මුස්ලිම් පාසල් යන තුන්වන වර්ගයක් හඳුන්වා දීමෙන් මෙම ජනවාර්ගික ප්‍රවර්ගයන් තුන වැඩි වැඩියෙන් හුදකලා බවට පත්ව තිබේ. මීට කලින් පවා වැවිලි ප්‍රදේශවල කඳුරට දෙමළ ජනයා සඳහා වූ “වතු පාසල්” එම දෙමළ ජනයා හුදකලා කිරීමට දායක වී ඇත. එතැන් පටන් “යථාර්ථකරණයේ” පලප්‍රයෝජන තකා ද්වි පාසල් එක් භාෂාවක් බවට වෙන් කිරීම මගින් ද්වි භාෂා පාසල් ගණන විශාල වශයෙන් අඩු කර තිබේ. අවශේෂ පාසල් තුළ පවා සිසුන් භාෂාමය ධාරාවන්ට බෙදනු ලැබේ. උසස් මට්ටමේ ක්‍රිස්තියානි පාසල් ස්වල්පයක් පමණක් භාෂාමය වෙන්කිරීම නොවැළක්විය හැකි විෂයයන්හි දී හැර පංති මිශ්‍රව පවත්වා ගැනීම මගින් එවැනි බෙදීමකට එරෙහිව අර්ධ වශයෙන් ප්‍රතිචාර දක්වා තිබේ. ඇතැම් පාසල්වල විෂයයන් හතරක් (එම විෂයයන් හතරේ පංති තුළ සිංහල හා දෙමළ ධාරාවන්ගේ සිසුන් මිශ්‍ර කරමින්) ඉංග්‍රීසියෙන් ඉගැන්වීමට අවකාශ සලසනු ලබන “මිත්‍රත්ව” මුලපිරුම සැලසුම් කර ඇත්තේ විවිධ ජනවර්ගයන්ට අයත් සිසුන් අතර “මිත්‍රත්වය” සේ ම ඉංග්‍රීසි ප්‍රවීණතාව ද ප්‍රවර්ධනය කිරීම සඳහා ය. එහෙත් සමස්තයක් වශයෙන් ගත් කල වෙන් වෙන් භාෂාමය/වාර්ගිකමය ධාරාවන්ට බෙදීම මගින් දීර්ඝකාලීනව හා ජාතිකත්ව, සමාජ, ආර්ථික හා දේශපාලන සමාගමයට බලපාන ජනවාර්ගික ධ්‍රැවීකරණයට දායක විය හැකි ය.

**මතුසම්බන්ධයි..**



රජයේ ත්‍රෛභාෂා වැඩ පිළිවෙළ හා එහි ක්‍රියාකාරිත්වය 5 වැනි කොටස

# ත්‍රෛභාෂික වැඩපිළිවෙලේ සැඟවුණු අපේක්ෂා

පසුගිය කලාපය හා සබැඳේ...



අපට මීට අදාළ ක්ෂේත්‍ර කාරිය සඳහා මූල්‍ය හා මානව සම්පත් නොමැතිකමින් එය නිසි ලෙස ඉටු කළ නොහැකි වූ බව මුලින් ම පිළිග නිමු. එහෙත් ලබාගත් ක්ෂේත්‍ර නිර්දිෂ්ඨ සුළු වුවද ඒවා අපට මේ ගැන දහසක් දේ කියා පායි. මෙහි විභාගයට භාජන කරන උදාහරණයකට ගන්නේ බස්නාහිර පළාතේ නිර්දිෂ්ඨදායකයන් හතර දෙනෙකු ගෙන් ලබා ගත් නිර්දිෂ්ඨ ය. මවුවරුන් දෙදෙනෙකු විසින් (1-13 වයස් කාණ්ඩයට අයත්) තම වයස අවුරුදු 12හේ හා 9යේ ළමයින් දෙදෙනාට භාෂා ඉගැන්වීම සඳහා අදහස් දක්වන ලදි. එක් මවක කියා සිටියේ තම දරුවාට භාෂා තුන ම ඉගැන්වීමට කැමති අතර අනික් මව, දෙමළ හැර අනික් භාෂා දෙක තම දරුවාට ඉගැන්වීමට කැමැත්ත දැක්වූවා ය. ඔවුන් දෙදෙනා දැනට ටියුෂන් සඳහා මසකට රු. 1500/- හා රු. 1000/- බැගින් වැය කරති. එක් ළමයෙකු (වෙනත් විෂයන් ඇතුළුව) ටියුෂන් සඳහා සතියේ දිනවල සවස 2.30 - 7.00 දක්වා කාලය ගත කරන අතර අනික් ළමයා සතියේ දිනවල සවස 2.00 සිට 4.30 දක්වා ද සෙනසුරාදා උදේ 8.00 සිට 11.30 දක්වා ද කාලය ගත කරයි.

පියවරු දෙදෙනා ද තම ළමයින්ට භාෂා තුනම ඉගැන්වීමට කැමැත්ත පළ කළහ. එක් පියෙක් තම 6 හැවිරිදි ළමයාට දැනටමත් ඉංග්‍රීසි ටියුෂන් ගැනීම සඳහා රු. 600/- ක් වැය කරයි. ටියුෂන් වේලාව සතියේ දිනවල සවස 3-5 දක්වා ය. මෙහි සඳහන් කළ සියලු ම ළමයින් ඉගෙනුම ලබන්නේ රජයේ පාසල්වල ය. අනික් පියාගේ ළමයි දැනට පාසල් යන්නේ නැහැ.

මේ නිර්දිෂ්ඨ ගැන අප පුදුමයට පත් වන්නේ නැහැ. එසේම ගැඹුරින් සලකා බැලුවොත් ලංකාවේ අනික් පළාත්වල දෙමාපියන්ගේ සිතුම් පැතුම් ද මීට වෙනස් විය හැකි නො වේ. අද ගම්බද පළාත්වල ද ජාත්‍යන්තර පාසල් ගොඩ නැගෙමින් පවතී. අද රැකී රක්ෂා ප්‍රශ්නය එක් අතකින් රඳා පවත්නේ ඉංගිරිසිය මත ය. ඒ සඳහා කෙබඳු ප්‍රවීණත්වයක් අවශ්‍ය ද යනු කිසිවෙකු දන්නේ නැහැ. ගැඹුරු ක්ෂේත්‍ර කාරියකින් වත් අධ්‍යයනයකින් වත් එළැඹෙන නිගමන නුනත්, අප සාමාන්‍ය විද්වත් සැකයට අනුව, අද ලංකාවේ සමාජ ජංගමය (Social mobility තම සමාජ තත්ත්වය ඉහළ නංවා ගැනීම සඳහා) ගෙන යන වැඩ පිළිවෙල මෙසේ සිතා බැලිය යුතු ය.

ඉතා ශෝභන ලෙස මුද්‍රණය කරන ලද ටියුෂන් පත්‍රිකාවන් මගින් ටියුෂන් දැන්වීම්කරු මෙසේ උපදෙස් දී ඇත. 'තමන් සිටින මට්ටමට වඩා ඉහළ සමාජයකට ගමන් කිරීම සඳහා අත්‍යවශ්‍ය ඉංග්‍රීසි භාෂාව (මේ අන්තිම වචන දෙක විශාල අකුරින් යොදා ඇත.) ඉගෙනීම සඳහා අසවල් දින ඇරඹෙන පන්තියට නොපමාව බැඳෙන්න.'

මේ දර්ශනය උඩ අද ලංකාවේ ඉංගිරිසි ඉගෙනීම වර්ගීකරණය කරමු.

1. සිය දරුවන්ට විදේශීය ඉංගිරිසි කතා කරන රටවල ඉගෙනීම ලබා දෙන්නේ ඉතා ධනවත් පංතියයි.

2. දෙවන වර්ගයට අයත් වන්නේ මිනිසා ජාත්‍යන්තර පාසල් මගින්



ඉංගිරිසිය මුල් කරගත් අධ්‍යාපනයක් ලබා දෙන ඉහළ මධ්‍යම පන්තියයි.

3. තුන් වන වර්ගය වන්නේ රජයේ පාසල්වලින් ලබන ඉංගිරිසි අධ්‍යාපනයට අමතර ව ටියුෂන් මගින් ද ඉංගිරිසි දැනුම දියුණු කර ගැනීමට උත්සාහ ගන්නා පහළ මධ්‍යම පන්තිය හා අඩු ආදායම් ලබන උදවියයි.

මේ පිළිබඳ සංඛ්‍යා ලේඛන කිසිවක් අප සතුව නොමැති ය. එසේම මේ ආකාරයෙන් ඉංගිරිසි ඉගෙන ගන්නා අයගේ දැනුම තක්සේරු කිරීමට ද මඟක් නොමැති ය.

එහෙත් එකක් නම් පැහැදිලි ය. මේ සම්පූර්ණ අභ්‍යාසය සමාජයීය ජංගමය සඳහා ය. අද පවතින විවෘත ආර්ථිකය හා රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව මහා පරිමාණ සමූහ ව්‍යාපාර, තම පන්ති අනන්‍යතාව රැක ගැනීම අරමුණු කොට ගෙන සමාගම්වල රක්ෂා දෙන්නේ යම්කිසි ඉංගිරිසි දැනුමක් ඇති අයට පමණයි. ඉංගිරිසි දැනුමක් නොමැතිය කියා රක්ෂා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම රජයේ ප්‍රතිපත්තිය ද වෙයි. මේ අනුව වෙනත් සුදුසුකම් කොපමණ තිබුණත් රක්ෂාව මධ්‍යම පන්තියට නැත්නම් මධ්‍යම පන්තියට බඩ ගාන්නවුන්ට සීමා වේ. රජය කියන්නේ 'තරගකාරී' වර්තමාන ලෝකයේ ඉංගිරිසිය අවශ්‍ය උපකරණයක් බව යි. අද රජයේ පාසල්වලින් ද ලැබෙන අධ්‍යාපනයට අනුව පාසල් හැර යන ශිෂ්‍යයන් ගෙන් බහුතරයක් අපේක්ෂා කරන්නේ පාසැලේ ද අඳින්ට පුරුදු වුණු ටයි පටිය, තවදුරටත් ඇඳිය හැකි රක්ෂාවකට යෑම ය. ඇත්ත වශයෙන් ත්‍රෛභාෂිතයෙන් මේ එක භාෂිතයකට නැඹුරු වන පරිදි වෙනස් කළ හැක්කේ රජයට පමණයි. සිංහල කථාකරන්නෙකු තමා කථා කරන බසින් ඉගෙනීම ලබා, දෙමළ ද එසේම යි, තමන් කථා කරන බසින් තමන්ට රක්ෂාවක් ලබාගත නොහැකි නම් ඒ අධ්‍යාපනයෙන් ඇති පළේ කුමක් ද?

රජයේ ත්‍රෛභාෂිත වැඩ පිළිවෙලේ සැඟවුණු තවත් අපේක්ෂාවක් වන්නේ, හැදීගෙන එන පරම්පරාවට තරමක ඉංගිරිසි දැනුමක් ද පරිගණක දැනුමක් ද දී පරිගණක හෙදි වැනි ටයි පළඳින ජොබ්ස් සඳහා ඉංගිරිසි කථා කරන ලොවට යවා, එක් අතකින් රටට විනිමය ලබා ගැනිම ද අනික් අතට රැකීරක්ෂා හිඟය අවම කර ගැනීම ද වේ. එය කොපමණ කලක් කරගෙන යා හැකි ද?

ඇත්තවශයෙන් මෙයින් සිදු වන්නේ, වෙහෙස මහන්සි වී, දුක් කරදර විඳ සිය බසින් ඉගෙන ගන්නා ශිෂ්‍යයාට සමාජයීය ජංගමයට ඉඩක් නොලැබීමයි. ජනහිතකාමී, අපේකම අගයන රජයක් විසින් කළ යුත්තේ, සිංහල හෝ දෙමළ හෝ කතා කරන තරුණයන්ට, ඉංගිරිසි නමැති කඩුව අමෝරන්නේ නැතිව, සුදුසුකම් අනුව, රැකී රක්ෂා ලබා ගැනීමට අවස්ථාව සැලසීම යි.

**ලබන කලාපයට....**

**අමරදාස වීරසිංහ**
සංස්කෘති සඟරාවෙහි 2013 පෙබරවාරි කලාපයෙන් උපුටා ගැනීමකි.

# තම අභිමත බසින් ....

3 වැනි පිටුවෙන්

ගැනීමට ඔබට හැකියාවක් පවතීය යන්න. එවැන්නක් සමාජයත් පිළිගත යුතුයි.

සංකල්පීය මට්ටමේදී, ඔබ සතුව ව්‍යවස්ථාමය ප්‍රතිපාදන පවතිනවා සේම ප්‍රතිපත්තිමය සංවාදයක් තුළ ඔබ රැළී සිටිනවා. නමුත් ප්‍රායෝගික තලයේදී මෙකී කරුණු තුළ විශාල වෙනසක් තිබෙනවා. අපි ඉල්ලන්නේ නැහැ හැමදෙනාම භාෂා තුනම ඉගෙන ගන්න කියල. අපි පුරවැසි ප්‍රතිචාර රැගත් වාර්තා (Citizen report cards) වගේම ප්‍රතිචාර



දක්වන ලද සමීක්ෂණ (Feedback Surveys) බොහෝ ගණනක් සිදු කර තිබෙනවා. එහිලා පොදු ගැටලු ගණනාවක් මතු වුණා. නිරතුරුවම මතු වූ ගැටලුවක් වුනේ, ජනතාවට අයදුම්පත්‍ර අවබෝධ කරගැනීමේ පවත්නා අපහසුතා, තමන්ගේ භාෂාවෙන් ලියකියවිලි ලබාගැනීම හෝ අයදුම්පත්‍ර පිරවීම වැනි කාරණා. මෙකී ප්‍රතිචාරවලින් ප්‍රත්‍යක්ෂ වුනේ යමකට ප්‍රවේශවීමේදී භාෂාව බාධකයක් ලෙස පැවැත්වීමේ තත්ත්වයයි.

ඔබ සමාජ, ආර්ථික හා භෞතික ප්‍රවේශවලට අදාළ ගැටලු පිළිබඳව සලකා බලන මොහොතක, අපගේ ප්‍රතිතර්කය වුනේ භාෂාමය ප්‍රවේශය (භාෂා භාවිතය සඳහා පැවතිය යුතු තෝරාගැනීමේ අවස්ථාව) ද පෙර කී කාරණා සේම වැදගත් බවයි. ආයතනයක් පිළිබඳව සලකා බැලීමේදී එය නියමිත වේලාවට විවෘතව තිබිය යුතුවාක් මෙන්ම ඔවුන් පැවසිය හැකියි සියලු දෙනාටම නිදහසේ ඊට පැමිණිය හැකියි කියා. නමුත් ඔබ, ඔබගේ තෝරාග ැනීමට අදාළව ඔබේ බසින් අදාළ කරුණක් ඇසීමට හැකියාවක් නැතිනම් සැබැවින්ම, ඔබට ප්‍රවේශයක් එතැන නැහැ. යම් මූලික පැමිණිල්ලක් පොලිසියට කරන අවස්ථාවකදී හෝ රෝහලකින් යම් වෛද්‍යමය සහායක් ලබාග න්නා අවස්ථාවක මෙකී කරුණු වටහා ගැනීම පහසුයි. සැබවින්ම භාෂාව පහසුකාරකමය භූමිකාවක් නිරූපණය කරනු ලබන්නේ.

**ශ්‍රී ලංකාවේ අද වන විට භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැඟෙමින් පවතින ආකාරය පිළිබඳ ඔබගේ විග්‍රහය :**

**ආචාර්ය ගෝපකුමාර් :** භාෂාමය අයිතීන් සුරැකීම සඳහා අදාළ අමාත්‍යංශ නායකත්වය,

ඉතා ගැඹුරින් ඇප කැපවී සිටිනවා. එහිලා ශක්‍යතා වර්ධනය ඔවුන් මුහුණ දෙන ප්‍රබල අභියෝගයක් බවට පත් වී තිබෙනවා. එය ජය ගැනීමට අප ආයතනය පුහුණු වැඩසටහන් හා මෙවලම් නිර්මාණය කිරීමට ඔවුන් හට සහය දෙනවා.

**ඔබ මීට ඉහත සඳහන් කළා යම් යම් ප්‍රායෝගික අත්දැකීම් පිළිබඳව. ඔබට මේ මොහොතේ සිහියට නැගෙන භාෂා අයිතීන්වලට ගරු කිරීමේ පෙරමුණ ගෙන සිටින අනෙක් අය කවුද?**

මම හිතන්නෙ අප සතුව දැනට තිබෙන ක්ෂේත්‍ර 14 සතුවම එවන් පිරිස් සිටිනවා. නුවරඑළියේ පුරපතිවරයා මම හිතන්නෙ ඒ අතරින් ප්‍රමුඛයි. නුවරඑළිය ජනවාර්ගිකමය පැත්තෙන් ගත්තොත් යම් පමණකට මිශ්‍ර ප්‍රදේශයක්. ඔහු සතුව පවත්නා අභිලාෂය ඉතා වැදගත්. එනම් තමන්ගේ බල ප්‍රදේශයේ හැම පුරවැසියෙකුගේම අවශ්‍යතා නියමිත ලෙස සපුරාලීම සඳහා පවතින උනන්දුව. ඒ නිසා තමයි අපි "Process Champions" යන නාමය ඔවුන් සඳහා යොදන්නෙ. අපි මුහුණ දුන් එක් අභියෝගයක් වුනේ මෙකී ක්ෂේත්‍ර 14 පිළිබඳවම සලකා බලමින් එක් එක් කෂේත්‍රයේ "Process Champion" කවුරුන්ද යන්න හඳුනාගැනීම . ඒ වගේම විවිධ මට්ටමේ ආයතනික ස්වරූප, විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන පෘථුල හැකියාවන්ගෙ න් සමන්විත සාමාජිකයන්, ආයතනය තුළ හා ඊට පරිබාහිරව නියෝජනය කරනු ලබන භාෂා කමිටුද මීට අදාළයි.

**ඔබ පැවසූ ආකාරයට භාෂා කමිටු සමන්විත වන්නේ කවර අංගවලින්ද?**

අපි අපේ සෘජු මැදිහත් වීම පසුගිය දෙසැම්බර් මාසයෙන් අවසන් කළා. ජූනි මාසයෙන් ඉතිරි මැදිහත්වීම් කටයුතුත් අවසන් වෙනවා. මෙම සෑම ස්ථානයකම ඇති භාෂා කමිටුවල අඛණ්ඩ ක්‍රියාකාරිත්ව පිළිබඳව අපි අවධානයෙන් සිටිනවා. මම හිතන්නෙ මෑතදී කැනඩා රජයත් මීට අදාළ සමහර ස්ථාන කේන්ද්‍ර කරගෙන යම් ඇගයීමක් සිදු කළා. ඔවුන්ගේ නිගමනය වූයේ මෙකී නියාමක සංකල්පය තවමත් ක්‍රියාවට නැගෙමින් තිබෙන බවයි. එය එකම ආකාරයේ ශක්තියකින් යුක්තව එක් මට්ටමකින් ක්‍රියාවට නොනැගෙනවා විය හැකියි.

මෙකී භාෂා කමිටු බොහෝ ඉදිරියට ගමන් කොට තිබෙනවා. එම කමිටුවල නායකත්වය පවා වෙනස් වී තිබෙනවා. ඒ වගේම සමහර ආයතනවල ප්‍රධානීන් මාරු වී තිබෙනවා. එසේ නමුත් භාෂා කමිටුවල ක්‍රියාකාරිත්වයට එය බලපා නැහැ. ඊට සමහර විටෙක හේතුපාදක වන්නට ඇත්තේ මෙකී භාෂා කමිටු තුළ බිහිකර ඇති "හිමිකාරිත්ව" සංකල්පය විය හැකියි.

ඇත්තටම ඉහළම මට්ටමේ සිට නොව, සෑම ආයතනයක ම සෑම නිලතලයක් පාසාම මෙකී ක්‍රියාකාරිත්වය ගලා යන ආකාරයටයි මේවා නිර්මාණය කර තිබෙන්නේ. එසේ නැති වුනොත් භාෂා ක්‍රියාකාරිත්වයේ ඔබ පෙරමුණ ගෙන සිටින අවස්ථාවකදී ඔබට අදාල ආයතනය අතහැර යන්න වුනොත්, එතෙක් ගොඩනැගූ සෑම දෙයක්ම බිඳ වැටෙන්න පුළුවන්. මෙහිදී එවැන්නක් සිදු වුණේ නැහැ.

**මතු සම්බන්ධයි**

# පුරවැසි අතිරේකය

## පුරවැසි කතිකාවතක ඇරඹුම

**සක්‍රීය පුරවැසි සමාජයක් ගොඩනැගීමේ උත්සාහයන් ගණනාවක් මෙරට ඉතිහාසය පුරා ක්‍රියාත්මකව තිබිණි. තම අයිතීන් පිළිබඳ දැනුවත් සක්‍රීය මිනිසකු බිහිකිරීම ඒ උත්සාහයන්හි අරමුණ විය.**

**භාෂා අයිතිය යනු එබඳු මානව අයිතීන් අතරින් එක් අයිතියක් පමණි.ඉතිහාසය තුළ මිනිසා මේ සියලු අයිතීන් දිනාගෙන ඇත්තේ නිශ්ක්‍රීයව සිටීමෙන් නොවේ.ඒ සඳහා කරන ලද දීර්ඝ අරගල තුළිණි.**

**අරගල කිරීම සඳහා ද තම අයිතීන් පිළිබඳ මූලික අවබෝධයක් මිනිසාට තිබිය යුතුය.**

**මේ සියලු ගුණාංග කැටි කොටගත් පුළුල් පුරවැසි ව්‍යාපාරයක් ගොඩනැගීම පිළිබඳ මූලික සාකච්ඡාවක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත් වීමෙන් මෙම මැයි මස 29 වන දින සිට ජූනි මස 01 දින දක්වා මහනුවර දී පැවැත්විණ.**

**දිවයින පුරා දිස්ත්‍රික් ගණනාවක් සහ විවිධ ප්‍රජා සංවිධාන ගණනාවක් නියෝජනය කරමින් පැවති එම සාකච්ඡාවෙන් අනාගත පුරවැසි ව්‍යාපාරයක ඇතුළත්විය යුතු මූලිකාංග ගණනාවක් කෙරෙහි අවධානය යොමු විය.**

**විභාෂා පුවත් හසුන මඟින් පළකෙරෙන මෙම පුරවැසි අතිරේකයෙහි අරමුණ බිම් මට්ටමෙන් ගොඩනැගෙන එබඳු පුරවැසි ව්‍යාපාරයක් පිළිබඳ පුළුල් කතිකාවතක් ගොඩනැගීමයි.**

## පුරවැසි සභා සමාරම්භය

දිවයිනේ දිස්ත්‍රික්ක කිහිපයක සමාජ ක්‍රියාකාරිකයන් එක ම සෙවණක් යට හිඳ පුරවැසි සභාව නිර්මාණය කිරීම පිළිබඳ කතිකාවත ආරම්භ කිරීම සුවිශේෂී සිදුවීමකි.

2014 මැයි මස 29, 30, 31 සහ ජූනි මස 01 වැනි දින මහනුවර ටොපෑස් හෝටලයේ දී මෙම ඓතිහාසික පුරවැසි හමුව පැවැත්විණ. මේ සඳහා සම්පත් දායකයන් වශයෙන් ආචාර්ය පාක්‍යසෝති සරනවමුත්තු, ලයනල් ගුරුගේ, නීතිඥ එස්. ජී. පුංචිහේවා සහ ගුණසේකර ගුණසෝම දායකත්වය දුන්හ.

මන්නාරම, කිලිනොච්චි, දිගාමඩුල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, මහනුවර, බදුල්ල, මාතලේ, කුරුණෑගල සහ කොළඹ දිස්ත්‍රික්ක නියෝජනය කරමින් විවිධ වෘත්තිකයන් මීට සහභාගි වීම විශේෂත්වයකි. පුරවැසි සභා ව්‍යුහය, පුරවැසි සභා විලයපථය, අනුකම්ටු, පුරවැසි සභා ව්‍යවස්ථාව, පුරවැසි සභාවේ කාර්ය භාරය සහ පුරවැසි සභාව ගම තුළ පිහිටුවන ආකාරය යනාදිය පිළිබඳ පුළුල් මට්ටමේ සාකච්ඡාවක් එහි දී දියත් විය.

සැසිය අවසාන වූයේ පුරවැසි සභා වලට අදාළ කෙටුම්පත් නිර්මාණය කිරීමෙනි. එය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය සම්මුතීන්වල එළඹීමෙනි.

## පුරවැසි සභා අනුකම්ටු

ගම තුළ සිදුවිය යුතු ආර්ථික සමාජ සහ සංස්කෘතික අභිවෘද්ධිය කෙරෙහි සැලකිලිමත් වෙමින්ද පුරවැසියාගේ වගකීම සහ පුරවැසියාට වගවීම සැලකිල්ලට ගනිමින්ද අනුකම්ටු ගොඩනැගෙයි. පුරවැසි සභාවේ ව්‍යවස්ථාවට අනුකූලව යමින් ග්‍රාම සේව වසමෙහි අවශ්‍යතාවල ප්‍රමුඛත්වය පිළිබඳ සැලකිල්ලට ගනිමින් අනුකම්ටු නිර්මාණය කෙරේ.

පුරවැසි සභා පිහිටුවීමේ දී ඒ ඒ සභාවල බහුතරයේ අභිමතය පරිදි අනුකම්ටු පිහිටුවීම, ඒවාට අයත් සැලසුම් ක්‍රියාත්මක කිරීම අරමුදල් සම්පාදනය සහ පසුවිපරම සිදු වේ.



පුරවැසි සභාවේ අභිමතය පරිදි අවශ්‍යතාව අනුව නව කම්ටු

# පුරවැසි අතිරේකය

ගොඩනැගීමේ අවස්ථාව තිබේ.

යෝජිත අනු කමිටු.

1. පරිසරය සහ මිනිසා.

2. යහපාලනය

3. මානව ගරුත්වය, භාෂා හා සංස්කෘතික විවිධත්වය

4. තරුණ නියෝජනය

5. ළමා හා කාන්තා නියෝජනය

පරිසර හිතකාමී ජීවන දර්ශනයක් අනුව කටයුතු කරමින් කෘෂිකර්ම, පශු සම්පත් ධීවර හා අනෙකුත් කර්මාන්ත දියුණු කිරීම මෙහි අරමුණයි.

පරිසර සමතුලිතතාව බිඳ වැටෙන ක්‍රියාකාරම් පිළිබඳ යළි සළකා බැලීමක් සිදු කෙරේ.

ජෛව විවිධත්වයට හානි වන අයුරින් ගම තුළින් ද බාහිර බලපෑම්වලින් ද ක්‍රියාත්මක වන බලවේග පිළිබඳ අවධානයෙන් කටයුතු කරනු ඇත. ගමෙහි වෘක්ෂලතා සහ ඔසු පැළෑටි සංරක්ෂණය කෙරෙන ක්‍රම දෙකක් අනුගමනය කෙරෙනු ඇත.

## යහ පාලනය

1. ගමට සේවා සපයන ආයතන සහ ඒවායින් ලැබිය යුතු සේවා අර්ථකථනයක් කිරීම

ඒවා නම්

පොලීසිය, ප්‍රාදේශීය ලේකම්, පවුල් සෞඛ්‍ය සේවය, ග්‍රාම නිලධාරී, ගොවි ජන සේවා නිලධාරී, සමෘද්ධි නියාමක, වතු අධිකාරී, ධීවර සමිති, කාන්තා සංවිධාන, මරණාධාර සමිති, ත්‍රී රෝද සංගමය, ආගමික සංවිධාන, මහජන සෞඛ්‍ය පරීක්ෂක, පළාත් පාලන ආයතන, පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව

2. එම ආයතනවලින් ලැබෙන සේවා නිසි පරිදි ලැබේ ද?
3. සේවා සපයන්නා සහ සේවා ලාභියාගේ පාර්ශ්වයෙන් සිදු වන අඩු පාඩු මොනවා ද?
4. ඒවා මග හරවා ගත හැක්කේ කෙසේ ද?

මේ පිළිබඳ කතිකාවතක් ගොඩ නඟා අවශ්‍ය මැදිහත් වීම් කිරීම

## මානව ගරුත්වය, භාෂාව හා සංස්කෘතික විවිධත්වය

1. ගම තුළජීවත් වන විවිධ කුල වෘත්තීය මට්ටම්, ආගම් සහ ජාතීන්ට අයත් ජන වර්ගවලට වෙනස් කොට සැලකීමේ ප්‍රවණතා හඳුනා ගැනීම සහ ඒවා වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වීම
2. සර්ව ආගමික වැඩ සටහන්, ආගමික හුවමාරු වැඩ සටහන්, සියලු ආගම්වල හරයන් ඉස්මතු කෙරෙන කතිතාවක් දියත් කිරීම

සංස්කෘතිය යනු මිනිසා නිර්මාණය කළ සම්පත් සාධාරණ ව බෙදා හදා ගෙන තෘප්තිමත් ව ජීවත් වීම ය.සංස්කෘතික ජීවිතයක් අහිමි වීම යනු අතෘප්තියෙන් ජීවත් වීමකි.

1. භාෂා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සංස්කෘතික දායාද ආරක්ෂණය හා ප්‍රවර්ධනය

ඕනෑම ගමක පොදු සංස්කෘතික සම්පත් මෙන් ම ගමට ආවේණික වූ සංස්කෘතික දායාද පවතී. පාරම්පරික කලා පවතී. පාරම්පරික නිර්මාණ ශිල්පීහූ ජීවත් වෙති.ඔවුන්ට තම ශිල්පය අනුව අභිමානයෙන් ජීවත් විය හැකි පරිසරයක් ගොඩ නැඟීම

2. එම ශිල්ප කලා වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ වෘත්තීය මට්ටම නැංවීම සඳහා අදාළ ආයතන ද සම්බන්ධ කර ගෙන ක්‍රියාකාරී වැඩ පිළිවෙළකට යා යුතු ය.
3. ගැමි ජනයාගේ රසවින්දනය නැංවීම සඳහා සාහිත්‍ය කලා, දෘශ්‍ය කලා සහ ජන කලා ආශ්‍රිත සංකථන ක්‍රියාත්මක කළ යුතු ය.
4. පුරවැසි සභාවක් සක්‍රීය ව ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන ලේඛන, පත පොත,සාහිත්‍ය කෘති, සිනමා හා ටෙලි නාට්‍ය ඩී.වී.ඩී. තැටි ඇතුළත් ක්‍රමානුකූල පොත් රාක්කයක් පවත්වා ගෙන යෑමට කටයුතු කිරීම
5. ජංගම පුස්තකාලයක් ආරම්භ කිරීම

## තරුණ නියෝජනය

1. තරුණ ප්‍රජාවට වැදගත් වන ගමට ආවේණික වූ තත්ත්වයන් ද පොදු තත්ත්වය ද සමාලෝචනය කිරීම
2. තරුණයන් විචාරවත් කිරීම
3. තරුණයන්ගේ නිර්මාණශීලී දායකත්වය ගමේ සංවර්ධනය සඳහා යොදා ගැනීම
4. සැලසුම් කිරීමේ දී හා තීන්දු ගැනීමේ දී තරුණ දායකත්වය ලබා ගැනීම
5. තරුණයන්ගේ කුසලතා සහ නව නිපැයුම් සංවර්ධනය කිරීමේ අවස්ථාව ලබා දීම

# පුරවැසි අතිරේකය

6. පොදු වැඩ සටහන්වල දී තරුණ දායකත්වය ලබා ගැනීම
7. ගවේශනය, විමර්ශනය හා දත්ත රැස් කිරීම සඳහා තරුණ කමිටු පිහිටුවීම

## ළමා හා කාන්තා

1. ගමෙහි භූගෝලීය හා සමාජ පරිසරය අනුව විශේෂයෙන් කාන්තාවන්ට, විශේෂ අවශ්‍යතා ඇති අයට සහ දරුවන්ට අවශ්‍ය සේවාවන් හා සුබ සාධන සේවා හඳුනා ගැනීම
2. දරුවන්ට දරුවන්ගේ ජීවිතය ලබා දීම
3. දරුවන් හා කාන්තාවන් ගමෙහි සමාජ සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීම
4. කාන්තා හා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
5. කාන්තාවන්ගේ අත්කම් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම සඳහා කටයුතු කිරීම
6. නොමිලේ සෞඛ්‍ය, පෝෂණ හා මනෝ සෞඛ්‍ය සායන පැවැත්වීමට කටයුතු කිරීම

## පහනින් පහන දැල්වෙන පුරවැසි සභා කතිකාවත

පහන දැල්වෙයි. එහි මන්දාලෝකය අඳුර මැද කුඩා ආලෝක ලපයකි. පහනින් පහන දැල්වෙයි. එවිට එය පහන් වැටකි. කුඩා ආලෝක ලපය අඳුර කපාගෙන පැතිර ගිය එළි වැටකි.

වන ගහනයෙහි අඳුර මැද ජීවත් වූ ආදි මිනිසා, අවුරුදු ලක්‍ෂ ගණනක ඇවෑමෙන් ආලෝකය සොයා යන ගමන ඇරඹුවේ ශිෂ්ටාචාරයේ මාවත හෙළි පෙහෙළි කර ගැනීමෙනි.

එය හුදෙකලා ගමනක් නොව සාමූහික ගමනකි. එහෙයින් මිනිසාට තනි පැවැත්මක් නැත. ජීවිතය සුපුෂ්පිත කරවීමේ ශක්තිය නිපදවන ඉන්ධන සැකසෙනුයේ සාමූහිකත්වයකිනි. සාමූහිකත්වය යනු සියලු දෙන විසම්මුතියකින් තොරව එකම මතයක පිහිටා පූර්ව කොන්දේසි අනුව කටයුතු කිරීම නොවේ.

මිනිස් සමාජය විවිධත්වයෙන් යුක්ත ය. ඔවුහු ගති ගුණ අතින් විවිධ වෙත්. අවයව සහ ඉන්ද්‍රියන් සමාන ව පිහිටිය ද සිරුරේ හැඩයෙන් විවිධ වෙත්. චින්තන විධිය සහ ලෝක දෘෂ්ටිය අතින් විවිධ වෙත්. ජාතිය, භාෂා සහ ඇදහිලි අතින් විවිධ වෙත්.

එසේ වුව ද මේ විවිධත්වය විනිවිද යන පොදු ධර්මතා පවතී. ඉන් ප්‍රධාන වනුයේ මිනිසත්කමයි. අනෙකා ගරු කිරීමයි. සෙනෙහස දැක්වීමයි. අනෙකාගේ වේදනාව සහ සතුට තමන්ගේ වේදනාව සහ සතුට බවට පත්කර ගැනීමයි. අනෙකාගේ සාර්ථකත්වය තමන්ගේ සාර්ථකත්වය සේ පිළිගැනීමයි. එහෙත් විවිධ වූ හේතු මත මෙකී සද්ගුණ සමුදාය හඳුනා ගත නොහැකි පරිදි යටපත් වෙමින් පවතී. එනිසා විරුද්ධ දේශපාලන පාක්ෂිකයකුගේ නිවසට ගල්ගසන, හූ කියන පුරවැසියෙකු නිර්මාණය වේ. අසල්වැසියාට නීත්‍යනුකූලව ලැබිය යුතු දේ වංචනිකව තමන් සතු කර ගන්නා පුරවැසියෙකු බිහි වේ.

තමන්ට සම්ප්‍රදායෙන් හා ව්‍යවස්ථාපිත ආයතනවලින් උරුම විය යුතු බොහෝ දේ නොලැබ අසරණ වූ කල්හි නොපෙනෙන බලවේගවල පිහිට සොයා යමින් කාලය හා ධනය නාස්ති කරගෙන වඩ වඩාත් අසරණ භාවයට පත් ජන බෙලහීන පුරවැසියකු නිර්මාණය වේ. තම ඡන්දයෙන් අනෙකාට බලය පවරා අනෙකා තම අයිතිවාසිකම කඩ කරන විට නිහඬව ඒ තත්ත්වය විඳ දරා ගන්නා පරාජිත පුරවැසියකු නිර්මාණය වේ.

විරුද්ධවාදියෙකු මරා දමන විට කැවුම් කිරිබත් කා ජය ඝෝෂා පවත්වන කුරිරු පුරවැසියෙකු බිහි වේ. මෙබඳු මිනිසුන් බහුල වන සමාජයක් ගමන් කරනුයේ ඉතිහාසයේ ආපස්සට ය.

එය ශිෂ්ටාචාරවත් සමාජයක සිට ම්ලේච්ඡ යුගය කරා යන ගමනකි. එහෙයින් සංවේදී, විචාරවත් පුරවැසියාගේ වගකීම වනුයේ ආපසු ගමන ඉදිරිගමන බවට හැරවීම ය.

සංවේදී, විචාරවත් පුරවැසියා අඳුර මැද දැල්වෙන පහනක් වැන්න. පහනින් පහන දැල්වීම යනු පුරවැසියකු තම හදවතෙහි දැල්වෙන ප්‍රදීපයෙන් තවත් පුරවැසියකුගේ හදවත දැල්වීම ය. මෙසේ පහනින් පහන දැල්වී, පුරවැසියාගෙන් පුරවැසියාට ප්‍රදීපාලෝකය විහිදී එකම එක පහන් වැටක් බිහි වෙයි. පුරවැසි සභාවක් නිර්මාණය වෙයි.

පුරවැසි සභාව යනු ගැමි ප්‍රජාවගේ ජීවන පරිසරයෙහි අඳුර විනිවිද යන ප්‍රදීපා ලෝකයයි. විවිධ මත දරන විවිධ වෘත්තීන්හි නියැලී සියලු සමාජ ධාරා එක් සංහිඳක් යට කිරි උතුරන පුන්‍ය භූමියයි. තමන්ට

# පුරවැසි අතිරේකය

හිමි අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා අවබෝධයෙන් හා විචාරයෙන් කටයුතු කරන ක්‍රියාශීලී පුරවැසියෙකු ප්‍රතිනිර්මාණය කරන වේදිකාවයි. තමන්ගෙන් පවුලට, ගමට, රටට හා මුළු මහත් මානව සමාජයට ඉටුවිය යුතු වගකීම් පිළිබඳ අවධියෙන් පසුවන හා ඒ අනුව කටයුතු කරන වැටහෙන නුවණින් කටයුතු කරන මිනිස් පවුරයි.

## පුරවැසි සභා ව්‍යුහය

නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය හා සමාජ සාධාරණත්වය ස්ථාපිත කිරීමේ දී පාලකයාගේ පාර්ශවය මෙන් ම පාලකයාගේ පාර්ශවයද එක සේ වැදගත් ය. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ නාමයෙන් බොහෝ විට සිදුකරනුයේ පාලකයා තමා පිළිබඳ තීන්දු ගැනීමේ බලය හා අයිතිය පාලකයාට පවරා නිහඬ වීමයි. මීට වෙනස් අයුරින් ක්‍රියා කරන සමාජයක්ද හඳුනාගත හැකි ය.

ඉපැරණි භාරතයෙහි පැවති ලිච්ඡවි රජවරුන්ගේ සම්ප්‍රදාය වූයේ සාමූහිකව රැස්ව විසිර යාම හා එම තීන්දු ක්‍රියාත්මක කිරීම ය.

අතීත සම්ප්‍රදායන්ගේ අභාසයෙන් නිර්මිත ඉන්දියාවේ පංචායත් සභා යනු පුරවැසි නියෝජනයෙහි වැදගත්කම අර්ථවත් කෙරෙන ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ පැරණි ගම් සභාව ද, පුරවැසි සහභාගිත්වයෙන් තීන්දු ගන්නා කේන්ද්‍රස්ථානයකි.

ගම යනු රටක පාලන ව්‍යුහය තුළ කුඩා ම පාලන ඒකකයයි. එහෙත් ගමට බලපාන තීන්දු ගැනීමේ දී පුරවැසියාගේ අදහස් හා යෝජනා වෙනුවට ක්‍රියාත්මක වනුයේ ඉහළ සිට පහළට කෙරුණු සැලසුම් ය.

පුරවැසි සභාවක් ක්‍රියාත්මක වන විට එම තත්ත්වය වෙනස් වෙයි. ගමට සේවා සපයෙන රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය දුබල වූ විට එයින් ලැබිය යුතු සේවාව පුරවැසියාට නොලැබී යයි. ස්වේච්ඡා සංවිධානවල ක්‍රියාකාරීත්වය ද එසේ ය. ගමෙයි පවතින භූගෝලීය සහ සාමාජීය පසුබිම නොසලකා හරිමින් ක්‍රියාත්මක වන කිසිදු වැඩසටහනකින් ගමට නිසි සේවාවක් ලැබෙන්නේ නැත.

එහෙත් ගම තුළ ව්‍යවස්ථානුකූලව ක්‍රියාත්මක වන සංස්ථාපිත ආයතන මෙන්ම ස්වේච්ඡා සංවිධාන ද ගමට අනන්‍ය වූ සංවර්ධිත ආකෘතියක් අනුව කටයුතු කරන්නේ තම ගම නමැති ඒකකයෙහි භෞතිකගත අභෞතික ජීවන මට්ටම වර්ධනය කළ හැකි ය. පුරවැසි සභාවක ක්‍රියාකාරීත්වය වැදගත් වන්නේ එවිට ය.

පුරවැසි සභාව, විවිධ පුද්ගලයන්ගෙන් ආභාෂය ලබා ඇතත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට නව්‍ය වූ අත්දැකීමකි. පුරවැසි සභාව ක්‍රියාත්මක කරනුයේ නිශ්චිත ග්‍රාමසේවා වසමක් තුළ ය. ගමෙහි රාජ්‍ය ආයතන, ස්වේච්ඡා සංවිධානවල නියෝජනය එහි තිබේ. ගමෙහි උද්‍යෝගිමත් තරුණයෝ, කාන්තාවෝ ගැමි බුද්ධිමත්හු, කලාකරුවෝ සහ නව නිර්මාණ ශිල්පියෝ පුරවැසි සභාව නියෝජනය කරති.

ගමෙහි සංවර්ධන සැලැස්ම සකස්කර පළාත් පාලන ආයතනවලට හා රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙනුයේ පුරවැසි සභාව විසිනි. රාජ්‍ය ආයතන මගින් ගමට ලැබිය යුතු සේවා පිළිබඳ අධීක්ෂණය හා අඩුපාඩු මගහරවා ගැනීමට මැදිහත්වීම පුරවැසි සභාව මගින් ඉටුවේ.

ගමට ආවේණික වූ ශීර්ෂ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය මැදිහත් වීම පුරවැසි සභාවෙන් සිදු කෙරේ. ගමෙහි පරිසර සංරක්ෂණය, ගමට ආවේණික සංස්කෘතිකාංග සංරක්ෂණය හා ප්‍රවර්ධනය කිරීමේ මැදිහත්වීම පුරවැසි සභාව මගින් ඉටු කරනු ඇත.

පරිසර හිතකාමී ජීවන පිළිවෙතක් ඇති කර ගනිමින් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගත කිරීමේ මගපෙන්වීම පුරවැසි සභාවේ වගකීමකි. මිනිසා, ගහකොළ, සතා සීපාවාගේ පැවැත්ම මාරාන්තික තර්ජනයකට ලක්කර තිබෙන කෘෂි රසායන භාවිතය වෙනුවට කාබනික ගොවිතැන හා ඒකාබද්ධ ජෛව පාලනය කෙරෙහි පුරවැසියන් උනන්දු කරවීම පුරවැසි සභාවේ එක් අරමුණකි. පුරවැසි සභාව ගමට දැනුමේ හා සාහිත්‍ය කලා රසවින්දනයේ කේන්ද්‍රස්ථානයක් වනු ඇත.



# පුරවැසි අතිරේකය

ද්විභාෂා වැඩසටහනෙහි තිරසාරත්වය උදෙසා එහි සිව්වන අදියර යටතේ පුරවැසි සභා පිහිටුවීමේ අවස්ථාවට සහභාගිවෙමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ විධායක අධ්‍යක්ෂ **ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු** මහතා මෙසේ පැවසීය.

## ආණ්ඩු වෙනස් වුණත් පුරවැසි බලය වෙනස් නොවේ



පුරවැසි සභාවක නියෝජනය විය යුත්තේ පුරවැසි අපේක්ෂාවයි. පුරවැසි දේශපාලනයයි.පුරවැසි සභාව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථාකරන ස්ථානයකි.ප්‍රජාතන්ත්‍රවාදය පුරවැසියාගේ ප්‍රාර්ථනය විය යුතුය.
ප්‍රජාතන්ත්‍රවාදී පාලනය,වසර 5කට වරක් ලොතරැයි දිනුමක් ඇදීම නොවේ.එය සකස් වී ඇත්තේ පුරවැසි ක්‍රියාකාරිත්වය මන්දගාමී වීම හේතුවෙනි.ප්‍රජාවේ ඉතාම කාර්යක්ෂම කණ්ඩායම පුරවැසි සභාවේ නියෝජනය වූ විට මේ තත්වය වෙනස් වේ.
ආණ්ඩුව ප්‍රාදේශීය මට්ටමෙන් ක්‍රියාත්මක කරන වැඩ සටහන් රැසකි.මේවායෙහි මුදල් පරිහරණය සිදු වන්නේ කවරාකාරයෙන්ද?එය පරිහරණය කරන අයුරු පුරවැසියාගේ පරීක්ෂාවට ලක් විය යුතුය.
උදාහරණයක් වශයෙන් ගත්විට ඉන්දියාවේ තොරතුරු ලබා ගැනීමේ අයිතිය ප්‍රාදේශීය මට්ටමෙන් පංචායත් ක්‍රමය ඔස්සේ තහවුරු කර ඇත.පංචායත් සභා තුළ මේ අයිතිය වෙන වෙනම තහවුරුකර ඇති නිසා දූෂණ හා වංචාවලට බාධා පැමිණ තිබේ.
දකුණු ආසියාවේ සියලුම රටවල් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පණත් සම්මත කරගෙන ඇත. මේ පණත්වල යම් යම් වෙනස්කම් ඇත.එහෙත් එම ප්‍රතිපත්තිය වැදගත්ය.තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිබඳ පණත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් ප්‍රතික්ෂේප විය.
මේ නිසා වංචාවට දූෂණයට මග විවර වී ඇත.ලංකාවේ පාරවල් කාපට් කිරීමේ දී කිලෝ මීටරයකට යන වියදම් පාරෙන් පාරට වෙනස් ය.
එහෙත් එය පරීක්ෂා කිරීමේ හැකියාවක් පුරවැසියාට නැත.දේශපාලනය වෙනස් වෙයි.ආණ්ඩු වෙනස් වෙයි.එහෙත් පුරවැසි සමාජයක් නිර්මාණය කළහොත් පුරවැසි බලය වෙනස් නොවෙයි.
ප්‍රජාව සමඟ කතාකරමින් ප්‍රජාවගේ අවශ්‍යතා තේරුම් ගනිමින් කරන කටයුතු සඳහා පුරවැසි සභාව වැදගත් වේ.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් ඒකකයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක **ලයනල් ගුරුගේ** මහතා දැක්වූ අදහස්....

## පුරවැසි ක්‍රියාකාරිත්වයක අරමුණ මනුස්සකමයි



පුරවැසියා සවිබල ගැන්වීම කාලීන සමාජ අවශ්‍යතාවයක්. එය ව්‍යාපෘතියක් ලෙස සැලකිය යුතු නැහැ. එමෙන් ම එය රාජ්‍ය නොවන සංවිධානයක් යටතේ ක්‍රියාත්මක වන සමිතියක් ද නොවේ. එය ව්‍යාපාතියක සීමාවෙන් ඔබ්බට විහිදුණු ක්‍රියාවලියකි. එනිසා මෙය ක්‍රියාත්මක කරවන්නන් හැටියට රාජ්‍ය නොවන සංවිධාන හා ව්‍යාපෘති මානසිකත්වයෙන් ඉවත්විය යුතුය. මුදල් මගින් පමණක් පුරවැසි ක්‍රියාකාරිත්වය සාර්ථක කරගත නොහැකියි. එය සීමිත කණ්ඩායමකට කළ හැකි දෙයක් ද නොවේ. පුරවැසි ක්‍රියාකාරිත්වයක අරමුණ විය යුත්තේ මනුස්සකම අගයන සමාජයකි. එකිනෙකාට පිරිනමන ගරුත්වය එහි ප්‍රතිඵලයයි. මනුස්සකම මතුකර ගැනීමට පුරවැසි සභාව අසමත් වන්නේ නම් මේ උත්සාහය අපතේ යනු ඇත. එබැවින් අපි මිනිසත්කමින් පිරිපුන් පුරවැසි ක්‍රියාකාරිත්වයක් අරඹමු.

භාෂා සමතාව මාධ්‍ය ඇසින්

# දෙමළ පාසල්වලට තවමත් දෙමළ භාෂාවෙන් චක්‍රලේඛ නෑ

**භානාතංගම්**
**වීරකේසරී - 2014.03.23**


கல்வி அமைச்சின் சுற்றறிக்கைகள்
சிங்கள மொழியில் மட்டும் வெளியீடு

උතුරු හා නැගෙනහිර පළාත්වලට පරිබාහිරව දෙමළ වැසියන් බහුලව ජීවත් වන පළාත ලෙස මධ්‍යම පළාත සලකනු ලැබේ. මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්ක ඊට ඇතුළත් ය. ඉන් 52%ක් දෙමළ ජනතාව ජීවත් වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ වන අතර මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල දෙමළ ජනතාව ජීවත් වෙති. තවද මධ්‍යම පළාත තුළ දෙමළ මාධ්‍ය පාසල් පිහිටා ඇති නමුත් බොහෝ දුරට දෙමළ මාධ්‍ය පාසල්වලට ලැබෙන චක්‍රලේඛන සිංහල මාධ්‍යයෙන් පමණක් ලැබෙන බවට චෝදනා කෙරේ.

"දෙමළ භාෂාවට නිසි තැන ලබා දිය යුතුය" අනුව යමින් වර්ෂ 1970 දී එවකට අධ්‍යාපන අමාත්‍යවරයා වූ දිවංගත බදියුදීන් මහුමූද් මහතා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙමළ අංශය පිහිටුවනු ලැබී ය. එහි ප්‍රථම අධ්‍යක්ෂවරයා වශයෙන් ලච්චුමන අයියර් මහතා පත් කෙරිණි. මුස්ලිම් අංශයට සමීම් සහ වතුකරයේ පාසල් සඳහා ඉරා ශිවලිංගම් යන මහත්වරු අධ්‍යක්ෂවරුන් ලෙස පත් කෙරිණි.

හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ පාලන සමයේ දී 1988 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පරිදි රටේ පරිපාලන භාෂාවන් ලෙස සිංහල සහ දෙමළ භාෂාවන් ද සම්බන්ධීකරණ භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාව ද පිළිගැනිණි. උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ භාෂාවෙන් පරිපාලන කටයුතු සිදු කළ හැකි වන අතර 25%ක් දෙමළ ජනතාව ජීවත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සිංහල භාෂාවට අමතරව දෙමළ භාෂාවෙන්ද පරිපාලන කටයුතු සිදු කළ යුතු බව සඳහන් වේ.

උතුරු හා නැගෙනහිර පළාත්වලට පරිබාහිරව දෙමළ ජනතාව වැඩි වශයෙන් ජීවත් වන්නේ මධ්‍යම පළාතේ වන අතර එහි දෙමළ මාධ්‍ය පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටා ඇත. එම නිසා සිංහල භාෂාවෙන් පමණක් චක්‍රලේඛන නිකුත් කිරීම තුළින් අපට තිබෙන භාෂා අයිතිය උල්ලංඝණය වන බව අප මතක තබා ගත යුතු ය.

# භාෂා පරිවර්තකයන්ගේ හිඟයක්

**භානාතංගම්**
**වීරකේසරී - 2014.03.23**


'ஏனைய மொழிகளைக் கற்பதன் மூலம்
இனங்களுக்கிடையில் புரிதல் ஏற்படும்'

தென்பிராந்திய நிருபர்

மொழிகள் வளம் பெற்றால் இனங்களுக்கிடையிலான முரண்பாடுகள் தணிந்து விடும் எனத் தெரிவித்துள்ள மௌலவி இஸ்லாஸ் ஏனைய மொழிகளை கற்பதன் மூலம் ஒரு இனம் மற்றைய இனம் பற்றிய புரிந்துணர்வுகளைப் பெற்றுக் கொள்ளும் எனவும் தெரிவித்தார்.

முஸ்லிம் - சிங்கள இன மக்களுக்கிடையிலான நட்புறவுக் கூட்டம் அண்மையில் திக்வல்ல மின்ஹாத் தேசியக் கல்லூரியில் இடம்பெற்றபோது அதில் பிரதம அதிதியாக கலந்து கொண்டு உரையாற்றும் போதே அவர் இவ்வாறு தெரிவித்தார்.

அடிப்படைக் காரணமும் அதுவேயாகும். இலங்கையிலுள்ள அனைவரும் மும் மொழிகளையும் கற்க வேண்டும்.

மொழிகள் உறுதி பெற்று விரிவடையும் போது ஒரு இனம் மற்றைய இனத்தைப் பற்றிய புரிந்துணர்வுகள் ஏற்பட வழி ஏற்பட்டு விடுகிறது. அது ஏற்பட்டால் இனத்துவேஷம் ஏற்பட இடமே இல்லை.

இன்று சிலர் மதஸ்தாபனங்களை நாசப்படுத்துவதும் ஏனைய சமூகத்தவர்களுடன் முறுகலை ஏற்படுத்திக்கொள்வதற்கும் அர்த்தமே இல்லை. ஒரு சமூகத்தைப் பற்றி மறு சமூகம் புரிந்துணர்வோடு செயற்பட்டால் இந்த ... ஏற்பட

රජයේ දෙපාර්තමේන්තුවල භාෂාපරිවර්තන කටයුතු සිදු කිරීම සඳහා නිලධාරීන් පත් කර ගත හැකි යැයි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ චක්‍රලේඛනයේ දක්වා ඇති අතර ඒ වෙනුවෙන් ඔවුන්ට ගෙවීම් සිදු කිරීමට ද බලයක් තිබේ. නමුත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අදාළ භාෂා පරිවර්තකයන් පත් නොකර නිකරුනේ කාලය ගත කිරීම හේතුවෙන් මෙම පාසල්වලට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පෑමට සිදුව තිබේ.

විදුහල්පතිවරුන් වෙනුවෙන් පවත්වනු ලබන රැස්වීම්වලදී එහි පැමිණෙන බහුතර ජාතීන්ට අයත් නිලධාරීන් තමන් විසින් සිදු කරනු ලබන දේශන දෙමළ භාෂාවෙන් පැහැදිලි කරන ලෙසට විදුහල්පතිවරුන්ගෙන් ඉල්ලා සිටින බව පැවසේ. විදුහල්පතිවරුන් වැදගත් වෘත්තියක නිරතව සිටින්නන් වන අතර ඒක ඒක පුද්ගලයින්ගේ කථන පරිවර්තකයින් නොවන බව විදුහල්පතිවරු ඔවුනට ඒත්තු ගැන්විය යුතු ය. මේ අවස්ථාවේදී පෙර දවසක සිදුවූ සිද්ධියක් සිහිපත් කළ යුතු ය. 1990 ගණන්වල හැටන් අධ්‍යාපන කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර දැරූ බහුතර ජාතිකයකු විසින් විදුහල්පති රැස්වීමකදී ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර අධ්‍යක්ෂවරයෙකු කැඳවා තමන්ගේ කතාව දෙමළ භාෂාවට පරිවර්තනය කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ දී එය තමාගේ රාජකාරියක් නොවන බව පවසා ඔහු විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබ ඇත. අධ්‍යක්ෂවරයාගේ නියෝගයට පිටුපෑම පිළිබඳව මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අදාළ ප්‍රාථමික විෂයභාර අධ්‍යක්ෂවරයාගෙන් විමසූ විට ඔහු පෙන්වා දී ඇත්තේ භාෂා පරිවර්තකයකු පත් කළ හැකි බවත් එසේ පරිවර්තනය කරනු ලබන වචනයකට නිශ්චිත ගණනක් ගෙවීම් කිරීමට බලයක් තිබෙන බවත් ය. ඒ අනුව ඉන්ද්‍රානි ජයරත්නම් නමැති ගුරුවරිය දවසේ වරුවක කාලයකට නිදහස් කර හැටන් අධ්‍යාපන කලාපයේ භාෂා පරිවර්තකයකු ලෙස පත් කෙරිණි. මෙවැනි ක්‍රියාමාර්ග ගනු ලබන්නේ නම් ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් මුහුණපාන අපහසුතාවයන් මඟහරවා ගත හැකි ය.

# භාෂා පිළිවෙත මාධ්‍ය ඇසින්

## නුවරඑළියෙත් දෙමළ බසට නිසි තැන නෑ

**භානාතංගම්**
**වීරකේසරී - 2014.03.23**

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ 58%ක් දෙමළ ජනතාව ජීවත් වන අතර දෙමළ මාධ්‍ය පාසල් විශාල සංඛ්‍යාවක් ද පිහිටා තිබේ. නුවරඑළිය අධ්‍යාපන කලාපයේ දෙමළ මාධ්‍ය පාසල් 125ක් ද, හැටන් අධ්‍යාපන කලාපයේ පාසල් 108ක් ද, හඟුරන්කෙත අධ්‍යාපන කලාපයේ පාසල් 12ක් ද, වලපනේ අධ්‍යාපන කලාපයේ පාසල් 30ක් ද, කොත්මලේ අධ්‍යාපන කලාපයේ පාසල් 46ක් ද පිහිටා තිබේ. මෙහි ලක්ෂයකටත් අධික සිසුන් අධ්‍යාපනය ලබන අතර හාරසියයක් පමණ විදුහල්පතිවරුන් ද, පන්දහසකටත් අධික ගුරු පිරිසක් ද, අධ්‍යාපන අධ්‍යක්ෂවරු තිස්නවදෙනෙක් සහ ගුරු උපදේශකවරුන් 100ක් ද සේවය කරති.

නමුත් විදුහල්පතිවරුන් සඳහා පැවැත්වෙන රැස්වීම් හා සම්මන්ත්‍රණ බොහෝ විට සිංහල භාෂාවෙන් පවත්වන ලබන බවත්, කලාතුරකින් සමහර ස්ථානවල පමණක් නාමිකව භාෂා පරිවර්තනය සිදු කරන බවත් පැවසේ. එම නිසා රැස්වීම් අවස්ථාවන්වල ඉදිරිපත් කරනු ලබන කරුණු පිළිබඳව විදුහල්පතිවරුන්ට සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීම අපහසු වී තිබේ. තවද පරිවර්තනය කළ යුතු යැයි ඉල්ලීම් ඉදිරිපත් කළ ද සරල සිංහල භාෂාවෙන් කතා කිරීම නිසා ඕනෑම කෙනෙකුට අවබෝධ කර ගත හැකි යැයි පවසා කර අරිනු බව පැවසේ. මෙහි දී මද වශයෙන් සිංහල භාෂාව දන්නා සමහර ‘දෙමළ පඬිවරු’ විසින් පරිවර්තන කටයුතු සිදු කරනු ලබන අවස්ථාවලදී කාලය කා දමනු ලබන බව ද පැවසේ.

තවද අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කරනු ලබන සමහර චක්‍රලේඛන සිංහල හා දෙමළ භාෂාවෙන් ලැබුණ ද එවැනි බොහෝ චක්‍රලේඛන හුදෙක් සිංහල භාෂාවෙන් පමණක් ලැබෙන බව කියවේ. මේ හේතුවෙන් සිංහල නොදන්නා දෙමළ විදුහල්පතිවරුන්ට තවත් කෙනෙකුගේ සහාය පැතීමට සිදුව ඇති බවට සහ භාෂාපරිවර්තනය වෙනුවෙන් මුදල් වැය කිරීමට සිදුව ඇති බවට විදුහල්පතිවරු සිය කනස්සල්ල පළ කරති. එම නිසා ලැබෙන වැදගත් චක්‍රලේඛනවලට නිසි කලට පිළිතුරු යැවීමට නොහැකි තත්ත්වයක් මතුවන බවත් එය හැරුණු කොට තම පාසල්වලට ලැබිය යුතු සම්පත් නොලැබී යෑමේ තත්ත්වයක් මතු වන බවත් ඔවුහු ප්‍රකාශ කරති.


தொழிற்பயிற்சி நிலையங்களில் தமிழ்மொழி
மூலம் பயிற்சி வகுப்புகள் நடத்த வேண்டும்

## දෙමළ පාසල් හා දෙමළ භාෂාව නොසලකා හැරලා


**භානාතංගම්**
**වීරකේසරී - 2014.03.23**

නුවරඑළිය අධ්‍යාපන කලාපයේ බහුතර වශයෙන් දෙමළ මාධ්‍ය පාසල් පිහිටා තිබෙන නමුත් බහුතර ජාතිකයකු අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන අතර අතිරේක අධ්‍යක්ෂ වශයෙන් එස්.බී. රාජරත්නම් නමැති අය සේවය කරන්නේ ය. හැටන් අධ්‍යාපන කලාපයේ ප්‍රථම ඉන්දිය සම්භවයක් ඇති දෙමළ ජාතිකයකු වන එම්.රෙංගරාජ් නමැත්තා පත්වීම් ලැබ දෙවතාවක් එම තනතුර දැරුවේ ය. දේශපාලකයන් තෘප්තිමත් කිරීමට අසමත් වූ බැවින් ඔහු ස්ථාන මාරු කෙරිණි. ඔහුගෙන් පසු රාජලිංගම් මහත්මිය එම තනතුරෙහි සේවය කළා ය. ඇය විශ්‍රාම යෑමෙන් අනතුරුව සී. කනපති මහත්මිය පත් කරන ලද අතර ඇය පසුගිය මාසයේදී හදිසි අනතුරකින් මිය ගියා ය. ඇයගේ පුරප්පාඩුව පිරවීම සඳහා බහුතර ජාතියට අයත් කාන්තාවක් පත් කරන ලදී.

මෙලෙස හැටන් අධ්‍යාපන කලාපයේ අධ්‍යක්ෂ තනතුරක් පුරප්පාඩු වූ විට එවකට දෙමළ අධ්‍යාපන අමාත්‍යවරයා ලෙස දෙමළ අයෙකු සිටි නමුත් ඔහු විසින් නිසි පියවර නොගැණුනු බැවින් නැවත හැටන් අධ්‍යාපන කලාපයට දෙමළ ජාතිකයෙකු පත්වේද යන්න පිළිබඳව ප්‍රශ්නයක් මතු වී තිබේ. හැටන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරිය ලෙස සේවය කරන තැනැත්තිය තව දින කිහිපයකින් විශ්‍රාම යෑමට නියමිත බැවින් වහාම දෙමළ අයෙකු පත්කිරීමට පියවර ගැනීමට අපොහොසත් වුවහොත් අනාගතයේ දී දෙමළ අයකු පත් කරනු ලැබීමට තිබෙන අවස්ථාව අහිමි වනු ඇත.

තවද, මධ්‍යම පළාත් සභාව පිහිටවනු ලැබූ දා පටන් අඛණ්ඩව පැවති දෙමළ අධ්‍යාපන අමාත්‍යාංශය ඉකුත් වසරේ පැවති මධ්‍යම පළාත් සභා ඡන්දයෙන් අනතුරුව අහිමි විය. යම්කිසි දේක අගය දැනෙන්නේ එය අපට අහිමි වූ විටකදී ය.

මධ්‍යම පළාත් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් මහ ඇමති සරත් ඒකනායක මහතා කටයුතු කරයි. ඔහුගේ පාලන කාලය තුළ දෙමළ පාසල් සහ දෙමළ භාෂාව නොසලකා හරිනු ලැබීමේ ඛේදවාචකය තවදුරටත් සිදු නොවිය යුතු ය. පළාතේ මහ ඇමතිවරයා වශයෙන් ඔහු දෙමළ භාෂාවට නිසි තැන ලබා දීමට ඉදිරිපත් විය යුතු ය. ඒ සඳහා වන අවශ්‍යතාවය හා පීඩනය දෙමළ දේශපාලකයින් ඇති කළ යුතු ය. මධ්‍යම පළාත් සභාවේ දෙමළ කතා කරන මන්ත්‍රීවරුන් දාහත් දෙනෙක් සිටින අතර නුවරඑළිය දිස්ත්‍රික්කයේ කැබිනට් ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තුන්දෙනෙක් සහ ප්‍රාදේශීය සභා සභාපතිවරුන් දෙදෙනෙක් හා නගර සභා සභාපතිවරයෙක් යනාදී වශයෙන් දෙමළ දේශපාලන නියෝජිතයින් සිටිති. අපගේ භාෂා අයිතීන් සුරක්ෂිත කිරීම වෙනුවෙන් සියලු දෙනා එක් වී ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ.


Virakesari Tuesday, March 18, 2014 ৭০৭

தமிழ் மொழி தெரிந்த கிராம
சேவகர்களுக்கு தட்டுப்பாடு

(உடப்பு நிருபர்)

புத்தளம் மாவட்டத்தில் புதியதாக கிராம சேவையாளர்களாக நியமிக்கப்பட்டவர்களில் 167 பேரில் சிறுபான்மையைச் சேர்ந்தவர்களில் முஸ்லிம்கள் 7 பேரும் ஒரு தமிழருமே நியமிக்கப்பட்டுள்ளார்கள். இம்மாவட்டத்தில் உள்ள பல தமிழ் கிராமங்களில் தமிழ் மொழி தெரிந்த கிராம சேவையாளர்களுக்கு தட்டுப்பாடு நிலவி வருகின்றது. ஆனால் புதியதாக தெரிவு செய்யப்பட்ட கிராம சேவையாளர் நியமனத்தில் தமிழர்கள் புறக்கணிக்கப்பட்டுள்ளதாக விசனம் தெரிவிக்கப்படுகின்றது.

இந்த கிராம சேவையாளர் பதவிக்கு பல தமிழர்கள் போட்டி பரீட்சையில், கலந்து கொண்டு தகுதிகள் பெற்றிருந்தும் கூட ஒரே ஒரு தமிழர் மட்டும் நியமிக்கப்பட்டுள் ... என்பது இம்மாவட்டத்தில் தமிழர்கள் இல்லையா என்று கூட கேள்வி எழுப்பப் ...டுகின்றது. இம்மாவட்டத்தில் நியமிக்கப் ...ட்டுள்ள தொண்டர் ஆசிரியர்களுக்கான ...யமனம், உதவி முகாமையாளர்களுக்கான ...யமனம், பட்டதாரி ஆசிரியர் நியமனம், ...பிவிருத்தி உத்தியோகத்தர்கள் போன்ற ...னனோரன்ன பதவிகளுக்குக் கூட தமிழர் ...ளின் நியமனத்தில் பக்கச்சார்பாக நடாத்தப் ...ட்டு வருகின்றது.

# භාෂා පිළිවෙත මාධ්‍ය ඇසින්

## සිංහල නොදත් නිලධාරීන්ගේ දෙමළ මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව නිම වේ

**වීරකේසරී - 2014 මාර්තු 04**

මඩකලපු කල්ලඩිය පොලිස් පුහුණු පාසලේ දෙමළ මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම වී ඇත.

මොවුන් දෙමළ මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව නිම කිරීම වෙනුවෙන් පවත්වන ලද උත්සවය මඩකලපු කල්ලඩිය පොලිස් පුහුණු පාසලේ දී පැවැත්විණි.

7 වැනි අදියර යටතේ දෙමළ භාෂා පාඨමාලාව සම්පූර්ණ කර පිටව යෑම නිමිති කර ගෙන පැවැත්වූ උත්සවයට මඩකලපු සහ අම්පාර යන දිස්ත්‍රික්කයන්හි නියෝජ්‍ය පොලිස්පති ඉන්දු කරුණාරත්න සහ මඩකලපු සහකාර පොලිස් අධිකාරී හක්මණ අනුරුද්ධ, මඩකලපු කල්ලඩි පොලිස් අභ්‍යාස විදුහල් භාර නිලධාරී කේ.දිනේෂ් කුමාර, දෙමළ මාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව භාර නිලධාරී ඒ. ජේරින්බරාසා, කාත්තංකුඩි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති පො.ප.අජිත් ප්‍රසන්න ඇතුළු පොලිස් නිලධාරීන් සහ දෙමළ භාෂාව සම්පූර්ණ කළ පොලිස් නිලධාරීහු ඊට සහභාගි වූහ.

මේ අවස්ථාවට 7 වැනි අදියර යටතේ දෙමළ භාෂා පාඨමාලාව සම්පූර්ණ කළ පොලිස් නිලධාරීහු 109 දෙනෙක් පාඨමාලාව නිම කර පිටව ගියහ. මෙම උත්සවයේදී දෙමළ භාෂාව සම්පූර්ණ කළ පොලිස් නිලධාරීන්ගේ කලා අංගයන්ද පැවැත්විණි. දෙමළ භාෂාව හදාරා පිටව යන සිංහල පොලිස් නිලධාරීන් 114 දෙනෙක් අතරින් 8 දෙනෙක් පොලිස් අධිකාරීවරු වෙති.


භාෂා දෙකෙන් හැඳුනුම්පත්
නිකුත් කිරීමට බාධා
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියත් කොට උඩ!

## දෙමළ බසිනුත් මේ උපදෙස් දෙන්න

**ලක්බිම - 2014 මැය 12**
**ගයාත්‍රී ගීගනආරච්චි**

බොරැල්ල ,බත්තරමුල්ල මාර්ගයේ පාලම අලුත්වැඩියා කිරීමේ මාර්ග උපදෙස් පුවරු පිළිබඳ දැන්වීම්වල අදාල උපදෙස් භාෂා තුනෙන්ම යොදන ලෙස ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා මාර්ග සංවර්ධන අධිකාරියට සහ අදාළ කොන්ත්‍රාත් සමාගමට දැනුම් දී තිබේ.

අදාළ උපදෙස් සහිත දැන්වීම් වල දෙමළ භාෂාව යොදා නොතිබීම පිළිබඳව ලැබී ඇති පැමිණිලි පරීක්ෂා කිරීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් මෙම දැනුම්දීම කර ඇත. මාර්ග යක් හෝ පාලමක් ප්‍රතිසංස්කරණය කිරීමේ දී එම මාර්ගයේ ගමන් ගන්නා පදිකයන්ට හා වාහන ධාවකයන්ට උපදෙස් ලබා දීම සඳහා ආරක්ෂක නිවේදන ඇතුළත් පුවරු සවි කිරීම පිළිගත් මාර්ග නීතියක් වේ.


රාජ්‍ය භාෂා
ප්‍රතිපත්තිය කඩන
ඕනෑම අයකුට
එරෙහිව පියවර
ගන්නවා

ඇමැති වාසුදේව

▶ අනුර ප්‍රේමලාල්

රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කඩ කරන ඕනෑම අයකුට එරෙහිව පවතින නීති මගින් කටයුතු කරන බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා ඇමැති වාසුදේව නානායක්කාර මහතා ප්‍රකාශ කරයි.

මේ සම්බන්ධයෙන් 'දිනමිණ' සිදුකළ විමසුමකදී අදහස් දැක්වූ ඇමැති වාසුදේව නානායක්කාර මහතා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කඩකරන පුද්ගලයකු හෝ ආයතනයක් සම්බන්ධයෙන් තම අමාත්‍යාංශය වෙත පැමිණිලි කළ හැකි බව පෙන්වා දුන්නේය.

4 වැනි පිටුවට

## පස්ගොඩ දෙමළ ජනතාවට නිවාස පහසුකම් ලබාදෙන්න

**ලංකාදීප 2014-මැයි-21**

**දුසන්ත යග්ගහවිට**

**ඌරුබොක්ක මාතර**

මාවරල, කොබෝමැල්ල, කිරිලිපන ප්‍රදේශවල තේවතු ආශ්‍රිතව ජීවත්වන දෙමළ ජනතාව වසර ගණනාවක් වාසය කරන්නේ ටකරං සෙවිලි කර ඇති ඉතාමත් කුඩා නිවාසවල ය. ඔවුන්ගේ දරුවන්ට තම අධ්‍යාපන කටයුතු කරගෙන යාමද අසීරු ය.

පස්ගොඩ ප්‍රාදේශීය සභාබල ප්‍රදේශයේ ජීවත්වන දෙමළ ජනතාවට ජීවත් වීමට සුදුසු නිවාස ක්‍රමයක් ලබා දීමට කටයුතු කරන ලෙස අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිමි.

News

# බේරුවල භාෂා සමිති ඇරඹේ

සටහන
ධම්මික එස්. කුමාර

ලංකාවේ ඇති ද්වීභාෂා ප්‍රදේශීය ලේකම් අතරින් කලුතර දිස්ත්‍රික්කයේ ඇත්තේ එකම ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකි. ඒ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. මේ වන විට මීට අනුබද්ධව ග්‍රාමසේවා වසම් රැසක භාෂා සමිති ගොඩනගා තිබේ. මැයි මාසයේ සිට ආරම්භ කරන ලද මෙම භාෂා සමිති පිහිටුවීමේ වැඩසටහන ඉදිරියේ දී තවදුරටත් ව්‍යාප්ත කිරීමට නියමිත ය.

බේරුවල ප්‍රදේශයෙහි මෙම භාෂා සමිති පිහිටුවීමේ විශේෂ වැදගත් කම වන්නේ මෙම ප්‍රදේශයේ පවතින භාෂා විවිධත්වය මෙන්ම සංස්කෘතික විවිධත්වය ද හේතුවෙනි.

සිංහල හා මුස්ලිම් විශාල ජනගහනයක් මෙම ප්‍රදේශයෙහි ජීවත් වන බැවින් ඔවුන් අතර ජාතිභේදවාදී හැඟීම් කුළුගන්වා ගැටුම්කාරී තත්ත්වයක් ඇතිකිරීමට සමහර අන්තවාදී බලවේග වරින්වර උත්සාහ කර තිබේ.

එවැනි පරිසරයක් තුළ මෙම ප්‍රදේශයේ ද්විභාෂා සමිති පිහිටුවීමේ වැදගත්කම වන්නේ එමගින් මෙබඳු ගැටුම්කාරී තත්ත්වයන් අවම කළ හැකි බැවිනි. මෙම භාෂා සංගම් ද්විභාෂා අයිතීන් පිළිබඳ හැරුණු විට සංස්කෘතික විවිධත්වය හා ජාතීන් අතර එකමුතුභාවය වෙනුවෙන් ද පෙනී සිටී.

මේ සඳහා සමිති ගොඩනැගෙන ප්‍රදේශ වන්නේ මාලේවන්ගොඩ, පාදාගොඩ, කාලවිල, බුබුලලන්ද, මරක්කලාවත්ත, අඹේපිටිය, හල්කඳවිල, ගනේගම ගොවින්දවත්ත, පිංහේන ජනපදය යන ග්‍රාමසේවා වසම් ය.

මෙම භාෂා සමිති මගින් දෙමළ බස හැදෑරීම සහ ප්‍රදේශයේ වාර්ගික කණ්ඩායම් අතර ජාතික සමගිය උදෙසා අවශ්‍ය සංස්කෘතික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද යොමුවනු ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශය මෙම භාෂා සමිති වැඩ සටහන් සම්බන්ධීකරණය කරයි.





# 18 වන රාජ්‍ය ළමා නාට්‍ය උළෙල සඳහා පිටපත් භාරගැනීම අවසන් වෙයි

සටහන
සඳමාලි සොහොබිරත්න

18 වන රාජ්‍ය ළමා නාට්‍ය උළෙල ලබන සැප්තැම්බර් මස දී ආරම්භ වීමට නියමිත ය. 2014 වසරේ පැවැත්වෙන රාජ්‍ය ළමා නාට්‍ය උළෙලට අදාළ ළමා නාට්‍ය පිටපත් භාර ගැනීම පසුගිය අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන් වූ බව සංස්කෘතික දෙපාර්තමේන්තුවෙහි නාට්‍ය අනුමණ්ඩලයෙහි ලේකම් රුවිනි මනම්පේරි මහත්මිය පැවසී ය.

මේ අනුව සිංහල සීමිත අංශයෙන් නාට්‍ය පිටපත් 94ක්, සිංහල විවෘත අංශයෙන් පිටපත් 72ක්, දෙමළ සීමිත අංශයෙන් පිටපත් 20ක්, දෙමළ විවෘත අංශයෙන් පිටපත් 11ක් හා ඉංග්‍රීසි සීමිත අංශයෙන් පිටපත් 18ක්, ඉංග්‍රීසි විවෘත අංශයෙන් පිටපත් 10ක් ද ඉදිරිපත් වී ඇත.

භාරගෙන ඇති ළමා නාට්‍ය පිටපත් මේ වන විට සමීක්ෂණ කටයුතු සඳහා යොදවා ඇත. පසුගිය වසරට වඩා මෙම වසරේ දෙමළ ළමා නාට්‍ය පිටපත් වැඩි ප්‍රමාණයක් ලැබී ඇති බව මනම්පේරි මහත්මිය අප කළ විමසුමේ දී කියා සිටියේ ය. පසුගිය වසරේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ මැදිහත් වීමෙන් උතුරු නැගෙනහිර පළාත්වල නාට්‍ය වැඩමුළු පැවැත්වීමත්, එයින් ලබාගත් දැනුම, අවබෝධය මත දෙමළ නාට්‍ය කරුවන් ළමා නාට්‍ය පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වන්නට ඇතැයි ලේකම්වරිය විශ්වාසය පළ කර සිටියි.

මෙම වසරේ ලෝක ළමා දිනය පදනම් කරගෙන රාජ්‍ය ළමා නාට්‍ය උළෙලේ සම්මාන ප්‍රධානෝත්සවය පැවැත්වීමට කටයුතු යොදා ඇති බවද ඇය වැඩිදුරටත් පවසා සිටියා ය.





# තම භාෂාව අමතක කළ මියන්මාරයේ දෙමළ ජනතාව

නිත්‍යභාරදි

කලකට පෙර බුරුමය ලෙස හඳුන්වනු ලැබූ මියන්මාරයේ ජීවත් වන දෙමළ ජනතාවගෙන් බහුතරයක් අද දෙමළ භාෂාවෙන් ලිවීමට හෝ කියවීමට හෝ කතා කිරීමට හෝ නොහැකි තත්ත්වයේ සිටිති.

වසර 50කට පෙර බුරුම රජය විසින් දෙමළ පාසල් වසා දමන ලද බැවින් මෙම තත්ත්වය උදාවී ඇති බව පැවසේ. දෙමළ සාම්ප්‍රදායික ඇඳුම ලෙස සැලකෙන සාරි හැඳ සිටි දෙමළ ස්ත්‍රීන් දිගු හිසකෙස් සමගින් මල්වලින්ද සැරසී සිටි නමුත් දෙමළ වචනයක් හෝ තේරුම් ගැනීමට නොහැකි තත්ත්වයක ඔවුන් පසුවූ බව එහි තත්ත්වය නිරීක්ෂණය කළ කෙනෙක් ප්‍රකාශ කර ඇත.

බුරුමය විදේශිකයින්ගෙන් නිදහස ලැබීමෙන් අනතුරුව එහි බුරුම භාෂාව අනිවාර්ය කරන ලද බැවින් 1960 ගණන්වල දෙමළ ජනතාවට තම පාසල් වසා දැමීමට සිදු විය. ඉඩම් ප්‍රතිසංස්කරණය, බුරුම භාෂාව අනිවාර්ය කිරීම සහ බුරුම ජාතිකයින්ට ප්‍රමුඛත්වය දීම වැනි කරුණු දෙමළ ජනතාව විවිධ ආකාරයේ පසුබෑමට ලක් කිරීමට පාදක විය.

මියන්මාරයේ ජීවත් වන දෙමළ ජනතාවගේ මුතුන් මිත්තන් 19වැනි සියවසේ දකුණු ඉන්දියාවේ සිට මියන්මාරයට ගිය අය වෙති. නමුත් ඔවුහු ශ්‍රීලංකාවට සහ දකුණු අප්‍රිකාවට සංක්‍රමණය වූ ජනතාව මෙන් කෘෂිකර්මාන්ත කටයුතුවල නොයෙදී වෙළඳාම් කටයුතුවල නිරත වූහ. සමහරු කෘෂිකර්මාන්ත කටයුතුවල ද නිරත වූහ.

මියන්මාරය ජපන් ජාතිකයින් ආක්‍රමණය කිරීමෙන් අනතුරුව එහි ජීවත්වූ දහස් ගණන් දෙමළ ජනතාව ඉන්දියාවට පෙරළා පැමිණියහ. එම රට නිදහස ලැබීමෙන් අනතුරුව රජය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණය සිදු කරනු ලැබූ අතර දේශීයකරණය යන මුවාවෙන් කෘෂිකාර්මික ඉඩම් සහ වෙළඳ ආයතන සිය පාලනයට නතු කර ගන්නා ලදි.

එහි ජීවත් වන දෙමළ ජනතාව බැලූ බැල්මට දෙමළ සංස්කෘතිය පිළිපදින්නන් ලෙස දක්නට ලැබුණද ඔවුහු දෙමළ භාෂාව කතා කිරීමේදී දැඩි අපහසුතාවයට ලක් වෙති. තරුණ පරපුර බුරුම ආහාර ප්‍රිය කරති. සිය නිවෙස්වල බුරුම භාෂාව කතා කරති. සාම්ප්‍රදායික බුරුම ඇඳුම්වලට ඇළුම් කරති. ඔවුන් දෙමළ භාෂාව නොදන්නා අතර ඉතිහාසය හා සාම්ප්‍රදායද නොදන්නාහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් විවිධ ආගම්වලට මැරුවීමටද කැමැත්තක් දක්වති. ඉන්දීය සම්භවයක් ඇති දෙමළ අයගෙන් ඉතා සුළු පිරිසක් වන මුස්ලිම්වරු සහ කතෝලිකයින් සිටියද ඉන් බහුතරයක් හින්දු ආගමට අයත් පිරිස වෙති. මියන්මාරයේ දහසකටත් අධික හින්දු දේවස්ථාන දැකිය හැකි ය. මෙහි බෞද්ධ හා හින්දු ආගම් අතර සමීප සබඳකම් පවතී. හින්දු දේවස්ථානවල බුද්ධ ප්‍රතිමාව හෝ බුද්ධ රූප දක්නට හැකිය. බුදුරජාණන් වහන්සේ විෂ්ණු දෙවියන්ගේ ආත්මයක් යැයි මෙහි ජීවත් වන හින්දු භක්තිකයෝ විශ්වාස කරති. හින්දු භක්තිකයින් සහ බෞද්ධයන් අතර භේදයක් නොපවතින බැවින් ආගමික ගැටුම් ඇතිවීමේ අවස්ථා විරල ය.

නමුත් මියන්මාර හමුදා පාලකයින් දෙමළ භාෂාව ඉගැන්වීමේ කටයුතුවලට බාධා සිදු කරන බැවින් දෙමළ භාෂාව ඉගැන්වීමේ කටයුතු සිදු කළ හැක්කේ දේවස්ථානවල පමණක් වන අතර එයද දේවස්ථානවල උගන්වනු ලබන්නේ දහම් පාසල් අධ්‍යාපනය, සංගීතය හා නාට්‍ය කලාව වැනි දේ ප්‍රචලිත කිරීමේ අරමුණින්ය.

නමුත් මියන්මාරයේ ජීවත් වන දෙමළ සමාජය වසර ගණනාවක සිට වෙනස් කොට සලකනු ලැබ ඇත. ඔවුන්ට සිංගප්පූරුවේ හෝ මලයාසියාවේ ජීවත් වන දෙමළ සමාජ සමග ඇත්තේ ඉතා අඩු සබඳකම්ය. මෙහි ජීවත් වන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ තරුණයින්ගෙන් බහුතරයක් එක් වතාවක් හෝ ඉන්දියාවට ගොස් නැති බැවින් තමන්ගේ මව්බිම පිළිබඳව ඔවුනට කිසිම දැනීමක් නැත.

මියන්මාරයේ ඇතැම් ගම්මාන හැර අනෙකුත් ප්‍රදේශවල දෙමළ ජනතාව ජීවත් වන්නේ ඉතා සුළු වශයෙන් ය. ඇතැම් ප්‍රදේශවල සිසුන් ඇතුළත් කර ගැනීම පවා දුෂ්කර කාර්යයක් වී තිබේ. මේ හේතුවෙන් සමහර තැන්වල ඉගැන්වීම් කටයුතුවල නිරත වන ගුරුවරුන්ගේ ගෙවීම් සිදු කිරීමේදී ද දුෂ්කරතා පවතී. ගුරුවරුන්ගේ වැටුප් ගෙවනු ලබන්නේ එහි ජීවත් වන දෙමළ වෙළඳුන්ගෙන් ලැබෙන ආධාර මුදල්වලින් ය.

තමන්ට රැකියා අවස්ථා ලබා නොදෙන දෙමළ භාෂාව ඉගෙන ගැනීමෙන් ඇති ප්‍රතිඵලය කුමක් දැයි මෙහි සිටින දෙමළ අයගෙන් සමහරු ප්‍රශ්න කරති.

නමුත් දහම් පාසල් අධ්‍යාපනයට පරිබාහිරව මියන්මාරයේ අලුතින් බොහෝ දෙමළ පාසල් ආරම්භ කර ඇති බවත් විෂය නිර්දේශ සකස් කර එය නොමිලේ ලබා දෙන බවත් මියන්මාරයේ තිබෙන දෙමළ පාසල් නිරීක්ෂණය කරමින් සිටින පී. ෂන්මුග නාදන් නමැති ගුරුවරයා පැවසීය. තවද දෙමළ භාෂාව තමන්ගේ ස්වකීය ඉතිහාසය සහ අනන්‍යතාව තහවුරු කරන බවත් අපිට අපගේ භාෂාව අහිමිවූ විට අපව දෙමළ ජනතාව ලෙස හැඳින්වීමට නොහැකි වනු ඇති බවත් ඔහු තවදුරටත් පැවසීය.

වර්තමානයේ මේ රටේ ඉදිරියට ගෙන යනු ලබන උත්සාහයන් සාර්ථක වන්නේ නම් මියන්මාරයේ ජීවත් වන දෙමළ සමාජයට තමන්ගේ සංස්කෘතිය හා භාෂාව වසර ගණනාවකට ආරක්ෂා කර ගත හැකි වෙතැයි දෙමළ භාෂාව උගන්වන ගුරුවරු පවසති.



# මායිම් නොහඳුනන
## නයනහාරීගේ තෙවැනි ඇස





නයනහාරී අබේනායක






ඡායාරූපයකට සිංහල, දෙමළ, මුස්ලිම් භේදයක් නැත. ජාති, ආගම්, භාෂා හා කුල බෙදීම් ආදියද නැත. එහි රැඳෙන්නේ මනුෂත්වයේ සොඳුරුතම මතකයන්, ආවේගයන් හා සිද්ධීන් ය. නයනහාරී අබේනායකගේ ඡායාරූප එකතුවේ අපට ලැබෙන පණිවිඩය එයයි.

ලයනල් වෙන්ට්හිදී පැවති ඡායාරූප ප්‍රදර්ශනය අතර තුර ඇගේ ගමන් මග දෙස ඇය ආපසු හැරී බැලුවේ මෙසේ ය.

“ඡායාරූප ශිල්පය හැදෑරීමට මගේ අක්කා හෑගොඩ සේයා ශිල්ප නිකේතනයට ඇතුළත් වූ විට ඇගේ තනියට ගියේ මමයි. එහිදී ඡායාරූප ශිල්පය පිළිබඳ මට ලොකු ආශාවක් ඇති වුණා. ඒත් මට කැමරාවක් තිබුණේ නෑ. ෂටර්, ඇපචර් වගේ වචන මම අහලවත් තිබුණේ නෑ.’ එසේ ගමන් ඇරඹූ මගෙහි දැන් ඇය බොහෝ දුර ගොස් ඇත. විශේෂයෙන් ම නයනහාරීගේ ඡායාරූප වලින් බහුතරයක්ම යාපනයේ දෙමළ ජනතාවගේ සැබෑ ජීවන සුවඳ මනුෂ්‍යත්වය සමග මුසු ව අප වෙත හමා එයි.

ඒ පිළිබඳ තම අත්දැකීම් ඇය අප සමග විස්තර කළේ මෙසේ ය;

මම කලාවට වෘත්තීය වශයෙන් සම්බන්ධ වෙලා දැනට අවුරුදු හතරක් පමණ වෙනවා. මම යාපනයේ ගිය අවස්ථාවක මට මතකයි, දෙමළ ගෙදරක හිටපු අම්මා කෙනකුයි, පුංචි දරුවෙකුයි. ඔවුන්ගේ මුළු ලෝකයම ඔවුන් රැඳී සිටි ඒ පුංචි ගෙදර තිබුණු පුංචි ඉඩකඩට සීමා වුණා. ඒත් ඔවුන් අපට කෑම කන්ට ආරාධනා කළා. බත් කන්න ඒ අය අපට බැදල දුන්නේ පපඩමක්. ඒ තමා ඇයට අප වෙනුවෙන් දිය හැකි උපරිම සත්කාරය වී තිබුණේ.’ එය ඇගේ සිත සසල කළ අත්දැකීමක් විය. මෙසේ ගොනු වූ උතුරේ ජන ජීවිතය පිළිබඳ ඇගේ අවබෝධය ඇගේ මෙම ඡායාරූප එකතුවෙන් ප්‍රකාශයට පත් වී ඇත.

එමෙන්ම යන්තම් හෝ තමන්ගේ ජීවිතය ගැටගසා ගැනීම ගැන නිතර සිතමින් වෙහෙසන, රැකියාවක් නැතිව ජීවිතය ජීවත් කරවීමට වෙර දරන බෝට්ටුවලින් රට පැනීමට උත්සාහ කරන, දෙමළ ජනතාවගේ ආකල්පවල ස්වභාවයන් මෙයින් දැකගත හැකි ය.

යුද්ධයෙන් මියදුන තම මව, පියා, සහෝදරයා, සහෝදරිය නැවත නොඑන බව නොදන්නා, කුඩා දරුවන්ගේ හෙට දින බලාපොරොත්තු, යුද්ධයෙන් පසු තමන්ගේ ජීවිත කෙලෙස හෝ හදාගැනීමට වෙර දරන මිනිසුන්ගේ පුවත්, විවිධ පැතිකඩ හා කෝණ මගින් තම දර්ශන පථයට හසුකරගැනීමට නයනහාරා සමත්ව සිටී.

“නෙතුමලට තුති පිඩක්” නමැති ඇගේ මෙම ඡායාරූප එකතුව පිළිබඳව

40 වැනි පිටුවට...

**සුදර්ශනී කුමාරි දමුණුපොල**

# ඕස්ට්‍රේලියාවේ ඇබෝරිජින් ජනතාවගේ භාෂාව සහ **සිංහල භාෂාව**





මෙම ලිපියෙහි කතුවරයා වන කේ.ජී සිංහසිරිවීර මහතා වෘත්තියෙන් වරලත් විදුලි ඉංජිනේරුවෙකි. ඔහු ලන්ඩන් හි විදුලි ඉංජිනේරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකාවේ ඉංජිනේරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.එමෙන් ම ඔහු ලන්ඩනයේ ඉංජිනේරුවන්ගේ ආයතනයන්හි කවුන්සිලයෙහි වරලත් ඉංජිනේරුවෙකි.

තම වෘත්තීයට අමතරව ඔහු විදේශ භාෂාවන් පිළිබඳව ද හැකියාවක් වර්ධනය කරගෙන ඇත්තේ මුලින්ම පාසැලෙහි දී ලතින් භාෂාව ඉගෙනීමෙනි. ඉන් පසු ප්‍රංශයට යෑම සඳහා ඔහු ප්‍රංශ භාෂාවද ඉගෙනගෙන ඇත. තව ද ඔහු ඉංග්‍රීසි භාෂාවට අමතරව ජර්මන් සහ හින්දි භාෂාවන් ද ප්‍රගුණකොට ඇත. ඇබෝරිජින් භාෂාවන් පිළිබඳව වූ ඔහුගේ උනන්දුව ඇති වී ඇත්තේ මෑතක දී ඔහු ඕස්ට්‍රේලියාවේ නිවාඩුවක් ගත කිරීම සඳහා කළ සංචාරයේ දී ඇබෝරිජින් ස්ථාන නාමයන් දැකීමෙනි.

කේ. ජී.
සිංහසිරිවීර

මගේ පසුගිය ඕස්ට්‍රේලියානු සංචාරයේ දී මෙල්බෝන් නගරයේ ඇතැම් ස්ථාන නාම දැකීමෙන් මාගේ කුතුහලය ඇවිස්සිනි. ඉංග්‍රීසි කතාකරන ශ්‍රී ලාංකිකයන් විසින් එම නම් උච්චාරණය කරන විට දී එම වචන මාගේ කනට හුරු බවක් දැණිනි.විමසා බැලූ විට දැනගැනීමට ලැබුනේ ඒවා තවමත් භාවිතාවෙමින් පවතින ඇබෝරිජින්වරුන්ගේ ස්ථාන නාමයන් බවයි. එවැනි ඇතැම් නම් පහත දැක්වේ.

| | |
|---|---|
| Moorabin | Korumburra |
| Moorabool | Koora |
| Bundoora | Koorawatha |
| Kooroora | Pinoora |

මෙම වචන ඉංග්‍රීසි අක්ෂරයන් භාවිතා කරමින් අක්ෂර පරිවර්තනය (transliterate) කර ඇති බැවින් ඇබෝරිජින්වරුන් විසින් උච්ඡාරණය කරන විට දී ඒවායේ සැබෑ උච්චාරණය කුමක් වන්නට ඇත්දැයි උපකල්පනය කිරීම කළ නොහැක්කකි.

"Oora" යන මාත්‍රාව බහුල ලෙස ඇබෝරිජින් භාෂාවේ දී යෙදී ඇති බව මාගේ අවධානයට යොමු විණි. සිංහල භාෂාවේ ද "Oora" යන මාත්‍රාව සහිත වචන පවතී. බොහෝවිට ඒවා පවතින්නේ "Ura" යන විකල්ප ආකාරයෙන් වන අතර එය පහත වචන මගින් පැහැදිලි වේ.

| | |
|---|---|
| Uragala | Urubokka |
| Urapola | Urugaha |
| Urawatte | Urugasmanhandiya |

මෙම භාෂා දෙකෙහිම මෙම මාත්‍රාව දැක්නට ලැබීම සඳහා යම් විශේෂ හේතුවක් පවතින්නේ ද යන්න වැදගත් වන සේ පෙනේ.මෙම නිරීක්ෂණයන් මගින් මා හට හැඟීගිය කරුණ වූයේ ඇබෝරිජින් හා සිංහල භාෂාවල වචනයන්හි යම් සමානත්වයක් ඇතිබව පෙනී යන බවයි. එබැවින් මාගේ මෙම පූර්ව නිගමනය සඳහා වන යම් සාධාරණීකරණයක් පවතී ද යන්න සොයාබැලීමට මා තීරණය කළෙමි.

මේ සඳහා අවශ්‍ය වූ විස්තරයන් වයිට්ං ස්ට්‍රීට් හි A W Reed විසින් ලියා ඇති පොතකින් සහ MEL WAY නම් වූ මෙල්බෝන් නගරය පිළිබඳව වූ පොතකින් ලබා ගැනීමට මා සමත් වුනෙමි.

මෙම මූලයන් දෙකෙන් දීර්ඝ ඇබෝරිජින් වචන ලැයිස්තුවක් මා හට ලබා ගැනීමට හැකිවිය. මේවා වැඩි වැඩියෙන් කියවත්ම මා ඒවායෙන් වැඩි වැඩියෙන් වසඟ වූයෙමි. එම වචන ලැයිස්තුව මේ ලිපියෙහි සඳහන් කිරීම සදහා දිග වැඩිය. එහෙයින් මේ අධ්‍යයනය සඳහා මා තෝරා ගත්තේ සිංහල වචන වලට වඩාත් සමීප වූ වචනයන්ය. මේ භාෂා දෙකේ වචන සංසන්දනය කරන විට හා විශ්ලේෂණය කරන විට අප සිහිතබා ගතයුතු කරුණක් නම් අප ඇබොරිජින් වචන දකින්නේ ඉංග්‍රීසි භාෂාව තුළින් වන බවයි. මේ නිසා අනෙකුත් භාෂාවන් පිළිබඳව යම් දැනුමක් මෙන්ම විශාල පරිකල්පන හැකියාවක් ද අවශ්‍ය වන බව කිවයුත්තේ ඉංග්‍රීසි ජාතිකයකු විසින් මෙම වචන වාර්තාගත කරන විට තමන්ට හුරු පුරුදු ශබ්දයන් මගින් ඔහු මෙහෙයවනු ලබන නිසාය. එබැවින් අක්ෂර වින්‍යාසයෙහි යම් යම් විකෘතිවීම් බලාපොරොත්තු විය යුතුය.'C 'අක්ෂරයට පසු 'E'සහ 'I' අකුරු යෙදෙන විට දී හැර K සහ C අක්ෂරයන්







එකිනෙක වෙනුවට භාවිත කළ හැකිය.''Curawatha'' සහ ''koorawatha'' වචන යුගලයෙහි දී මෙය පැහැදිලිව දැකිය හැකිය. වෙනත් භාෂාවන් හී ද අපට මෙම ලක්‍ෂණය පිරික්සිය හැකිය. උදාහරණයක් වශයෙන් එකිනෙකට සමීපව සම්බන්ධ ජර්මන් ප්‍රංශ සහ ඉංග්‍රිසි භාෂාවන් හි අක්‍ෂර වින්‍යාසයෙන් සහ අර්ථයෙන් සමාන නමුත් උච්චාරණයෙන් වෙනස් වචනයන් පවතී.නමුත් මේ භාෂාවන් එකිනෙකට සම්බන්ධ නොවේ යයි එයින් අදහස් නොවේ.

| **English** | **French** | **English** | **German** |
|---|---|---|---|
| Hospital | Hospital | To sleep | Slafen |
| School | Ecole | Week | Woche |
| Tobacco | Tabac | School | School |

ශ්‍රී ලංකාවේ බොහෝ ස්ථාන නාමයන් ඉංග්‍රීසි අකුරු මගින් ප්‍රාරක්‍ෂණය (transliterate) කළ විට ඒවා අවසන් වන්නේ 'a' අක්‍ෂරය මගිනි. ඇබෝරිජින් භාෂාවෙහි ද තත්ත්වය එසේම ය. මෙමගින් වචන සංසන්දනය පහසුකරණය කෙරේ. එසේම ඇතැම් ඇබෝරිජින් වචන අවසානයන්හි විකෘතියක් දක්නට ඇති අතර ඒවා උච්චාරණයෙහි දී සමාන වේ.

| | |
|---|---|
| Arawatta | |
| Carawatha | Patawilya |
| Baranawatha | Wirrawila |
| Koorawatha | Wangaratta |
| Tarrawatha | Boorthanna |
| Kallatenna | |
| Yackaralthena | |

පළමු වචන පහෙහි අවසන් මාත්‍රාවෙහි අක්‍ෂර වින්‍යාසය වෙනස් වුවද එහි සිංහල අර්ථය (වත්ත) Waththa යන්නට සමාන වේ.එසේම , ''Wiliya'' සහ ''wila'' හි අර්ථය සිංහලෙන් ''wila'' යන්නම වේ.''Ratta'' යන අවසානය සිංහලෙන් ''Rata'' යන්නම වේ. අවසන් වචන තුනෙහි අවසානයන්හි සිංහල අරුත වන්නේ '' Thanne'' යන්නම ය .

ඕනෑම භාෂාවක උච්ඡාරණය සහ අක්‍ෂර වින්‍යාසය ඉගෙනීම සම්බන්ධයෙන් ගත් කළ භාෂාවේ Euphonic අවශ්‍යතාවන් විසින් අවශ්‍ය කරවන phonetical වෙනස්කම් සඳහා ඉඩකඩ සැලසිය යුතුය. පහත සඳහන් වන ඉංග්‍රීසි වචන දෙක මගින් මෙම සංසිද්ධිය පැහැදිලි කෙරේ.

Immigration –In + Migration – In has become Im
Emigration –Ex + Migration -X has been dropped


මෙම විෂයෙහි ගැඹුරට ප්‍රවේශවීම පිණිස ඇතැම් ඇබෝරිජින් වචන තෝරාගෙන ඒවා සිංහල වචන සමඟ සංසන්දනය සඳහා කාණ්ඩ තුනකට වර්ගීකරණය කර ඇත.

1. කාණ්ඩය – සිංහල වචන සමග අක්‍ෂර වින්‍යාසයෙන් සමාන වූ වචන.
2. කාණ්ඩය - සිංහල වචන හා සමාන මෙන්ම සමාන අරුතක් ද ඇති වචන.
3. කාණ්ඩය - උච්ඡාරණයෙන් සහ අර්ථයෙන් සමාන වූ වචන.
(ඇබෝරිජින් වචන වල උච්ඡාරණය සිංහලෙහි මෙන් ප්‍රාරක්‍ෂණය (transliterate) කොට ඇත.)

1 කාණ්ඩය සිංහල වචන සමග අක්‍ෂර වින්‍යාසයෙන් සමාන වචන

| ඇබෝරිජින් වචන | ආසන්නතම සිංහල වචන |
|---|---|
| Arama | Arama |
| Olimda | Olinde |
| Golconda | Galkanda |
| Kantara | Kantara |
| Pagoda | Pagoda |
| Parana | Parana |
| Mandala | Mandala |
| Wangaratta | Wangarata |

**මතු සම්බන්ධයි**






# පැරණි සිංහල සාහිත්‍යයට ආලෝකයක් වූ තිරුක්කුරල්



**සරුසාර කෙත්වත් දනයත් උගත් උතුමන් මෙසියල්ල එක්වන තැනය නිතැතින් රටක වන්නේ**

සටහන
**නීතිඥ එස්.ජී. පුංචිහේවා**

ද්‍රවිඩ සාහිත්‍යයෙහි ගෞරවයට පාත්‍රව විශිෂ්ට ධර්ම ග්‍රන්ථයක් වූ 'තිරුක්කුරල්' කාව්‍යය මීට වසර 54කට පමණ පෙර ඉතා සරල බසින් සිංහලයට පරිවර්තනය වී පළ වී ඇත. එය දෙමළ බසින් සිංහලයට නගා ඇත්තේ ගුරුවරියක වූ ජී. මිසිහාමි මහත්මිය විසිනි. තිරුක්කුරල් යනු අවුරුදු දෙදහසකට වඩා පැරණි ග්‍රන්ථයකි. මිසිහාමි මහත්මියගේ එම ප්‍රයත්නය බෙහෙවින් අගය කළ යුත්තකි. පොතේ දැක්වෙන පරිදි ඇයගේ ලිපිනය පොකුණුවිට, වැලිගම්පිටියේ, 'මීරිලා' වෙයි.

තිරුක්කුරල් දක්ෂිණ භාරතයේ, එනම් අද තමිල්නාඩුවේ 'තිරුවල්ලුවර්' නම් මහ පඬිවරයාගේ කෘතියකි. කතුවරයා ගැන තොරතුරු සොයාගත නොහැකි බව පරිවර්තනයේ සඳහන් වේ. තිරුක්කුරල් කාව්‍යයේ කවි 10 බැගින් වූ අධිකාර 133ක කවි 1330ක් ඇත.

පැරණි සිංහල සාහිත්‍යයේ සුභාෂිතය, ලෝකෝපකාරය වැනි පොත්වලට එය බෙහෙවින් බලපා ඇත.

පොත පළ කිරීමට මහත් සහායක් දී ඇත්තේ යාපනයේ චුලිපුරම්හි සිට, එවක විශ්‍රාම ලබා සිටි දොස්තර ෂෙල්ව තම්බියියා මහතා ය. තමාට පරිවර්තනයට උදවු කර ඇත්තේ වැලිගම්පිටියේ ඩී.ටී. අලුත්ගේ මහතාත්, කුඹුක මහජන සෞඛ්‍ය පරීක්ෂක ඩබ්.ජී. සමරසේකර මහතාත් බව සඳහන් කොට ඇත.

**තිරුක්කුරල් කාව්‍යයේ 'රට' යන මැයෙන් ලියැවුණු පැදිපෙළ (731-740 දක්වා)**

## රට

සරුසාර කෙත්වත් - දනයත් උගත් උතුමන්
මෙසියල්ල එක්වන - තැනය නිතැතින් රටක වන්නේ

අපමණ යස ඉසුරු - ඇමදෙන කැමති වන මෙන්
වනසක් නැති පෙදෙස - රටය අටුකොටු වියෙන් පිරිපුන්

කොතරම් බරක් වුව - උසුලා රජුට අයබදු
පහසුවෙන් ගෙවනට - හැකිය රටකට නියම පරිදි

සතුරුබිය සාගිනි - නොනවතින ලද රෝදුක්
එක් නොවී පවතින - තැනක් රට යනුවෙන් හැඳින්වේ

වියවුල් ඇති කරන - සාමාජික කොටස් නැති
මැරවරයන් නොමැති - රජුන්වන් තැන කියති 'රට'යයි

වන පාඩු නොදැනෙන - පරිදි නිතරම වැඩිවන
ඉසුරුත් සහ උසස් - පැවතුමක් ඇතිවනුයෙ රටකයි

ළිං පොකුණු වැව් දිය - නොසිඳෙන පිරෙන වැසි ඇති
ගලන ගඟ කඳුලේ පිහිටි බලකොටු රටක අභයි

වී සහල් යසිසුරු - සම්පත රෝග නැති බව
රැකවරණ යන පස - රටක අබරණ නමින් හැඳිනේ

වෙහෙසක් නැතිව දන - උපයනු ලැබුණෙ රට නම්
රට නොවෙයි වෙහෙසව - ඉසුරු සම්පත් උපයවන රට

සැනසුම සුව පහසු - නොලැබේ නම් රජුන්ගෙන්
ලැබුණත් පල නොමැත - වෙනත් සැනසුම් නිරායාසෙන්

# භාෂා අයිතීන්
# දැනුවත් නොවී දිනන්න බෑ !

භාෂා සංගම් වැඩ සටහන ක්‍රියාත්මක වීමත් සමග මෙරට පුරවැසියන්ගේ මෙතෙක් යටපත්ව තිබූ බොහෝ ප්‍රශ්න කරලියට පැමිණෙමින් තිබේ.

තම එදිනෙදා ජීවිතයට සම්බන්ධ ප්‍රශ්නවල සිට රාජ්‍ය පරිපාලනයට සම්බන්ධ සංකීර්ණ ප්‍රශ්න දක්වා පුළුල් පරාසයක පැතිරුණු ප්‍රශ්න මේ සමග මතු වේ.

මැයි 29 වනදා මාතලේ - රත්තොට ප්‍රදේශයේ පැවති භාෂා සංගම් ක්‍රියාකාරිකයන්ගේ හමුවකදී මෙවැනි ප්‍රශ්න ගණනාවක් හඳුනා ගැනීමට හැකිවිය. අඹන්ගහකෝරලේ, ගම්මඩුව, කලුගල්තැන්න, කුඹල්ඔළුව, රත්තොට, කුරුවාට

මීට අදාළ උදාහරණ කිහිපයක්ම ඉදිරිපත් විය. ඒ අනුව දයාලන් යන්න තයිලන් යනුවෙන් සඳහන්ව තිබූ අතර තිල්ලෙයිනාදන් යන්න තුල්ලෙයිනාදන් ලෙස සඳහන්ව ඇත. ගුණාලන් විදුසන් යන්න විදුසන් ගුණාලන් ලෙස සඳහන්ව ඇත.

භාෂා සංගම් නියෝජිතයන් ගෙන් ඉදිරිපත් වූ තවත් ගැටලු කිහිපයක් මෙසේය;

**සොන්නයියා කුමාර** - ඔලුවත්ත - කයිකාවල

"අර්ථසාධක අරමුදල ලබා ගැනීම සඳහා අදාළ ලියකියවිලි සම්පූර්ණ කර බාර දුන්නා. සතියකින් එන්න කීවා. එහෙම ගියාට පස්සේ ලියකියවිලි නැතිවෙලා කිව්වා. දැන් අවුරුදු පහක් පමණ ගතවෙලා. කම්කරු දෙපාර්තමේන්තුවෙන් කිසිම ප්‍රතිචාරයක් නෑ. අන්තිමේට වැරදිකරු වී සිටින්නේ මමයි."

**ජය කුමාර්** - ගාලගොලුව වත්ත - වෙන්නාවත්ත, රත්තොට

"මගේ නැගනිය ශ්‍රී පාද විද්‍යාපීඨයට තේරුණා. නමුත් ජී.පී.එෆ්. රිසිට් පත් නොමැති නිසා, ලියාපදිංචි කිරීම අසීරු වුණා. ඊට පස්සේ වත්තෙ ආරච්චි මහත්තයගෙන් ලියුමක් ගෙන යන්න සිදු වුණා. ජී.පී.එෆ්. අරමුදලට දායක නොකරගැනීම නිසා ඇති වන ප්‍රශ්න ගොඩක් තියනවා.

මහජනයා දැනුවත් කිරීම සඳහා ප්‍රචාරක රථය වතු වීදිවල සැරිසැරුවා. එම නිවේදන කටයුතු කළේ සිංහලෙන් පමණයි. ඒ නිසා වතුවල ජීවත්වන දෙමළ ජනතාවට ඒ පිළිබඳ කිසිම



දැනුවත්භාවයක් ඇතිවුණේ නැහැ. **- වේලු විග්නේෂ්වරම්** - බඹරගලවත්ත

"මා උපන්නේ 1977.11.03 දා. මගේ හැඳුනුම්පතේ මූලික තොරතුරු මුද්‍රණය කර තිබෙන්නේ වැරදි සහගතවයි. විග්නේෂ්වරම් වෙනුවට එහි ඇත්තේ විග්නේෂ්පරම් යනුවෙන්. - **එන් සෙල්වි** - කුමාර තැන්න වත්ත

පොලීසියකට පැමිණිල්ලක් කරන්න ගියාම අපට වෙනස්කම් කරන්නෙ සිංහල පොලිස් නිලධාරීන් විතරක් නෙවෙයි, දෙමළ නිලධාරීන්ගෙනුත් වැරදි සිදුවෙනවා. අපේ පැමිණිලි ලියාගන්න දෙමළ නිලධාරීන් ඉන්නෙ එක්කෙනයි. එවුන් අපේ පැමිණිලි ලියාග න්නකොට අපි වත්තේ මිනිස්සු නිසා පැමිණිල්ල වැරදි විදියට ලියනවා. - එස්. ලෝගනාදන්

සාමාන්‍ය පුරවැසියන්ගේ ජීවිතයට සම්බන්ධ මෙවැනි ගැටලු ගණනාවක් සාකච්ඡාවේ දී ඉදිරිපත් විය. ඒ කෙරෙහි අවධානය යොමු කරමින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂක ලයනල් ගුරුගේ මහතා මෙසේ පවසයි.

"භාෂා අයිතිය පිළිබඳ දැනුවත් භාවයකින් තොරව එම අයිතීන් දිනාගත නොහැකි බව අප වටහාගත යුතුයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය භාෂා අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධයෙන් පැමිණිලි විශාල ගණනක් ශ්‍රේෂ්ඨාධිකරණය හා රාජ්‍ය භාෂා කොමිසමට ඉදිරිපත් කර ඇත. ඒවා අතර ඇතැම් පැමිණිලි විභාග කර ඉතා වැදගත් තීන්දු කිහිපයක් ලබා දී තිබේ.

පුද්ගලික බස් රථවල භාෂා තුනෙන් ම නාම පුවරු සකස් කිරීම, මුදල් නෝට්ටුවල විස්තර භාෂා තුනෙන් ම මුද්‍රණය කිරීම හා ජාතික හැඳුනුම්පත භාෂා තුනෙන් ම නිකුත් කිරීම එයින් කිහිපයකි.

භාෂා සංගම් මෙහෙයවන්නන් තම ප්‍රදේශයේ භාෂා අයිතිවාසිකම්වලට අදාළව පැහැදිලි සාක්ෂි සහිතව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට පැමිණිලි ඉදිරිපත් කරන්නේ නම් ඒවා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාව අපට තිබෙනවා. වඩා වැදගත් වන්නේ පුරවැසියන් ලෙස අපි අපේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්ව සිටීමයි."

# භාෂා අයිතිය ගමින් ගමට හැටන්





අඹගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අදාළ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනේ අවස්ථාවක්





සාමදාන ආයතනයේ නිලධාරි නිරෝෂන් ඒකනායක මහතා සභාව අමතමින්





ගම්පොළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අදාළ රාජ්‍ය නිලධාරීන් පුහුණු වැඩසටහනේ අවස්ථාවන්

# භාෂා අයිතිය

## ගමින් ගමට බදුල්ල













බදුල්ල, පස්සර පැවති රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනෙහි අවස්ථාවන් කිහිපයක්



# භාෂාව සහ සංහිඳියාව

**සන්නද්ධ අරගලයෙන් සිදුවිය හැකි ජීවිත අහිමිවීම් සහ දේපල විනාශ පවා මගහරවා ගැනීමේ හැකියාව භාෂා සංහිඳියාව සතුව පවතී**

භාෂාමය කරුණු බහුජන සමාජයේ ඉතා ගැඹුරින් අවධානයට ලක්විය යුතු ය. ජාතියක අනන්‍යතාව ලෙස සලකනු ලබන්නේ භාෂාව ය. භාෂාවට නිසි ගෞරවය ලබා නොදීම ද ජනවාර්ගික ගැටලු ඇතිවීමට හේතුවක් වනු ඇත. මව්භාෂාව මවට සම කළ හැකි ය. සමාජ කොට්ඨාසයක මුදුන් මුල ලෙස භාෂාව සලකනු ලබයි. එම ජන කොට්ඨාසය විසින් භාවිතා කරනු ලබන භාෂාවට ජීවත් විය හැක්කේ අදාල සමාජ කොට්ඨාසය ජීවත් වන විට පමණි. එසේ නොමැති වූ විට එය විනාශ වී යනු ඇත. මෙය දෙමළ භාෂාවටද අදාල වනු ඇත. දෙමළ භාෂාවට පාදක වන දෙමළ ජනතාව ජීවත් වන විට එම භාෂාවද ජීවත් වනු ඇත. එසේ නොමැති වූ විට භාෂාව ඉබේ විනාශ වී යනු ඇත. භාෂාව කතා කළ හැකි අය විසින් එම භාෂාව තවදුරටත් ගෞරවයට ලක් කරනු ලබන බව සත්‍යයකි. නිසි උච්චාරණයන් සහිතව කතා කිරීමද භාෂාවට ලබා දෙනු ලබන ගෞරවයකි. භාෂාවට ගෞරවය ලබා දෙනු ලබන විට එම භාෂාවේ මුදුන් මුල ලෙස පවතින ජන කොට්ඨාසයටද ගෞරවයක් සහ පිළිගැනීමක් හිමි වනු ඇත. මෙම භාෂාව පිළිබඳ නිර්දේශයන් බොහොමයක් සංහිඳියා කොමිසම් වාර්තාවේ සඳහන් කර ඇත්තේ මේ හේතුවෙන් ය.

බහුජන සමාජයක භාෂාව නොදැන ජීවත් වන අවස්ථාවන්වල ගැටලු හා සැක මතු වන අතර භීතිය හා සැකය ඇති වේ. මෙය සමාජ අතර ගැටුම් නිර්මාණය වීමට හේතු වනවා ඇත. සංහිඳියා කොමිසමේ මෙම කරුණ අවධාරණය කර ඇත්තේ ඒ හේතුව නිසා ය.

ඊළඟට භාෂා භාවිතය හා භාෂාවන් ක්‍රියාත්මක කිරීම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී භාෂාවන් නිසි ලෙස භාවිතා කිරීම සඳහා මග පෙන්වීම් තිබිය යුතු ය. වචන උච්චාරණය කිරීම, නිවැරදිව කතා කිරීම, කියවීම, ලිවීම සහ දැනුවත් කිරීම් ආදී බොහෝ කරුණු දැකිය හැකි ය. භාෂාවක් කතා කිරීමෙන් පමණක් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත නොහැකි ය. කතන භාෂාව හා ලිඛිත භාෂාව අතර වෙනසක් පවතින අතර නිවේදන භාෂාව අතරද වෙනසක් පවතී. සෑම දේකටත් වඩා භාෂාව පිළිබඳ හැඟීම අත්‍යවශ්‍ය වේ. සහෝදර භාෂාව ඉගෙන ගැනීමේදී ද මෙම උනන්දුව තිබිය යුතුය. යම් කාර්යයක් ඉටු කිරීමට කරුණු තුනක් හේතු විය හැකි ය. එම කරුණු තුන වන්නේ උනන්දුව, රාජකාරිය හෝ නීතිමය බැඳීම් සහ ලාභ ඉපයීමේ අරමුණ හෝ සාර්ථකත්වය සඳහා වන අවශ්‍යතාව යන කරුණු ය. උනන්දුව හා ලාභ ඉපැයීමේ පරමාර්ථය නොමැති වූ විට භාෂාව ක්‍රියාත්මක කිරීම නිසි ලෙස ඉටු කළ හැකි වෙතැයි අපේක්ෂා කළ හැක්කේ නීතිමය බැඳීමෙන් ය. නමුත් කාලයාගේ ඇවෑමෙන් උනන්දුව සහ ලාභ ඉපයීමේ පරමාර්ථය ඇති කිරීමේ වගකීම පැවරී ඇත්තේ අදාළ බලධාරීන් වෙත ය.

දෙමළ පුරවැසියකු වශයෙන් සිංහල භාෂාව ඉගෙන ගැනීමෙන් මා අත් කර ගෙන ඇති ප්‍රතිඵලය හොඳින් අත් විඳිමින් සිටිමි. එම හැඟීම දෙමළ

ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී
**ජෙයරන්ජන් යෝගරාජ්**



භාෂාව ඉගෙන ගන්නා සිංහල පුරවැසියන්ටත් අත් කර දීමේ වගකීම රජය සතු ය. භාෂා ඉගෙන ගැනීමේදී නිසි අවධානයකින් තොරව ඉගෙන ගැනීමෙන් එය ජාතීන් අතර වන පරතරය තව තවත් තීව්‍ර කරන බැවින් භාෂාමය ප්‍රවේශය වඩා යහපත්ව සහ පැහැදිලිව තිබෙන විට එම භාෂාවට පමණක් නොව එකී භාෂාව කතා කරන සමාජයටද මහත් ගෞරවයක් හිමි වනු ඇත.

මෙම භාෂා ගැටලුවට ආරම්භක අවස්ථාවේදී විසඳුමක් ලබා දී තිබුණේ නම් මේ ආකාරයේ ජාතීන් අතර වූ ගැටුම්වලට ආරම්භයේදීම විසඳුමක් ලබා දීමට හැකිව තිබුණි. එම නිසා භාෂාමය පුහුණු ලබා දීමේදී නිවැරදි සහ සුදුසුකම් ලත් භාෂාමය දැනුම තිබෙන අය මගින් මේ සේවාව දෙනු ලැබිය යුතු ය. භාෂා පරිවර්තන කටයුතුවලට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු අතර එසේ නොකිරීමෙන් ප්‍රශ්නය තව තවත් උග්‍ර වනවා මිස එයට විසඳුමක් නොලැබෙනු ඇත.

ප්‍රශ්නය විසඳීම සඳහා වූ ප්‍රවේශය හා සංහිඳියා කොමිසමේ වාර්තාව මගින් රජය, දෙමළ ජනතාවගේ ප්‍රශ්න විසඳීමට විවිධ උත්සාහයන් දැරූ බව සත්‍යයක් වන නමුත් සමහර අවස්ථාවන්වල මෙම ක්‍රියාවලින් මන්දගාමීව සිදු කෙරෙන බව සමහරු චෝදනා කරති. එලෙස සිදුවීමට හේතුව සමහර දේශීය හා විදේශීය බලවේග බව අප පිළි ගත යුතු ය. සංහිඳියා ක්‍රියාදාමයන් ඉදිරියට ගෙන යෑම පිළිබඳව ජනාධිපතිවරයා සහ රජය තුළ මහත් උනන්දුවක් පවතින බව බොහෝ අවස්ථාවන්හි දී සනාථ කොට තිබේ. දකුණේ ඇතැම් දැඩි මතධාරී සිංහල බලවේග නිසි ලෙස කළමනාකරණය කරමින් රජය යම් ප්‍රගතියක් අත් කර ගෙන තිබීම අගය කිරීමට ලක් විය යුතු ය. මෙය බිම් මට්ටමින් තවදුරටත් ඉදිරියට ගෙන යෑම රජය සතු වගකීමකි. සංහිඳියා කොමිසම විවිධ නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර සංහිඳියා කොමිසමේ නිල වෙබ් අඩවියෙන් උපුටා ගන්නා ලද ඇතැම් කරුණු මෙහි ලේඛන ගත කර ඇත.

## ඔබගේ අවධානය පිණිස

මෙහි භාෂා පිළිබඳ නිර්දේශයන් වැදගත් වනු ඇත. දෙමළ ජනතාවගේ ප්‍රශ්නවලට මූලික වූ එක් හේතුවක් වන්නේ භාෂා ගැටලු ය. මෙය තේරුම් ගෙන කොමිසම විසින් එය වැදගත් කරුණක් ලෙස මෙහි පෙන්වා දී තිබීම අගය කළ යුතු ය. දෙමළ සමාජය වනාහි භාෂාවට මුල්තැන ලබා දෙන සමාජයකි.

නමුත් අවාසනාවකට මෙන් රටේ බොහෝ ප්‍රසිද්ධ ස්ථානවල දෙමළ භාෂා පරිවර්තනවල දෝෂ දක්නට ලැබේ. මෙය මුල සිටම එල්ල කරන ලද චෝදනාවකි. සංහිඳියා කොමිසමේ සුදුසු ඇතැම් නිර්දේශ පමණක් පහත සඳහන් කර ඇත. භාෂාව ක්‍රියාත්මක කිරීම . සංහිඳියා කොමිසමේ තවත් වැදගත් නිර්දේශයක්

9.246

කිසියම් දිස්ත්‍රික්කයක් හෝ පළාතක් භාෂාව පාදක කර ගනිමින් වර්ග කිරීම නොකළ යුතු ය. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරීන් ඉටු කිරීමට අදාල භාෂා කුසලතාවය ලබා තිබිය යුතු ය.

**දෙමළ පුරවැසියකු වශයෙන් සිංහල භාෂාව ඉගෙන ගැනීමෙන් මා අත් කර ගෙන ඇති ප්‍රතිඵලය හොඳින් අත් විඳිමින් සිටිමි. එම හැඟීම දෙමළ භාෂාව ඉගෙන ගන්නා සිංහල පුරවැසියන්ටත් අත් කර දීමේ වගකීම රජය සතු ය.**

News

## සමාජ ඒකාබද්ධතා සතිය ජූලි 14 ඇරඹේ

මෙම වසරේ 2014 සමාජ ඒකාබද්ධතා සතිය ජූලි 14 දා සිට 20 දින දක්වා 'ජාතික සමගිය' යන තේමාව යටතේ පැවැත්වෙන බව ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා පැවසීය.

ජාතික සමගිය යන තේමාව තෝරා ගැනීමේ අරමුණ වූයේ ජනවාර්ගික සහජීවනය ශක්තිමත් කිරීමයි.

2012 දී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් සමාජ ඒකාබද්ධතා සතිය හඳුන්වාදෙනු ලැබූයේ අධ්‍යාපනයට, ආර්ථික කටයුතු වලට, නීතිමය පහසුකම්වලට ආරක්ෂාවට සහ සුරක්ෂිත පරිසරයකට සමාජයේ සැමට ප්‍රවේශය වැනි අරමුණු කොටගත් තේමාවකින් යුතුවය.


මෙම වර්ෂයේ ජාතික ඒකාබද්ධතා සතිය ප්‍රධාන වශයෙන් ම ජාතික සමගිය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමුකරන අතර මෙම පණිවිඩය විවිධ වැඩසටහන් ඔස්සේ පතුරුවා හැරේ.

ආරම්භක උත්සවය පොළොන්නරුවේ ''විජයන්ති ප්‍රාසාද'' නම් වූ පරාක්‍රමබාහු රජුගේ රජමාලිගයෙහි දී පැවැත්වේ.

සැලසුම්කර ඇති වැඩසටහන් අනුව උතුරු හා සබරගමු පළාත් සඳහා වන පළාත් මධ්‍යස්ථාන දෙකක් විවෘත කරනු ලබනු ඇත. උතුරු පළාත් මධ්‍යස්ථානය කිලිනොච්චියේ ද සබරගමුව පළාත් මධ්‍යස්ථානය කුරුවිට ද පිහිටවනු ලබනු ඇත. කිලිනොච්චි සහ මොණරාගල දිස්ත්‍රික්කවල කාන්තා නායිකාවන් බල ගැන්වීම අරමුණුකොටගත් වැඩසටහනක් ද දියත් වේ. සමාජ ඒකාබද්ධතා සතිය පැවැත්වෙන්නේ වසරකට වරක් වුව ද ජාතික සමගිය ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවරයන් වසර පුරාම ක්‍රියාත්මක වන බව ද අමාත්‍යවරයා සඳහන් කළේය.

## සිංහල දෙමළ කෙටිකතා 24ක් පරිවර්තනය කෙරේ

2014 සමාජ ඒකාබද්ධතා සතියට සමගාමීව ශ්‍රී ලාංකීය සිංහල, දෙමළ, ලේඛක, ලේඛිකාවන්ගේ කෙටිකතා සිංහල සහ දෙමළ භාෂාවන්ට පරිවර්තනය කිරීමට ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගෙන ඇත. සිංහල, දෙමළ ලේඛක එකමුතුවේ මැදිහත්වීම ද මේ සඳහා ලැබී තිබෙන බව එහි ලේකම් කමල් පෙරේරා මහතා අප කළ විමසුමක දී කියා සිටියේ ය.



මෙම පරිවර්තනය කාර්යය සඳහා ශ්‍රී ලාංකීය දෙමළ සහ සිංහල ලේඛක ලේඛිකාවන්ගේ කෙටිකතා 24ක් තෝරාගෙන ඇත. ද්විභාෂාවට ම අයත් කෙටිකතා පරිවර්තනය කිරීම සිංහල, දෙමළ ලේඛක එකමුතුවේ දෙපිරිසම අතින් සිදුකෙරෙන බවත් එම සහයෝගිතාවය මගින් සමාජ ඒකාබද්ධතාව ගොඩනැංවීමක් සිදුවෙනු ඇතැයි අපේක්ෂා කරන බව ද ඒ මහතා පැවසී ය.

මෙම පරිවර්තන කාර්යයේ දී කෙටිකතාකරුවන් හඳුන්වා දෙන අතරම පරිවර්තකයා ද හඳුන්වා දීමක් සිදු කිරීම විශේෂත්වයකි. මෙහි ඇති තවත් විශේෂත්වයක් වන්නේ දෙමළ කෙටිකතා තෝරාගැනීමේ දී ප්‍රාදේශීයමය වශයෙන් අවධානය යොමු කිරීමයි. උතුරු නැගෙනහිර පළාත්වල විවිධ දුර බැහැර ප්‍රදේශයන්හි සිටින ලේඛක ලේඛිකාවන්ගේ කෙටිකතා ද මේ සඳහා තෝරා ගැනිණ. එසේම කාන්තා නියෝජනය කෙරෙහි ද, දක්ෂ එහෙත් අවධානයකට ලක් නොවන ඉදිරිපත් කිරීමකට අවස්ථාව අහිමි වූ ලේඛකයන්ගේ කෙටිකතා තෝරාගැනීමට ද මෙහි ඇති විශේෂත්වය බව සිංහල දෙමළ ලේඛක සමුළුවේ ලේකම් කමල් පෙරේරා මහතා වැඩිදුරටත් පැවසී ය.

සටහන
**සඳමාලි සෙනෙවිරත්න**

News

# සිංහල, දෙමළ 10 වැනි රාජ්‍ය සේවක නිර්මාණ ඇගයුම 2014 නිර්මාණ භාරගැනීම අවසන්

රාජ්‍ය හා රාජ්‍යානුබද්ධ ආයතනවල සේවයේ නියැළි රාජ්‍ය සේවකයන්ගේ කලා කුසලතාවයන් ඔප් නැංවීමටත් එම කුසලතාවයන් ඇගයීමට හා එළිදැක්වීමටත් අවස්ථාව හිමිවන වාර්ෂික අන්තර් රාජ්‍ය සේවක නිර්මාණ තරඟාවලියේ නිර්මාණ බාරගැනීම ජූනි 30 වන දිනෙන් අවසන් වන බව අමාත්‍යාංශ ප්‍රවර්ධන නිලධාරී සිසිර කුමාර මහගම මහතා පවසයි.

සිංහල, දමිළ මාධ්‍යයෙන් මෙම තරඟාවලිය පැවැත්වෙන අතර කෙටි කතා, ගීත රචනා, කෙටි නාට්‍ය, පද්‍ය රචනා, ළමා නිර්මාණ, චිත්‍ර නිර්මාණ යන තරඟ ක්ෂේත්‍රයන් මේ සඳහා ඇතුළත් වේ. සියලු නිර්මාණ විනිසුරු මඬුල්ලක් යටතේ විනිශ්චයට ලක් කිරීමට නියමිත බව ප්‍රවර්ධන නිලධාරියකු වන සිසිර කුමාර මහගම මහතා අප කළ විමසුමකදී කියා සිටියේ ය.

මෙම තරඟාවලියේ විශේෂත්වය වන්නේ මෙහිදී ජයග්‍රහණය හිමිවන සිංහල, දෙමළ කෙටිකතා, කවි, ගීත රචනා, හොඳම ළමා කතා, කවි යන නිර්මාණ ඇතුළත් 'ප්‍රභාෂ්වර නමින්' කෘතියක් සිංහල බසින් ද 'ප්‍රභාෂ්වරම්' නමින් දමිළ කෘතියක් ලෙස මුද්‍රණය වීමයි. සිංහල අංශයෙන් පළමු, දෙවන, තෙවන, සිව්වන, පස්වන යන ස්ථාන ලබාගත් අයගේ නිර්මාණ එක බැගින් මෙම කෘතිය සඳහා තෝරා ගැනේ.




දෙමළ කෘතිය සඳහා නිර්මාණ 8 බැගින් තෝරා ගැනේ.

චිත්‍ර නිර්මාණ තරඟාවලියෙන් පළමු ස්ථානය හිමිකරගන්නා චිත්‍රය 'ප්‍රභාෂ්වර' සහ 'ප්‍රභාෂ්වරම්' යන නිර්මාණ කෘතියෙහි පිටකවරය සඳහා යොදා ගැනෙන බවද සිසිර කුමාර මහතා සඳහන් කරන ලදි.

ළමා කතන්දර සහ කවි නිර්මාණ ද ද්විභාෂාවෙන් කෘති වශයෙන් මුද්‍රණය කිරීමට සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

සෑම වසරකදීම සංවිධානය කෙරෙන 'රාජ්‍ය සේවක නිර්මාණ ඇගයුම්' තරඟාවලිය සඳහා උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ජනතාවගේ නොමඳ සහය, උත්සාහය මේ සඳහා ලැබෙන බවත් ඔවුන්ගේ නිර්මාණ රාශියක් ද මේ සඳහා ලැබෙන බවත් සිසිර මහතා තවදුරටත් ප්‍රකාශ කළේ ය.

නිර්මාණ ඉදිරිපත් කළ සෑම කතෘවරයෙකුටම කෘති 4 බැගින් නොමිලයේ පිරිනැමීමද මෙහිදී සිදු කිරීමට නියමිත ය.

# දෙවැනි බසට කුඩම්මාගේ සැලකිලි

සම්බන්ධතා භාෂාව ලෙස භාවිතා වන ඉංග්‍රීසි භාෂාවට හිමි ඇගයීම සහ එම භාෂාව හැදෑරීමට ලැබෙන පහසුකම් දෙමළ හා සිංහල හැදෑරීමේ දී නොලැබෙන බව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යංශයෙහි නිරීක්ෂණයක් ලෙස පළ වී ඇත. විශේෂයෙන් දෙමළ හා සිංහල දෙවන බස ලෙස භාවිතා වන ප්‍රදේශවල මෙම තත්වය පවතින බවට ආමාත්‍යංශය නිරීක්ෂණය කර තිබේ.

මේ පිළිබඳ අදහස් දක්වමින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා මෙසේ කියයි. "දෙමළ හා සිංහල භාෂා ගුරුවරුන් වෙත නව තාක්ෂණික මෙවලම් අදාළ ප්‍රදේශවලට නො අඩුව ලබා දෙමින් ක්‍රමානුකූලව අ.පො.ස. සා.පෙළ විභාගයේ දී දෙවන බස සමත්වීම අනිවාර්ය කිරීම දක්වා ගමන් කළ හැකි නම් එමගින් දැනට පැන නැගී ඇති භාෂා ගැටලු බොහොමයක් විසදාගත හැකි බව අපගේ අදහසයි."

මේ අතර දැනට යෝජිත සාකච්ඡා අනුව ඉංග්‍රීසි දැනුම පිළිබඳ ශ්‍රවන හා කථන කුසලතා ඇගැයීම් සිදුකර 2015 සිට අ.පො.ස. සා.පෙළ විභාගයේ දී ලකුණු ලබා දීමට සූදානම් වීම අඩු පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල දරුං දැරියන් කෙරෙහි අසාධාරණ ලෙස බලපාන බවට ද අදහස් පළ වී තිබේ.

සටහන
සඳමාලි සෙනෙවිරත්න

**භාෂා අයිතිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම සඳහා පලකෙරෙන පත්‍රිකාවකි.**

**(අංක 6)**

## දැන් පවතින නීතිය කුමක් ද?

- කිසිම නීතියක් නිසි ලෙස භාවිත නොවීම දිගටම සිදුවූ දෙය යි.
- ඒ නිසා විවිධ අරගල වර්ධනය වූයෙන් විසඳුම් සෙවීම අවශ්‍ය විය.
- එහෙයින් 13 වන සංශෝධනයේ පළාත් සභා ඇති කිරීම සමග දෙමළ භාෂාවද රාජ්‍ය භාෂාවක් බවට පිළි ගැනිණ.
- සිංහල සහ දෙමළ භාෂා ජාතික භාෂා (19 ව්‍ය) ශ්‍රී ලංකාව පුරා පරිපාලන භාෂා (22 ව්‍ය), වන්නේ ය සියලු නීති පැනවීම ද එම භාෂා දෙකෙන්ම විය යුතුය.

ඉහත සඳහන් පරිදි අතීතයේත් වර්තමානයේත් කොතරම් නීති තිබුණත් ක්‍රියාත්මක නොවී ය.

ඒ නිසා රජයට සිදුවූයේ 1620/27 සහ 2009.09.25 චක්‍ර ලේඛය මගින්, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සහ සෙසු නිලධරයන් වෙත පැවරීමට ය.

1681/03 සහ 2010.11.25 දින ගැසට් නිවේදනය මගින් ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පිහිටුවා ඇත.

ඒ අනුව 1991/18 පනත මගින් පිහිටුවා තිබුණු රාජ්‍ය භාෂා කොමිසමට, ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ (vi පරි) භාෂා අයිතිවාසිකම ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම පැවරිණ.

එසේ වග බලා ගන්නා බවට වග බලා ගැනීම මහජනයාට පැවරේ.

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA)**
24/2, 28 වැනි පටුමග,
මල් පාර, කොළඹ 07.
+94 (11) 2565304/5/6
www.cpalanka.org, info@cpalanka.org

## ශ්‍රී ලංකාවේ ලේඛකයින්ගේ ජාතික සංවිධානයේ ප්‍රථම මහා සමුළුව කොළඹදී

සිංහල, දෙමළ හා මුස්ලිම් ලේඛක - ලේඛිකාවන්ගේ පුළුල් ජාතික සංවිධානය ලෙස ගොඩනගන ශ්‍රී ලංකාවේ ලේඛකයන්ගේ ජාතික සංවිධානයේ ප්‍රථම මහා සමුළුව ජූලි මස අග භාගයේ දී කොළඹදී පැවැත්වීමට කටයුතු සූදානම් කෙරෙමින් තිබේ. මෙම තීරණය ගෙන ඇත්තේ 2014 මාර්තු 20 වනදා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ දී පැවති මෙම සංවිධානයේ දිස්ත්‍රික් නියෝජිත හමුවේදී ය.

එම සංවිධානයට අනුයුක්ත කොළඹ දිස්ත්‍රික් ලේඛක සංවිධානය ප්‍රතිසංවිධානය කිරීමේ ලේඛක හමුවක් ද 2014 ජූනි මස 23 වනදා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික් රැසක මේ වන විට ජාතික ලේඛක සංවිධානයට අනුබද්ධ ලේඛක සංවිධාන පිහිටුවා ඇති අතර උතුරු නැගෙනහිර දිස්ත්‍රික් කිහිපයක දිස්ත්‍රික් ලේඛක සංවිධාන පිහිටුවීම ඉදිරි කාලය තුළ සිදු කිරීමට නියමිතව ඇත.

ග්‍රන්ථ ප්‍රකාශනය පිළිගත් කර්මාන්තයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග රැසක් මේ වනවිට ශ්‍රී ලංකාවේ ලේඛකයන්ගේ ජාතික සංවිධානය විසින් රජයට ඉදිරිපත් කරනු ලැබ ඇත.

## මායිම් නොහඳුනන.... 29 වැනි පිටුවෙන්

ඇය පවසන්නේ මෙය කලාවට වඩා ජීවිතාවබෝධයේ එක් අදියරක් බවයි.

ලේඛන කලාවේදී සීමාවන්ට ලක්වන විවිධ ජවනිකා දෘෂ්‍යමාන ඡායාරූප මගින් මනාව අතික්‍රමණය කිරීමට හැකිවන්නේ එක් ප්‍රධාන හේතුවක් නිසා ය. එනම් කැමරාව ජාති භේද හා ආගම් භේද නොදැනීමයි.

දීර්ඝ කාලයක් ලංකාවේ පැවති යුද ගැටුම්වලට ප්‍රධාන හේතුවක් වූයේ භාෂා හා සංස්කෘතික ගැටලු ය. එහෙත් මනුෂ්‍යත්වයේ සොඳුරු සිහිනය තුළ සිංහල, දෙමළ භේදයක් නැත. කිසිදු බෙදීම් වලින් තොරව බලන විට අපි මිනිසුන් ය. බඩගින්න, තනිකම (හුදකලාව) වෙන්වීම, මරණය ජීවන බර සතුට ආදී ජිවන සිතුවමේ විවිධ අදියරයන් වෙතින් දැක්වෙන හැඟීම්, ආකල්ප සිංහල, දෙමළ භේදයකින් තොර ය. දකුණේ සිංහල තරුණියක් ලෙස උතුරේ දෙමළ ජනතාවගේ ජීවන සිතුවම් දෘෂ්‍ය රූප මාධ්‍යයට හසුකරගැනීම සම්බන්ධව ඇය අපට පැවසුවේ වෙනත් අදහසකි.

"මම ජීවත්වන්නේ ලංකාවේ. මම ඉපදුනේ කොහෙද කියන එක නෙමේ වැදගත් වන්නේ.... සිංහල දෙමළ අපි හැමෝම මෙහි ජීවත් වෙනවා. අපි හැමෝම මනුෂ්‍යයෝ බව මගේ ඡායාරූප කලාවෙන් මම දෙන පණිවිඩයයි."

**නයනහාරිට සම්මානයක්**

කොළඹ කිරුළපන වෙසක් කලාපයේ කූඩු සාදා විකුණමින් සිටි අය අතරට ගිය නයනහාරි ඔවුනගේ ඡායාරූප ගන්න පටන් ගත්තා. එහිදී එතන සිටි (වෙසක් කූඩුවක්) අතේ තබාගෙන සිටි, ඡායාරූපයට භාජනය වු පොඩි එකෙක් ඇසුවේ,

'අක්කේ ඔයා පත්තරෙන්ද?' කියා ය.

'නෑ මම පත්තරෙන් නෙමෙයි.'


එහෙනන් පින්තූර ගන්නේ ඇයිදැයි පොඩි එකා ඇසූ ප්‍රශ්නයට නයනහාර දෙන්නේ මෙවන් පිළිතුරකි.

'මම පින්තූර ගන්න ඉගෙන ගන්නවා, ඉගෙන ගන්නයි පින්තූර ගන්නේ'

පිළිතුර එලෙස නිමා වී ඇය පින්තූර ගැනීම ෙ නවත්වා ටික දුරක් ගිය විට,

'අක්කේ, අක්කේ'යැයි පොඩි එකකුගේ ගැසීමෙන් ඇය නැවත හැරී බැලුවා ය.

'අක්කේ පොඩ්ඩක් ඉන්න, පොඩි බඩුවක් දෙන්න තියනවා' කියා හැඟීම්බරව, සහෝදරත්වයේ නාමයෙන් ඇය අත තැබුවේ මේ සුබපැතුමයි.





සිංහල , හින්දු අලුත් අවුරුදු උත්සවය නිම වී දින කිහිපයකට පසු, අප්‍රේල් මස 28 වන දා උදෑසන සිට දොරගල පීකොක් දෙමළ විද්‍යාලයීය ක්‍රීඩා භූමිය ප්‍රදේශයේ සිංහල , දෙමළ ජනයාගෙන් පිරී යන්නට පටන් ගෙන තිබිණ. ගම්පොළ ප්‍රදේශයේ සිට පැමිණි සිංහල හා දෙමළ ජනයාද ඒ අතර වූහ.

සියල්ලෝ තම තමන්ගේ ආහාර සම්ප්‍රදායන්ට අයත් විවිධ කැවිලි පෙවිලි ද ගෙනවිත් සිටියහ.

සිංහල හින්දු අලුත් අවුරුදු උත්සවය හා බැඳුණු විවිධ සම්ප්‍රදායන් අතර නෑගම් යාම ද එක් ප්‍රධාන සම්ප්‍රදායක් වෙයි. දොරගල පීකොක් දෙමළ විද්‍යාලයීය ක්‍රීඩා පිටියේ මෙදින සංවිධානය කර තිබුණේද එම නෑගම් යාමේ සම්ප්‍රදාය අනුව ප්‍රතිනිර්මාණය කළ උත්සවයකි.

උත්සවය සංවිධානය කර තිබුණේ උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුග්‍රහයෙන් දොරගල ග්‍රාම සංවර්ධන සමිතියයි. ඒ සඳහා මග පෙන්වීම ලබා දී තිබුණේ ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයයි. උත්සවය ආරම්භ වූවේ ගම්පොළ ප්‍රාදේශීය සභා කාර්යාලයෙනි.

ප්‍රදේශයේ සිංහල හා දෙමළ ජනයාගේ සාමූහික සහභාගීත්වයෙන් පැවති මෙම වැඩසටහන මූලික වශයෙන් අන්තර් සංස්කෘතික හා අත්දැකීම් හුවමාරු වැඩසටහනක් ලෙස දවස පුරා ක්‍රියාත්මක විය.

විවිධ සංස්කෘතික වැඩ සටහන් හා සිංහල දෙමළ චාරිත්‍ර මඟින් මෙම ''නෑගම් යාමේ'' උළෙල විචිත්‍රවත්ව තිබිණි.

දහසකට අධික පිරිසක් උත්සවයට සහභාගී වී සිටි අතර සිංහල හා හින්දු ආහාර සංස්කෘතීන්ට අයත් විවිධ ආහාරපාන වලින් ඒ සියල්ලෝ සංග්‍රහ ලැබූහ. දොරගල ග්‍රාම සංවර්ධන සමිතිය හැරුණ විට සමාදාන සංවිධානය ඇතුළු සංවිධාන හා ප්‍රදේශවාසීන් රැසකගේ දායකත්වය උත්සවය සාර්ථක කර ගනීම සඳහා ලැබී තිබිණ.

උත්සව භූමිය අලංකාර කරමින් ප්‍රදර්ශනය කෙරුණු නොයෙකුත් ධජ පතාක අතර ප්‍රදර්ශනය වූ බැනරයක සඳහන්ව තිබූ පහත දැක්වෙන කවිය ''නෑගම් යාමේ'' අරමුණ මේ යැයි පැහැදිළි කළේය.

මනුසත් වගේ උරුමය එක ලෙස ලැබිලා
දෑ කුල සිරිත් අප වෙනතක සිර කරලා
ඒ සැම බේද නැති මිතුදම් පතු රුවලා
එක්සත් කමින් නෑගම් යමු තුටුවීලා

සටහන
**සඳමාලි සෙනෙවිරත්න**

# නෑගම් යාම



"නෑගම් යාමේ" තවත් පින්තූර සඳහා පසු පිට බලන්න.





# නෑගම් යාම













“චික්සත්කමින් නෑගම් යමු තුටුවීලා....”

Printed by: Globe Printing Works, No.5 Stork Place, Colombo 10. Tel: 0777315971